ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත


**03** හින්දු - කතෝලික සබඳතා ඔප් නංවන දීපාවලී



**08** උසස් අධ්‍යාපනයේ ඉහළම තැන ලබන "ඇක්වයිනාස්"



**12** බයිබල් දැනුම මිනුම ජාතික තරගාවලිය




# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

www.colombocatholicpress.com


**මරණය...**
මනුලොවින්
සඟ උපත ලැබීමකි
සදාකාල ජීවනයේ
දොරකඩට පිවිසීමකි
අනන්ත ජීවිතයේ
නිත්‍ය සුව විඳීමකි

**සුබ මරණයක් සඳහා ඔබ සූදානම් ද?**



ක්‍රි.ව. 2013 ක් වූ නොවැම්බර් 03 ඉරිදා 148 වෙළුම 23 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/51/NEWS/2013

## 23 වැනි පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුවේ කතෝලික රාජ්‍ය නායක නායිකාවන් පිළිගන්නට

# කොළඹ දෙව්මැඳුරු සීරුවෙන්

## ● බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දෙව්මැඳුරට රථ ගාලක අවශ්‍යතාවයක්!

## ● අගනුවර දෙව්මැඳුරු අලංකරණයට නගර සභාවේ සහයත් ඕනෑ!



23 වන පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුවේ සභාපතිධුරය හොබවන ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා

**23 වැනි පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන අතර පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් 53 අතරින් අති බහුතරයක් කිතුනුවන් වෙසෙන රටවල්ය. පොදු රාජ්‍ය මණ්ඩලීය සමස්ත ජනගහනයෙන් 80% පමණ වූ මේ කිතුනුවන් නියෝජනය කරමින් සිරිලකට පැමිණෙන රාජ්‍ය නායකයන් සිරිලක ප්‍රකට ආගන්තුක සත්කාරයේ උණුහුම විඳගනු ඇති බව විශ්වාස කැරේ.**

1976 පැවති නොබැඳි ජාතීන්ගේ සම්මේලනයෙන් පසු ජාත්‍යන්තර වශයෙන් මහ පරිමාණයේ සමුළුවක් පැවැත්වෙන්නේ මේ වසරේදී ය. මේ සමුළුවාරයේ සභාපතිත්වය ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට හිමි වන අතර තව දෙවසරකින් මීළඟ පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව පැවැත්වෙන තුරු එහි සභාපතිත්වය ඒ මහතා දැරීමට නියමිතය. මේ අතර සමුළුව නිමිත්තෙන් අගනුවර අලංකරණ කටයුතු සිදුවෙමින් පවතින අතර අගනුවර ප්‍රකට පුදබිමක් වන බොරැල්ල සියලු සාන්තුවර දෙව්මැඳුර සඳහා ඉඩකඩ ඇති රථ ගාලක් නොමැතිකම ගැන ද අසන්නට ලැබේ.

### ගුරු සේවයේ වටිනාකම මැනෙන්නේ කාල සීමාවෙන් නොව සිසු සිසුවියන්ගේ නොමැකෙන ඇගයීම මතයි



පුරා වසර 55 ක් තිස්සේ බොරැල්ල සා. ඇලෝසියස් කනිටු දෙව්සත්හලේ ඇදුරු මඬුල්ලේ සේවය කරමින් කාදිනල් හිමිපාණන් ප්‍රමුඛව අගරදගුරු, රදගුරු හිමිපාණන්ද, පූජක පුතුන් හා සමාජයේ විවිධ තලයන් හි උගත් පරපුරක් බිහි කළ ප්‍රැන්සිස් ගුරු පියාණන් කතෝලික ගුරු දිනයේ දී උපහාර ලැබූ අයුරු. **(සවිස්තර තොරතුරු ලබන සතියේ)**

### මෙරට අධ්‍යාපන ප්‍රවර්ධනයේ මඟ විමසන්නට ජනාධිපති කොමිසමක් ඕනෑ



ඉකුත් දා කොළඹ ඇක්වයිනස් විශ්ව විද්‍යාල විද්‍යායතනයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී අදියුරු අතිගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමා උක්ත විමසීම සිය වාර්ෂික වාර්තාවෙන් අවධාරණයට ලක් කළේය.
**(විශේෂ ලිපිය මැද පිටුවේ)**

## දේව සේවක කාදිනල් කුරේ අනුස්මරණ දිව්‍ය යාගය සැමරේ




**25 වන අනුස්මරණ සැමරුමට සමගාමීව මීගමුවේ කෙළින් වීදියෙන් ආරම්භ වන පරණ හලාවත පාරේ, පෙරියමුල්ල රේල් ගේට්ටුව දක්වා කොටස, "තෝමස් කාදිනල් කුරේ හිමි මාවත" ලෙස නම් කිරීම කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් සිදුවුනි.**

ඉකුත් 29 දා තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථානයේදී පැවති දේව සේවක තෝමස් කාදිනල් කුරේ 25 වන අනුස්මරණ දිව්‍ය යාගය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත්, සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු, මැක්ස්වල් සිල්වා හිමිපාණන් සමඟ දේව සේවක තෝමස් කුරේ හිමිපාණන් භාග්‍යවරයට එසැවීමේ කමිටුවේ මුල් භාරකරු අතිගරු ලියෝ පෝල් රත්නසේකර නි.ම.නි. පියතුමා, කලාපීය නාහිමිපාණන් ඇතුළු ගිහි පැවිදි පූජක සහභාගිත්වයකින් පැවැත්විණි.

## ජාතික කතෝලික ලේඛක හවුලේ සාහිත්‍ය දින සම්මානලාභියෝ



"රිවිර" ක්‍රිස්ටි මහේෂ් ද සිල්වා සම්මානය ලබා ගනිමින්...



"ප්‍රදීප"යේ ආර්. ජෝශප් ප්‍රිය,"සිරස" ප්‍රියන්ත විජේසිංහ, "දිවයින" නෝමන් පලිහවඩන හා "දිනමිණ" පුෂ්පා රොවෙල් සම්මාන අතැතිව

ජාතික කතෝලික ලේඛක හවුලේ සාහිත්‍ය දින උලෙළේ දී 2013 ලිව්සුරු සම්මානය "දිවයින" පුවත්පතේ නෝමන් පලිහවඩන, කිවිසුරු සම්මානය ආර්. ජෝශප් ප්‍රිය, කලාසුරු සම්මානය "සිරස" මාධ්‍ය ජාලයේ ප්‍රියන්ත විජේසිංහ මහත්වරුන්ට පිරිනැමීය. වසරේ කිතුනු පුවත්පත් කලාවේදී සම්මානය "රිවිර" පුවත්පතේ ක්‍රිස්ටි මහේෂ් ද සිල්වා මහතාට පිරිනැමූ අතර ඥානාර්ථ ප්‍රදීපය හොඳම පාඨක චින්තනය ගෙලිඔය ජූඩ් ජේ. ප්‍රනාන්දු මහතාට හිමිවිය. "දිනමිණ" පුවත්පතේ පුෂ්පා රොවෙල් මහත්මිය, කැමිලස් පෙරේරා විශේෂ සම්මානයෙන් ද, පස්කල් ජයමාන්න මහතා වසරේ කිතුනු කවියා සම්මානයෙන් ද පිදුම් ලැබීය. විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මේ උලෙළේ තේමා දෙසුම කැලිස්ටස් ජයමාන්න මහතා පැවැත්විය.

### ශ්‍රී ලංකාවේ ඉපැරැණිම සඟරාව "භක්ති ප්‍රබෝධනය" අන්තර්ජාලයට

අන්තර්ජාලය ඔස්සේ "භක්ති ප්‍රබෝධනය" වෙබ් අඩවියට www.bakthiprabodhanaya.org ඔස්සේ දැන් ඔබට පිවිසිය හැකිය.

### බයිබල් දැනුම මිනුම තරගයේ විශේෂ අවස්ථා රූපවාහිනියේ

ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව සහ කොළඹ සා. ජෝශප් විද්‍යාලය සංවිධානය කළ සමස්ත ලංකා බයිබල් දැනුම මිනුම තරගයේ විශේෂ අවස්ථා ඔක්. 03 ඉරිදා (අද) සවස 3.00 ට ජාතික රූපවාහිනියෙන් විකාශය වන බැව් වැඩසටහන් සම්පාදක රංජුල සේනාධීර මහතා පවසයි. (ප්‍රතිඵල සටහන 12 පිටුවේ)

**"ක්‍රිස්තුන් වහන්සේගේ නාමය ඔබ අතරේ ගෞරවයට පැමිණේවා" (2 තෙස. 1-11)**

## පදවියෙන් පදවියට

# වගකීම් හා යුතුකම් නිසිලෙස ඉටුකිරීමෙන් වැඩිහිටියකු විය යුතු - හලාවත රදගුරු හිමි



**අභිවෘද්ධිආලේපය නමැති ප්‍රසාද නිධානය ලබාගැනීමෙන් පසු සියළු දෙනා වැඩිහිටියන් සේ සැලකිය හැකියි. වැඩිහිටියන් වශයෙන් යුතුකම් හා වගකීම් ඉටුකිරීමට පෙළඹිය යුතුය. දෙමව්පියන් නොසලකන අයද වැඩිහිටියන් සේ සැලකිය නොහැකි යැයි හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ කිරිමැටියාන මීසමේ කිරිමැටියාන හා මොරකැලේ දරු දැරියනට අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දිව්‍ය පූජාවේදී ප්‍රකාශ කළහ.**

කිරිමැටියාන මීසම් සේවක ගරු මේරියස් ඒ. ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමා මෙදින උත්කර්ෂවත් ලෙස රදගුරු හිමිපාණන් පිළිගත් අතර කිරිමැටියාන දේවස්ථාන භූමිය අභියස සිට දේවස්ථානය කරා මීසම් සේවක මණ්ඩල හා දහම් ගුරු හා දරු දැරියන් විසින් පෙරහරකින් කැඳවා ගෙන යන ලදි. හලාවත පදවි අනුනායක අතිගරු පැට්රික් විජේසිංහ පියතුමන්ද රදගුරු හිමිපාණන් සමග මේ සඳහා සහභාගි වූ අතර දිව්‍ය පූජාව අවසානයේ පදවි දහම් කතිකාවත පිළිබඳ අදහස් දැක්වීමේ රැස්වීමක්ද මීසමේ සමිති සමාගම් සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් රදගුරු තුමන්ගේ මූලිකත්වයෙන් පවත්වන ලදි.

යූ. අයි. ක්වින්ටස් ප්‍රනාන්දු

## මල්කඩුවාවේ ජයන්ති සූදානමට ධර්ම විවේකයක්!

කුරුණෑගල මීසමේ මල්කඩුවාව පාතිමා අප ස්වාමිදුවගේ දෙව් මැඳුරේ ජුබිලිය මූලික කරගෙන මීසම් සේවක ගරු ජෙරම් පෙරේරා පියතුමාගේ ඇරියුමින් නිමල මරිය නිකායික පියතුමන් විසින් මහා ධර්ම විවේකයක් සිදුකරන ලදි.

සියලුම කොට්ඨාශ නිවාස බැහැදකිමින්, දිව්‍ය යාග පවත්වමින් සැදැහැවත් ජනතාව සූදානම් කළේය.

## මරියාංජලි ගීත නළුව එළි දැක්වේ



ලාංකීය කිතුනු සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රයට නව සම්ප්‍රදායක් එක් කරමින් මරියාංජලී නමින් දෙව්මව් චරිතය පාදක කරගත් ගී නළුවක් නොබෝදා කලමුල්ල මීසමේ කටුකුරුන්ද දහම් පාසලේ ශිෂ්‍ය නායක සංගමය විසින් ඉදිරිපත් කරන ලදි.

අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොතත්ම පියතුමා මුළු ලෝකය මරිය තුමියට කැප කළ දිනයේ කළුතර සිරිකුරුස විදුහල් ශ්‍රවනාගාරයේදී මරියාංජලි වේදිකාගත විය.

එදින ප්‍රධාන ආරාධිතයා ලෙස කතෝලික ජන සන්නිවේදන අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝසප් පියතුමා සහභාගි විය. මේ සඳහා 10 වන ශ්‍රේණියේ හා ඉන් පහල ළමුන් 75 දෙනෙක් රංගනයෙන් ගායනයෙන් දායක වූහ. මීසම් සේවක ගරු ලෝරන්ස් රාමනායක පියතුමාගේ අනුශාසකත්වය යටතේ මෙම නිර්මාණත්වය සඳහා ශිෂ්‍ය නායක සංගමයට පූර්ණ සහය සහ අනුග්‍රහය දහම් ගුරු මඩුල්ල හා දෙමාපිය සංගමය විසින් ලබාදෙන ලදි.

රේණුකා සිල්වා



හල්පෙ මීසමට අයත් හල්පෙ, කටාන කළුවාරිප්පුව සහ පතඟිගොඩැල්ල සභාවල දිව්‍ය හෘද සමිතියේ ඒකාබද්ධ වාර්ෂික වන්දනා ගමන කුඩාගම ලූර්දු දේවමාතා වන්දනා ස්ථානයට ගිය අතර එහිදී දිව්‍ය හෘද සමිති සාමාජිකාවෝ ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

සී. මේරි හැරියට් ප්‍රනාන්දු

## කඳානේ බයිබල් අධ්‍යයන මෙහෙයක්

කඳාන සා. සෙබස්තියන් සිද්ධස්ථාන පරිපාලක ගරු නිහාල් අයිවන් පියතුමාගේ උපදෙස් මත සා. සෙබස්තියන් මාවත 'ගම් පවුර' සංවිධානය විසින් සංවිධානය කරන විශේෂ බයිබල් මෙහෙය සෑම මසක අවසාන අඟහරුවාදා දින මීසම් සහයක ගරු රංජන් ප්‍රියදර්ශන හා ගරු සජිත් අරුණ පියතුමන් විසින් මෙහෙයවනු ලැබේ.

මූලධර්මවාදින් විසින් කතෝලික ජනතාව නොමඟ යවන රූප වන්දනාව ශු. බයිබය හා එහි විකාශනය ඇතුලු විවිධ තේමාවන් ඔස්සේ ජනතාව දැනුම්වත් කිරීමට යයි.

පියල් ජයකොඩි



අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන් අතින් මීරිගම ශුද්ධවූ ජපමාල දේවමාතා දේවස්ථානයේ දරුවන් 59 දෙනකුට අභිවෘද්ධි ආලේපන ප්‍රසාද නිධානය දානය කරන ලදි. ඉන් අනතුරුව රදගුරු හිමිපාණන් සමගත් මීසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් පියතුමා, ගරු පැවිදි සොයුරියන් දරුවන් පුහුණු කළ දහම් ගුරුවරුන් සමග ඡායාරූපයකට පෙනී සිටි අන්දම.

සේයා - **අමල් ඉන්දික,** සටහන - **රේකා දෙනිපිටිය**



දැලතුර මරිය හමුදාව ස්වර්ණ ජයන්ති දේව මෙහෙය මීසම් සේවක ගරු එල්මෝ රාජ් ප්‍රනාන්දු පියතුමාගේ ඇරියුමෙන් අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මනුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් රොකුස් මුනි දේවස්ථානයේදී සිදුකැරිනි. ඉන් අනතුරුව රදගුරු හිමිපාණන් පියතුමන් සමග ඡායාරූපයකට මුහුණදුන් අයුරු.

ශෙහාරා පෙරේරා



කණුවන මීසමේ විශාකාවත්ත සා. මැක්සිමිලියන් කෝල්බේ මුනි දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය බෝපිටිය ලොයෙලා හි විදුහල්පති ගරු තිලකසිරි ප්‍රනාන්දු පැතුනි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙරට එතුමන් නමට කැපකළ එකම දෙව්මැඳුර මෙයවන අතර කණුවන මීසම් සේවක ගරු ලෙස්ටර් නෝනිස් පියතුමාගේ මෙහෙයවීමෙන් මංගල කටයුතු සිදුකැරිණ. මංගල දේව මෙහෙයේ අවස්ථාවක්.

සටහන - **සරෝජිනී පෙරේරා,** සේයා - **ෂර්ලි පෙරේරා**

## මීගමුව මරුද මඩු කම්ටුවට නව සභාපති වරයෙක්

මීගමුව මරුද මඩු මංගල්‍ය සංවිධාන කමිටුවේ සභාපතිව සිටි වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා සගසුව දිනීමෙන් හිස් වූ සභාපති ධූරයට කෙනකු තෝරා පත්කර ගැනීමේ විශේෂ පූර්ණ කමිටු රැස්වීමේදී ප්‍රදීප් පිරිස් මහතා තේරී පත්විය.

මීගමු දිසා අධිකරණයේ වැඩබලන විනිසුරු ශ්‍රීලාල් ප්‍රනාන්දු මහතාගේ යෝජනාවෙන් හා සුනිල් විජේතුංග මහතාගේ ස්ථිරත්වයෙන් ගිහි අනුශාසක ධූරයක් ව්‍යවස්ථා ගත කළ අතර මේ සඳහා ජ්‍යෙෂ්ඨ සමාජිකයකු වන රාමඩා හෝටලයේ අධිපති ජෝ ජයමාන්න මහතා නිතරග යෙන් තේරී පත්විය. ප්‍රධාන ලේකම් ලකි ප්‍රනාන්දු මහතා සහ වෙනත් නිලධාරීන් තවදුරටත් එම ධූරයන් හී නොවෙනස්ව සේවය කළ යුතු බවට තීරණය විය.

මෙල්වින් ද කොස්තා



කොළඹ පටතුන පදනම මගින් මහියංග නය දේවස්ථානය හා උල්හිටිය දේවස්ථානය පාදක කර ගෙන දිළිඳු අය වෙනුවෙන් නොමිලේ ඇස් පරීක්ෂා කර ඇස් කණ්නාඩි ලබාදීමේ කඳවුරක් මීසම් සේවක ගරු ඩිලෙක්ස් ශාන්ත පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ පැවැත්විණි.

ඩී. ශිරෝමි ඕපාත



කටාන දිසා සාන්ත විසෙන්ති පාවුලා සමිතියට අගරදගුරු පදවි මධ්‍යම මණ්ඩලයෙන් ලබාදෙන ලද ශිෂ්‍ය අරමුදල් ඡායාරූපයේ දැක්වෙන ළමුන් අතර පසුගියදා කළුවාරිප්පුව දේවස්ථානයේ පැවැත්වූ විශේෂ රැස්වීමේදී බෙදා දෙන ලදි. එක් දරුවකු රු. 6000/= ක මුදලක් ලබාදුනි.

ඩබ්. ජී. සුනිල් ප්‍රනාන්දු

## සෙත් සරණ නිවාස යෝජනා ක්‍රම මීසම් පාලනය යටතට පැවරේ

සෙත් සරණ කරිටාස් කොළඹ ආයතනය විසින් කොළඹ අගරදගුරු පදවිය තුළ ඉදි කොට මෙතෙක් පරිපාලනය කළ සියලුම නිවාස යෝජනා ක්‍රම 2013 ඔක්තෝබර් 01 වෙනි දා සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ ඒ නිවාස යෝජනා ක්‍රම පිහිටා ඇති මීසම් වෙත බාර දීමට අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් විසින් පියවර ගෙන ඇත.

අතිඋතුම් කාදිනල් හිමිපාණන් ගේ අත්සනින් යුත් ලිපියක් මගින් මෙම පැවරීම කර ඇති අතර, ඒ සම්බන්ධ ලිපි අදාළ මීසම් සේවක පියතුමන් වෙත මේ වන විටත් යවා ඇත.

මෙම නිවාස සංකීර්ණ අදාළ මීසම් වලට බාර දීම තුළින්. වඩාත් කාර්යක්ෂම ක්‍රියාවලියක් සිදුවනවා පමණක් නොව, අදාළ නිවැසියන්ට වඩාත් යහපත් ප්‍රතිලාභ අත්කර ගත හැකි බව කාදිනල් හිමිපාණෝ විශ්වාසය පළ කරති.

තවද, මෙම නිවාස සංකීර්ණවල වෙසෙන ප්‍රජාව සංවර්ධනය කිරීමටත්, ඔවුන්ගේ අධ්‍යාත්මික තත්ත්වය ඉහළ නැංවීමටත් අප විසින් තවත් බොහෝ දේ කළ යුතු යැයි එම ලිපියෙන් අවධාරණය කරන කාදිනල් හිමිපාණෝ, එම ගුණාත්මක භාවය තහවුරු කර පවත්වා ගෙන යාම සඳහා සුදුසු වැඩසටහන් මීසම් මට්ටමින් සකස් කර ක්‍රියාත්මක කරන මෙන් අදාළ මීසම් සේවක පියතුමන්ලා ගෙන් ඉල්ලා සිටිති.

කොළඹ අගරදගුරු පදවිය තුළ පිහිටා ඇති සෙත් සරණ නිවාස යෝජනා ක්‍රම පිළිබඳ විස්තර මෙහි පහත දැක්වේ.

| | නිවාස යෝජනා ක්‍රමයේ නම | පිහිටි ප්‍රදේශ | නිවාස සංඛ්‍යාව | බාර දුන් මීසම |
|---|---|---|---|---|
| 01 | කරිටාස් විලේජ් | රාගම | 140 | හපුගොඩ |
| 02 | VI පාවුළු | කුමරිගොඩවත්ත - දියලගොඩ | 12 | දියලගොඩ |
| 03 | සන්තියාගෝ | මඩම්පැල්ල | 25 | මඩම්පැල්ල |
| 04 | සෙත්සිරිගම | අතුරුගිරිය | 80 | අතුරුගිරිය |
| 05 | තෝමස් කාදිනල් කුරේ | පල්ලන්සේන | 50 | පල්ලන්සේන |
| 06 | | වාද්දුව | 24 | වාද්දුව |
| 07 | දෙල්ගහවත්ත | මොරටුව | 12 | මොරටුව |
| 08 | අගරදගුරු නිකලස් මාකස් ප්‍රනාන්දු ජුසේ පියගම | සපරගමුවත්ත - පයාගල උතු | 33 | පයාගල |
| 09 | රළදිනුගම | පල්ලියවත්ත - පයාගල උතුර | 04 | පයාගල |
| | | ලියන්නවත්ත - පයාගල උතුර | 35 | පයාගල |
| 10 | ක්ෂේවියර් පියගම | ඉලේපනික්කියාවත්ත - පයාගල දකුණ | 19 | පයාගල |
| 11 | මර්සලීන් ජයකොඩි | කදුරුගස්මුල්ල, මුංහේන, මග්ගොන | 17 | මග්ගොන |
| 12 | අගරදගුරු ඔස්වල්ඩ් ගෝමිස් | මුංහේන, මග්ගොන | 32 | මග්ගොන |
| 13 | අගරදගුරු මැල්කම් රංජිත් | මල්වත්ත | 20 | කළුතර |

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2013 නොවැම්බර් 03 ඉරිදා

# "පොදු රාජ්‍ය මංඩල සමුළුව"ට කොළඹ දෙව්මැදුරු වල සූදානම

මේ මස ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ සමුළුවට දැන් මුළු රටම ලහි ලහියේ සූදානම් වන බවක් පෙනේ. අධිවේගී මාර්ග විවෘත වෙමින් මුළු මහත් කොළඹ නගරයම නවීකරණය වෙමින් රටේ ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව ලොවටම හඬ ගා කියන කතාන්දරයක් බඳු මේ සුවිශාල ක්‍රියාන්විතය අරබයා මුළු දේශයම පිළිවෙතින් දැන් පෙළ ගැසෙන්නේ අපේ කම පිළිබඳව ලෝකයට කියා දීමටයි. අපේ සංස්කෘතිය, අපේ හැදියාව, අපේ සම්ප්‍රදාය, අපේ උරුමය පිළිබඳව මෙරටට පැමිණෙන රාජ්‍ය නායකයින්ට හා ඔවුන් සමග පැමිණෙන අති මහත් කාර්ය මණ්ඩල සමාජික සාමාජිකාවන්ට කියා දෙන්නට ජාති, කුල, ආගම් භේදයකින් තොරව රොද බැඳ ගනිද්දී ශ්‍රී ලාංකීය කතෝලිකයින් වන අප හටද වගකීමක් පැවරී ඇති බව සිහිපත් කළ යුතුයි.

පොදු රාජ්‍ය මණ්ඩලය හා බැඳෙන රටවල් සමූහය අතරින් විශේෂ කොට අප්‍රිකා - ශාන්තිකර කලාපයේ බහුතර රටවල් ගණනාවක් කතෝලික වන අතර විශ්වාසය තුළ ඔවුන් හා ඒකාත්මික වන්නට ශ්‍රී ලංකා කතෝලික ප්‍රජාවට අයිතියක් ඇත. රට පිළිබඳ මහත් උද්දාමයෙන් මේ කාල වකවානුවේදී මුළු මහත් ශ්‍රී ලාංකේය ප්‍රජාවද අමන්දානන්දයට පත් වන විට ශ්‍රී ලාංකේය කතෝලික ප්‍රජාව විශ්වාසය තුළ ශක්තිමත් වෙමින් මේ රාජ්‍ය නායකයින් හා ඔවුන් සමග පැමිණෙන අති මහත් කතෝලික බැතිමතුනට විශ්වාසය අත්දකිමින් ලාංකේය පැවැත්මට ආත්මීකව අනුගත වන්නට අවස්ථාවක් ලබාදීමට කැපවිය යුතුයි.

මෙහිදී 1976 පැවති නොබැඳි රාජ්‍ය සමුළුව පැවති කාල වකවානුව සිහිපත් කිරීම වටී. කොළඹ බොරැල්ලේ පිහිටි සියළු සාන්තුවරයන්ගේ දෙව්මැදුර එදා සූදානම් කළේ ඒ පැමිණි කතෝලික රාජ්‍ය නායකයිනට හා ඔවුනගේ කතෝලික කාර්ය මණ්ඩලයට ඉරිදා වත් පිළිවෙත් සමගින් අනෙකුත් ආධ්‍යාත්මික කටයුතු සඳහාමයි. ඒ අනුව යමින් මෙවරත් බොරැල්ලේ පිහිටි සියළු සාන්තුවරයන්ගේ දෙව්මැඳුර මේ කතෝලික රාජ්‍ය නායක නායිකාවන්ද ඔවුන් හා සමග පැමිණෙන කතෝලික කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ද පිළිගන්නට හා අවශ්‍ය වත් පිළිවෙත් අනුව යන්නට කටයුතු සම්පාදනය කළ යුතුයි.

අද අප පුවත් පතේ ප්‍රධාන පුවතින් එළිදක්වන අන්දමටම බොරැල්ලේ පිහිටි සියළු සාන්තුවරයන්ගේ දෙව්මැඳුර මේ සඳහා දැන් සීරුවෙන් බව පෙනී යයි. මෙහිදි අගරදගුරු පදවිය මෙන්ම ශ්‍රී ලංකා රජය හා කොළඹ නගර සභාවද මේ දෙව්මැඳුර පිළිබඳව මහත් අවධානයක් යොමු කළ යුතුයි. තමන්ගේ ආධ්‍යාත්මික අවශ්‍යතාවයන් සඳහා පැමිණෙන අති මහත් බහුතරයක් වූ මේ කතෝලික රාජ්‍ය නායක නායිකාවන්ට දෙව් මැඳුර සූදානම්ව තිබෙන බව පැවසුවත් ඔවුනට නිසි ආරක්‍ෂාවක් සැපයීම රජයේ යුතුකම වේ. මේ වන විටත් මේ සියළු සාන්තුවරයන්ගේ දෙව්මැඳුරට රථ ගාලක් නොමැත. රාජ්‍ය නායකයින් පැමිණෙන විට ඔවුන්ගේ රථ ආරක්‍ෂාකාරීව ගාල් කරන්නට මේ දෙව්මැඳුරට ආරක්ෂිත රථ ගාලක් අත්‍යවශ්‍ය බව සියළු වග කිව යුතු නායක කාරකාදීන් හට අපි සිහිපත් කරන්නෙමු.

එලෙසින්ම දෙව්මැඳුරත් ඒ අවටත් පිළිසකර කිරීමට අවශ්‍ය බවද සිහිපත් කරන්නෙමු. අපේ රට වැනි අති උතුම් බෞද්ධ රටකට පැමිණෙන මේ සියළු කතෝලික රාජ්‍ය නායක නායිකාවන් පිළිගන්නට බෞද්ධ උරුමය විදහා දක්වමින් කතෝලික අපිත් අපේ ආධ්‍යාත්මය තුළ ආගන්තුක සත්කාරයෙන් පෙළ ගැසීම අත්‍යවශ්‍ය බව මෙහිදි සියලු ශ්‍රී ලාංකික කතෝලික ප්‍රජාවට සිහිපත් කරන්නට කැමැත්තෙමු.

කොළඹ නගරයේ අපේ කතෝලික දෙව්මැඳුරු ඒ සඳහා සූදානම් කරමු. ඒ අවට පිරිසිදු කර ගනිමු. අවශ්‍ය තැන රාජ්‍ය අනුග්‍රහය පතා ඔවුන් හමුවට යමු. විශේෂ කොට කතෝලික වත් පිළිවෙත් නොඅඩුව ඉටු කිරීමටත් ඒ සියලු ආධ්‍යාත්මික කතෝලික පිළිවෙත් සඳහා අප රටට පැමිණෙන කතෝලික රාජ්‍ය නායකයින්ට අවශ්‍ය පහසුකම් සැලසීම අපේ යුතුකමක් කොට සලකමු.

අප්‍රිකා ශාන්තිකර කලාපයෙන් ඇතුළුව අනෙකුත් කලාපවලින් පැමිණෙන සියළුම රාජ්‍ය නායකයින්ට අපේ උත්තමාචාරය පිළිගන්වන අතරම කතෝලික රාජ්‍ය නායක නායිකාවන් හා ආධ්‍යාත්මිකව ඒකාත්මික වන්නටත් ශ්‍රී ලංකා කතෝලික ප්‍රජාව සූදානම් බව මෙහිදි සැබෑ සතුටකින් ප්‍රකාශ කරන්නෙමු.

# සහයෝගිතාවය හා මිත්‍රත්වය තුළින් මානව සබඳතා උදෙසා කිතුනු හා හින්දු කැපවීම

## සමයාන්තර සංවාදය පිළිබඳ ශුද්ධාසන කොමිසමේ දීපවාලි පණිවුඩය

**ආදරණීය හින්දු සැදැහැවත් සහෝදරවරුනි,**

1. නොවැම්බර් 3 වනදා සමරණ දීපවාලී උත්සවය වෙනුවෙන් සමයාන්තර සංවාදය පිළිබඳ ශුද්ධාසන කොමිසම සිය ආශිංසන හා සුබ ප්‍රාර්ථනා මෙලෙස මිත්‍රත්වයේ ස්ප්‍රිතුවෙන්ම ඔබට පතන්නෙමු. ජීවනයේ හා ආලෝකයේ උල්පත වන දෙවිඳුන් ඔබේ ජීවිතයන් ආලෝකවත් කර එයින් අත්විඳින සාමය හා සන්තෝෂය ගැඹුරු කරත්වා.

2. ඉහළ තරගකාරීත්වයක් තුළ ආත්මාර්ථකාමි හැඟුම් සහ භෞතිකවාදි ප්‍රවනතා හානිකර අන්දමින් මිනිස් සබඳතා වලට හානිකරමින් නිරන්තරයෙන්ම පවුල් හා සමාජයන් තුළ බෙදීම් ඇතිකර ලීම සමස්තයක්සේ දකින මේ වකවානුව තුළ සහයෝගිතාවය හා මිත්‍රත්වය තුළින් මානව සබඳතා උදෙසා ක්‍රිස්තියානි හා හින්දු සැදැහැවතුනට කෙතරම් කැපකිරීමක් කළ හැකිද යන සුබ දැක්මේ හැඟීම බෙදා ගන්නට අපි කැමැත්තෙමු.

3. මානව පැවැත්ම උදෙසා සබඳතා මූලික වන බව කිව යුතුයි. එනයින් බලා අපගේ මානව අන්තර් සබඳතා තුළින් දේශීය, ජාතික හා ජාත්‍යන්තර සමාජයන්හි සාමය හා ආරක්‍ෂණය මූලික වශයෙන්ම තීරණය වන බව අපි දන්නෙමු. අත්දැකීම් අපට උගන්වා ඇත්තේ, මානව සබඳතා ගැඹුරු වන්නේ කොතැනද එතැනින්ම සැබෑ සහයෝගිතාව, එකමුතු බව, සාමය ගොඩනැංවීම හා සම උපකාරය කරා අපට කඩිනමින් ලඟා විය හැකි බවයි. කැටිකොට පවසන්නේ නම් ගෞරවාන්විත සබඳතාවක් උදෙසා කැපවීමට ඇති හැකියාව සැබෑ මානව වර්ධනයක් හා අවශ්‍යයෙන්ම ඒකාග්‍ර වර්ධනයක් මෙන්ම සාමය ගොඩනැංවීමක් වෙනුවෙන් හොඳ මිණුම් දණ්ඩක් බවට



පත්වේ.

4. එවන් සබඳතාවයක් සහජයෙන්ම අපගේ බෙදාගත් මානව දැක්ම තුළ ගලා යා යුතුයි. ඉඳුරාම ඒ මානව සබඳතා මිනිස් පැවැත්මේ හා වර්ධනයේ කේන්ද්‍රස්ථානය වනවා සේම එය අන් අය සමග සහයෝගිතාවයේ හැඟීම් වර්ධනය කර ගන්නටද ස්වභාවයෙන්ම ශක්තියක් ජනිත කරවයි.

අපේ ජාතිය, ආගම, සංස්කෘතිය හා පුද්ගල ආකල්ප වල වෙනස්කම් නොසලකන්නේ නම් එකම මානව පවුලකට අපි අයත් වන බව අපට නිතැතින්ම දැනෙනු ඇත.

5. නමුත් කනගාටුවට කරුණ වන්නේ මේ සමාජය තුළ මේ භෞතිකවාදි දැක්ම වර්ධනය වීමත් එලෙසින්ම ගැඹුරු ආධ්‍යාත්මික හා ආගමික වටිනාකම් නොසලකා හැරීමේ ප්‍රවනතාවේ ඉහළ යෑමත් නිසා භෞතික පැවැත්මේ පැතිකඩයට ආගමික මුහුණුවරක් දී එතුළින් මානව සබඳතා ඇතිකර ගැනීමේ භයානක උවදුරක් ගොඩනැගෙමින් පැවතීමයි. ඒ උවදුර මිනිස් පුද්ගලයා 'තවත් කෙනෙක්' නොව 'තවත් දෙයක්' බවට පත්කිරීමේ දෘඩ පැතිකඩකින්ද සමන්විතය.

තවදුරටත් මේ පුද්ගල මූලික ප්‍රවනතා සාවද්‍ය සුරක්ෂිතාවන් උත්පාද කරන අතර එය සැබවින්ම අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියා විස්තර කරන 'ඉවත් කිරීමේ සංස්කෘතිය' 'ඉවතලන සංස්කෘතිය' නැතිනම් "ගෝලීය නොසලකා හැරීම" යන්න දෙවාලන හැඟීම් වලටද බොහෝ සෙයින් ලංව තිබේ.

6. එමනිසා 'සබඳතාවේ සංස්කෘතියක්' හා 'සහයෝගිතාවේ සංස්කෘතියක්' උදෙසා සියළු මිනිස් වර්ගයා අවශ්‍යයෙන්ම කැප කිරිම් කළ යුතුයි. එලෙසින්ම සමස්ත මානව පවුලට වාසි දායක වන අයුරින් ඒ සංස්කෘතීන් අන්‍යොන්‍ය ගරුත්වයෙන් මිත්‍රත්වයෙන් සමන්විත සබඳතා සුරැකීමක් සඳහා ඇරියුම් කරන බවද අමතක කළ යුතු නොවේ. එයටම අනුකූල අභිමානයක් ගොඩනැංවීමේ පොදු හඳුනා ගැනීමක් එහිදී අවශ්‍ය වේ. මෙය සැබවින්ම සහයෝගිතාව හා මිත්‍රත්වය සමීපව සම්බන්ධ වී ඇති බව ඒත්තු යන සැබෑ පැහැදිලි වීමකි. අවසන 'සහයෝගිතාවයේ සංස්කෘතිය යනු ගණනය කරන දත්තයන් හෝ එදිරිකරුවන්සේ දැකීම නොව සැබවින්ම සහෝදරයන් හා සහෝදරියන් සේ දැකීමයි.' (අතිඋත්තම ප්‍රැන්සිස් සසුන් පියා, වර්ග න්හා සංසය බැහැදැකීම, රියෝ ද ජැනෙයිරෝ 2013 ජූලි 23 වනදා)


7. අන්තිම කොට, 'පොදු යහපත වෙනුවෙන් කරන සේවාව සැබවින්ම සියළු දෙනාගේම අප්‍රතිහත උත්සහයේ සැබෑ ඵලය' (අති උත්තම ප්‍රැන්සිස් සසුන් පිය, සමාජ ක්‍රියාධරයන් හමුව, රියෝ ද ජැනෙයිරෝ 2013 ජූලි 23) කරා ලං විය හැකි බව තහවුරු කරන්නේ 'සහයෝගිතාවය උදෙසා වන සංස්කෘතියක්' වෙනුවෙන් අපගේ ඇති කැපවීම මුල්කොට බව පවසාලමි. අපගේ ඒ ඒ දහම් ඉගැන්වීම් වලින් පෝෂණය වී සැබෑ සබඳතා ගොඩනැංවීමේ ඇති වැදගත්කම ගැන දැනුම්වත් වෙමින් කිතුනු හා හින්දු සැදැහැවතුන් හැටියට පෞද්ගලිකවත්, සාමුහිකවත් කටයුතු කරමින් මිනිස් හොඳ හිත හා ආගමික වටිනාකම් ආරක්‍ෂා කරමින් මානව පවුලේ සැබෑ මිත්‍රත්වයට හා සහයෝගිතාවයට අපි නිබඳව කැපවෙමු.

*ඔබ සැමට සුබ දීපවාලි මංගල්‍යයක් වේවා !*

**අති උතුම් ජීන් - ලුවි ටෝරාන් කාදිනල් හිමි**
සභාපති.

**ගරු මිගෙල් ඒන්ජල් ආයුසෝ ගිකොස්ට් පියතුමා**
ලේකම්

## කැමිලස්ගේ ——— තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට



බෝලවත්ත දිසාවේ දහම් ගුරුවරුන් සඳහා පෝෂණ වැඩමුළුවක් හලාවත පදවි දහම් අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත පියතුමාගේ මෙහෙයවීමෙන් නයිනමඩම වික්ෂෝප දේවමාතා දෙව්මැඳුරේ දී පසුගියදා පවත්වන ලදි. "දේව ප්‍රසාද නිධාන සක්‍රමේන්තු යනු කිතුනු දිවියේ මග සළකුණුවේ" යන තේමාව යටතේ මෙම පෝෂණ වැඩමුළුව හරවත් කරන ලද්දේ කොළඹ අගරදගුරු පදවි දහම් අධ්‍යක්ෂ ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමන් විසිනි. එම අවස්ථාව කැමරාවට හසුවූ අයුරු.

ටෙක්ලා කල්දේරා



දේව දයාවේ සමිඳුන්ගේ නුවාන බැතියේ නිර්මාතෘවරිය වන ශුද්ධ වූ පවුස්තිනා තුමියගේ මංගල දිව්‍ය යාගය මෙවර කටුකුරුන්ද ශුද්ධ වූ පිලිප්නේරි දෙව් මැඳුරේ දී පවත්වන ලදි. කළමුල්ල මීසම් සේවක ගරු ලෝරන්ස් රාමනායක පියතුමා දේව මෙහෙය පැවැත් වූ අයුරු.

සඳමාලි සිල්වා

# දෙව් සමිඳුන් සිටිනාතුරු කිසිදේකට බියවිය යුතු නැත

## මහනුවර රදගුරු හිමිපාණෝ උඩුගම්පොලදී පවසති

වෛරය, ක්‍රෝධය වෙනුවට සෙනෙහස, ආදරය, සැම කිතුනු ජීවිතයක් තුළම ඇතිකරගත යුතුය. අප ඉල්ලන සැම දේම දෙවියන්වහන්සේගෙන් නොලැබෙන්න පුළුවන. එහෙත් දෙව් සමිඳුන් සිටිනාතුරු අප කිසිදේකට බිය විය යුතු නැතැයි පසගියදා බුරුල්ලපිටිය මීසමට අයත් උඩුගම්පොල ශුද්ධවූ ප්‍රැන්සිස් අසීසි මුනිතුමන්ගේ දේවස්ථානයේ 125 මංගල මහා පූජාව පවත්වමින් මහනුවර රදගුරු බුරුල්ලපිටිය මීසම් පුත් අති උතුම් ජෝශප් වියානි ප්‍රනාන්දු හිමිපාණෝ පැවසූහ.

ජුබිලි මහෝත්සව දේව මෙහෙයට රදගුරු හිමි සමග ගරු කැමිලස් ජැන්ස්, ජෝර්ජ් පෙරේරා, චමින්ද වනිගසේන, ලූසන්, ප්‍රදීප් කුමාර යන ගරු පියවරුද සහභාගි වූහ. බුරුල්ලපිටිය මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද පියතුමාගේ උපදෙස් පරිදි උඩුගම්පොල කිතුනු සංඝය විසින් ජුබිලි මහෝත්සවයේ කටයුතු සංවිධානය කරන ලදි. එම කටයුතු සාර්ථක කරගැනීම සඳහා ගරු සහෝදරතුමන්ලාගේ සහ ගරු පැවිදි සහෝදරියන්ගේ ද නොමසුරු සහයෝගය ලැබුණි.

වෙනීෂියස් ඇන්ටනි

## බදුල්ල පදවියට නව ධර්මෝපදේශ මධ්‍යස්ථානයක්

බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු හිමිපාණන් විසින් අභිනවයෙන් ඉදි වූ පූර්ණ අධ්‍යාපන බයිබල් අපෝස්තලික සේවා සහ ධර්මෝපදේශ ආයතනය ආශිර්වාද කොට විවෘත කරන ලදි. ඒ අවස්ථාවට පදවියේ දහම් ගුරුවර ගුරුවරියන්, පියතුමන්, පැවිදි සොහොයුරින් සහ සැදැහැවතුන් විශාල පිරිසක් රැස්ව සිටියහ.

එහිදී අදහස් දක්වමින් රදගුරු හිමි ප්‍රකාශ කළේ "සමිඳාණෝ ගෘහය නොසාදන සේක් නම් ඉදි කරන්නෝ නිකරුණේ වෙහෙසෙන බවය" ධර්මෝපදේශයට ප්‍රමුඛස්ථානය දෙමින් කලාව, සංස්කෘතියේ දොරගුළු විවෘත කරමින් මනා පෞරුෂයකින් හෙබි පූර්න පුද්ගලයෙකු බිහිකරන තෝතැන්නක් වේවායි ප්‍රාර්ථනා කළේය. පදවියේ නව ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු නීල් ප්‍රසන්න ප්‍රනාන්දු පියතුමා ඉදිරි දැක්ම විස්තර කළ අතර වසර හයක පමණ කාලයක් සේවය කළ ගරු සුනිල් විජේරත්න පියතුමා සියලු දෙනාට ස්තූති කළේය.

## නව නියමුවෝ

මොරටු දිසාවට අයත් දිව්‍ය හෘදය සංගම් රැස්වීමේදී දිසා අධ්‍යක්ෂ රත්මලාන මීසම් සේවක ගරු රොනී වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් නව නිලධාරීන් පත්කරගන්නා ලදි.

දිසා සභාපතිනි රාවතාවත්ත මීසමේ ලුසිල්ඩා පිලමිනා කුරේ මහත්මිය, ලේකම් - කොරළවැල්ල මීසමේ ලිලියන් විනිප්‍රීඩා මැන්දිස්, භාණ්ඩාගාරික - විල්ලෝරාවත්ත මීසමේ දම්පේ මැන්ඩලින් ගොඩැල්ලවත්ත

ඩොරින් පෙරේරා

## පමුණුවිල ගල්ඒදණ්ඩ කනත්ත පවිත්‍ර කෙරේ

පමුණුවිල ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ මීසම් කමිටුව විසින් සංවිධානය කරන ලදුව. ගල්ඒදණ්ඩ 'සේපාල කනත්ත' සුසාන භූමිය සහ පමුණුවිල විලහේන සුසාන භූමිය සුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් පසුගියදා පැවැත්විණි.

සැදැහැවතුන් රාශියක් මේ සද්කාර්ය සඳහා සහභාගී වූ අතර, ගල්ඒදණ්ඩ 'මිතුරු හවුල' විශේෂ දායකත්වයක් ලබාදුනි.

ලූෂන් ෂර්ලි එඩ්වඩ්

## පයාගල, මග්ගොන මීසම් ජනතාව විශ්වාසයේ වසරේ මඩු කඳවුරට යති



පයාගල මීසම් සේවක ගරු සිසිර සමරකෝන් හා මග්ගොන මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන පියතුමන්ගේ මඟපෙන්වීම මත මීසම් සභා සංවිධානයෙන් මීසම් දෙකේ ජනතාව විශේෂ දුම්රිය දෙකකින් මරුද මඩු සිද්ධස්ථාන වන්දනාවේ යෙදුනාහ. මේ වන්දනා ගමනේදී දෙමව්පියන්, තරුණ තරුණියන් සහ ළමුන් වෙනුවෙන් විවිධ සම්මන්ත්‍රණ, සාකච්ඡා, යැදුම් මෙහෙයන්ද, ජපමාලය උච්චාරණය කරමින් ඉටිපහන් පෙරහරක්ද දිව්‍ය පූජාවන්ද ජනතාවගේ අධ්‍යාත්මික පෝෂණය වෙනුවෙන් සංවිධානය කිරිමට ගරු පියතුමන් පියවර ගෙන තිබුනි.

ගමන් පහසුව සඳහා අවශ්‍ය විශේෂ දුම්රිය හා ඒකාබද්ධ ලංගම බස් රථ සේවා විශේෂ පහසුකම් යටතේ ලබාදීමට ප්‍රවාහන අමාත්‍ය කුමාර වෙල්ගම මහතා සෘජුවම මැදිහත් විය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ හා ලංකා ගමනාගමන මණ්ඩලයේ නිළධාරි මහතුන්ගේ පූර්ණ සහාය මේ සඳහා නොඅඩුව ලැබුනි. වව්නියාව හා මන්නාරම ශ්‍රී ලංගම බස් රථ මගින් දුම්රිය ස්ථානයේ සිට මඩු කඳවුර වෙත යාමට හා ඒමට විශේෂ බස් රථ සේවයක් සපයා තිබුණි. පැවති වර්ෂාව මධ්‍යයේ සැපයූ අවම නවාතැන් පහසුකම් වල පැවති විවිධ අපහසුතාවයන් විඳ දරා ගනිමින් ජනතාව සිය අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම විශේෂ සිද්ධියකි.

ජී. නිහාල් ප්‍රනාන්දු



බටගම මීසමේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය බටගම ලූර්දු ගුහාවේදී පැවැත්විණි. දේව මෙහෙය ගරු එමසි ප්‍රියශාන්ත පැ.තු.නි පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කැරිණි. මීසම් සේවක ගරු නිශාන් විලත්ගමුව, සහය ගරු ජූඩ් ක්‍රිස්මන් පියතුමන්ගේ සහ බටගම මීසම්වාසීන්ගේ සහයත් මත අති සාර්ථක වූ මෙම වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයේ තේමාව ජීවනදායක භෝජනය මම යන්නයි.

අජේන් එන්. සේනාරත්න

## පස්සර ශු. ජූඩ් තද්දේවුස් මුනි දෙව්මැඳුර



බදුල්ල පදවියට අයත් පස්සර ශුද්ධ වූ ජූඩ් තද්දේවුස් අපෝස්තුළු තුමන්ගේ දේවස්ථානය පස්සර නගරයේ සිට හමුවන වම් අත පැත්තේ ඇති පළමු මාර්ගයේ පිහිටා ඇත.

මොනරාගල මහා මාර්ගය පෙනෙන තෙක් මානයේ ඌව වෙල්ලස්ස සහ මධ්‍යම පළාතට ඇති ජූඩ් තද්දේවුස් අපෝස්තුළු තුමන් වෙනුවෙන් කැපකර ඇති, එකම දෙව්මැඳුර මෙයයි. පවුල් 280 ක් වැනි බහුතරයක් ඇති මෙම දේවස්ථානය ඉදිකිරීමට මුල් වූයේ දැනට හලාවත සා. ආනා දෙව්මැඳුරේ පරිපාලක ලෙස කටයුතු කරන ගරු පයස් නිහාල් ප්‍රනාන්දු පියතුමාය.

මෙහි අති බහුතරය දමිළ කිතුනුවන් වන අතර මෙයින් පරිපාලනය වන කුඩා දෙව්මැඳුරු ගණන 12 කි. (12කි) දයාවේ සොයුරියන් විසින් මෙම දෙව්මැඳුරේ සියළුම කටයුතු වලට දායකත්වය ලබාදී ඇත්තේ දෙව්මැඳුර ඉදිකිරීමටත් පෙර සිටය. ඉන් පසු ශුද්ධ වූ පවුලේ සොයුරියන් විසින් සහය වන ලදුව වර්තමාන පියතුමා දක්වා මේතාක් සේවය කළ පියතුමන් ගණන 10 කි. වර්තමාන මීසම් සේවක ලෙස ගරු නිහාල් සුජිත් කුරේ පියතුමා කටයුතු කරන අතර නව අරුණෝදයක රැල්ලක් සේ නැඟී එන පස්සර ශුද්ධ වූ ජූඩ් තද්දේවුස් අපෝස්තුළු තුමන්ගේ දෙව් මැඳුර නුදුරු අනාගතයේදී එහි අග්‍ර ඵල නෙලන්නට පස්සර කිතුනු ජනතාවට ලැබේවායි සමිඳු වරම් පතමු.

ජූඩ් ජේ. ප්‍රනාන්දු

## ප්‍රැන්සිස්කන් තරුණ සමාජිකයන් සඳහා තෙදින වැඩමුළුවක්

ගිහි ප්‍රැන්සිස්කන් නිකායේ යුප්‍රා තරුණ හවුලේ සාමාජිකයන් පහළොස් දෙනෙකුට නේවාසික පුහුණු වැඩමුළුවක් මට්ටක්කුලිය ද මැසනොද් නිවසේදි පවත්වන ලදි.

F.S.P.R සංවිධානයේ සභාපතිනි ගරු ප්ලැසිඩා ලිහිණිකඩුව පැවිදි සොයුරිය F.M.M හා දර්ශනී අලස් ලේකම් විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී. මේ වැඩමුළුවේදී ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් විශේෂ අවධානය යොමුවිය. ප්‍රචණ්ඩත්වය නිසා ඇතිවන විනාශය හා ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර වැඩමුළුවට සහභාගී වූ සියළුම සාමාජිකයන් ප්‍රචණ්ඩත්වය පිටුදකිමින් අවිහිංසාවාදී පුද්ගලයන් බවට ප්‍රතිඥා දෙන ලදී.

මේ වැඩ සටහන තලංගම මීසමේ දහම් පාසල් ශිෂ්‍ය නායක නායිකාවන් විසි පස් දෙනෙකුට එම සංවිධානය මගින් පවත්වන ලදි.

ඩී. පීටර් පෙරේරා

## එකමුතු කම තුළින් සාමය කරා තරුණ එකමුතුව නොච්චියාගමදි



දොන් බොස්කෝ සැලේෂියානු පියතුමන්ලා හා සහෝදර තුමන්ලා එක්ව ශ්‍රී ලක් දෙරණේ උතුරු දකුණු ප්‍රදේශ යා කරමින් ද්‍රවිඩ සිංහල තරුණ තරුණියන් 700 කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් නොච්චියාගම දොන් බොස්කෝ කාර්මික පාසල් භූමියේ එක්දින වැඩමුළුවක් පැවැත්විනි.

ඉන් අනතුරුව වැඩසටහනේ අරමුණ වූ "එකමුතු කම තුළින් සාමය" යන මැයෙන් භාෂා දෙකෙන්ම පැයක දේශනයක් පැවැත් වූ අතර සියලුම තරුණ තරුණියන් ක්‍රීඩා පිටියට පැමිණි අතර එහිදී පැවති කණ්ඩායම් ක්‍රීඩා තුළින් සියලුම දෙනා තුළ කණ්ඩායම් හැඟීම් ඉස්මතු වූ අතර එය ඔවුනට කිසිදා නොලද අත්දැකීමක් ද විය.

ජාතිය, කුල මල, භේද නොතකා ඔවුන් එකා මෙන් එකමුතුව දිවා ආහාරය ද අනුභව කරන ලදි.

තමා තුළ වර්ධනය වූ සහෝදර ප්‍රේමය ඔවුන් කිසි සැකයකින් බියකින් තොරව අන් අය හා සමග බෙදා ගනු ලැබුවේ මෙම අත්දැකීම් කිසිදින අමතක නොකරන බව ඔවුහු පැවසූහ.

වියාන් රංජිත්

## දහම් පාසල් දරුවන්ට කොළ කැඳ

හෙට උදාවන ලෝකය වෙනුවෙන් පූර්ණ දරුවකු බිහිකිරීමේ කාර්යය තේරුම් ගත් බොල්ලත මීසම් සේවක ගරු බර්නාඩ් රෙහාට් පියතුමා දහම් දරුවන්ගේ පෝෂණ අභිවෘද්ධිය වෙනුවෙන් දහම් පාසල අවසානයේ කොළ කැඳ වීදුරුවක් දීමට කටයුතු සලසා ඇත.

දැනට බොල්ලත හා පොල්ගහවත්ත දහම් පාසල් 2 ආශ්‍රිතව සිදුකරන මේ ව්‍යාපෘතිය යටතේ දරුවන් 800 කට ආසන්න ප්‍රමාණයකට කොළ කැඳ ලබාදීමට කටයුතු කර ඇත.

අජිත් කමල්ප්‍රිය ජයලත්

## "මරිය වසර" ප්‍රකාශයට තව මාසයයි

# දෙව් මවගේ ජපමාලය

**කිතුනු පවුලේ ප්‍රධානම යාච්ඤාව ජපමාලයයි. ජපමාලය කීමේදී අපි භාවනා කරනු ලබන්නේ දේව වචනයයි. නමෝ මරිය යාච්ඤාව සෑදුවේ ගාබ්‍රියෙල් දේවදූතයා ද, එළිසබෙත් තුමිය ද, ශුද්ධවූ සභාවද එකතුවයි.**

එක් එක් දිනවල අභිරහස් භාවනා කරනවාට ජේසුස් වහන්සේගේ මාංශගතවීම, දුක්ප්‍රාප්තිය, උත්ථානය හා උන්වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන සිද්ධි ආලෝකයේ අභිරහස් මඟින් භාවනා කෙරේ. පවුලේ සැම දෙනා එකමුතු වී දිනපතා ජපමාලය කියන විට අපි ජේසුස් වහන්සේගෙත්, මරියතුමීගෙත් ජීවිත මෙනෙහි කරන්නෙමු. දේව කැමැත්තට හිස නැමූ මරි මවුගේ ජීවිත අප සැමගේ සිත් තුළ වර්ධනය කරගෙන දෙවිඳු වචනයට අවනත වෙමින් දිවි ගෙවීමට වෙහෙසෙමු.

මරිය තුමිය පාතිමා නුවර, ලූර්දු නුවර දර්ශනය වූ විට ඉල්ලා සිටියේ පවුකාරයන් වෙනුවෙන් ජපමාලය කියන ලෙසයි. ජපමාලය කීම තුළින් ජන හද බැඳෙන්නේ කෙසේද? ජපමාලය තුළින් ජේසුස් වහන්සේගේ ජීවිතයට සමීප සම්බන්ධතාවයක් අත්දකින්නට හැකිවේ. දෙවිඳුට සමීප වන විට අනිවාර්යයෙන් සහෝදර ජනතාවට ආදරය, කරුණාව, උදව් උපකාර කිරීමට පෙළඹේ.

දෙවිඳුට සමීප වන විට අනිවාර්යයෙන් සහෝදර ජනතාවට ආදරය, කරුණාව, උදව් උපකාර කිරීමට පෙළඹේ. දකින සහෝදරයාට ප්‍රේම නොකර නොදකින දෙවියන්ට ප්‍රේම කරන්නේ කෙසේ ද? කියා ශුද්ධවූ ජුවාම් තුමා ප්‍රශ්න කරන්නේ ඒ නිසයි. අප යාච්ඤාව තුළින් ලබන ආලෝකයත්, මඟ පෙන්වීමත් සොයුරු පෙමින් එකිනෙකාට ආදරය කිරීමෙන්, තේරුම් ගැනීමෙන්, සමාව දීමෙන් සාධාරණත්වයෙන් ජීවත් වීමට බලය හා සවිය දෙවිඳුන්ගේ අනුහසින් අපට ලැබේ.

සාමයේ රජින වන මරි මව් යදින විට සාමයේ රැස් අප තුළින් විහිදේ අපට හිරිහැර කරන සිත් රිදවන අයට සමාව දීම තුළින් සාමයේ අත්වැල් බැඳ ගන්නට හැකිවේ. ජපමාලය තුළින් අප මෙනෙහි කරන්නේ ජේසුස් වහන්සේගේ මුළු ජීවිතයයි. කුරුස ගසේදි වැරදි කළ අයට සමාව දුන්නේ මෙසේ ය. "පියාණනී, ඔවුන් කරන දේ නොදැන කරන නිසා ඔවුන්ට සමාව දුන මැනව. එලෙසම සතුරන්ට ප්‍රේම කරන්නට ද වම් කම්මුලට ගැසූ විට දකුණු කම්මුලත් හරවන්නැයි කියූ සමිඳාණන්ගේ ජීවමාන වචනය වේ.

සෑම බලවේගයක් තුළම සුවයේ, බලයේ ඖෂධය ජපමාලය බව කිසිසේත් අමතක නොකළ යුතුයි. වනිතා පරපුරේ ලවණක් ආලෝකයක් මුහුන් ලෙස ක්‍රියා කරනට වෙර දැරිය යුතුයි. යැදුම තුළ සවිමත් වෙමින් දේව වචනය ශු. ලියවිල්ල හා සභා දිවි මඟ තුළ අපගේ දූත මෙහෙවර ඉටු කරලීමත් මරිය වහන්සේ හට අප දිවි මඟ මධ්‍යස්ථියකොට පත් කොට මවක ලෙසින් දුබල අපගේ අවැසිතා ඉදිරියේ දෙවිඳු වරම් ලබා දෙන ලෙස යදිමු ජපමාලය.

✍ **විලගෙදර - සකුන්තලා**



## අද වැනි දිනක



*සගසුව දිනුවත් සමරා සුසාන යේ*
*මල් ඉටි පහන් දල්වා එක එක සරි යේ*
*සිහිවටනයක් ළඟ ඉඳගෙන අතීත යේ*
*පිටුවෙන් පිටුව පෙරළා රහසින් බැලි යේ*

*කළ යුතු දෙයක් කළ යුතු තැන මඟ හරි මින්*
*මේ මළවුන්ව රවටා ඇත බොරු කිය මින්*
*ඒ අය එදා ගිය හැටි සෝ දුක දර මින්*
*ඇත අද සුසානේ තණමල්වල රැඳෙ මින්*

*දහමක අරුත හරි හැටි පිළිපදින දිනේ*
*අද වැනි දිනක පිවිතුරු ගුණ සුවඳ දැනේ*
*එය මළ නොමළ සැමටම සුර සෙවණ ගෙනේ*
*මළ පිටු නොමැත මල් පිටු දිවි මඟට පෙනේ*

✍ **පිටිපන - මා. ජයවීර**

# මළවුන් සමරමු



**නොවැම්බර් මාසය කතෝලිකයන් වන අප හට ඉතා වැදගත් මාසයකි. නොවැම්බර් මස 02 දින මළවුන්ගේ දිනය සමරයි. මේ මාසය පුරාවටම අප අතරින් වියෝ වී දෙවිඳුන් කරා ගිය අය සිහි කිරීම අපේ හොඳ සිරිතකි.**

මේ දිනයේදී මිනි පිට්ටනි තුළ සුවඳ විහිදුවයි. උද්‍යානයක සිරි උසුලයි. අපේ හදවත් ද ශෝකයෙන් පිරි සියුම් සතුටක් ඇති කරයි. අපි අද යුතුකම කළා යයි හැඟීමකුයි ඒ.

අප අතරින් වියෝ වූ අය ගැන සිහිකිරීමේදී අපට ඇත්තෙන්ම සතුටු විය හැකිද? ජීවත්ව සිටිනා කාලය තුළ ඔවුන් බොහෝ දුක් පීඩා උසුලයි.

"මහළු වියේ ඔටුන්න නම් දරුවන්ගේ දරුවෝය" යන කියමනෙන් ඈත් වී ඔවුන් මහළු මඩම් තුළ තනිවෙති. ආදරය, කරුණාව, සෙනෙහස බෙහෙවින් අවැසි මේ වියේදී ඔවුන් තනිව ජීවිතය ගෙවා දමයි. දරුවන් සමඟ සිටිය ද නිවෙස තුළ ද ඔවුන් තනිවෙති.

ජීවන බර සමඟ දැනෙන විඩාවත්, අසහනකාරී බවත් නිසා එසේ සිදුවෙනවාය කියා අපට සිත හදාගත නොහැකිය. මන්ද අප අතරින් වියෝ වූ අපේ දෙමාපියන්, වැඩිහිටියන් ඔවුන්ගේ ජීවිත කාලය පුරාවටම අපේ දිවිය ගොඩ නඟන්නට වැයවූ බැවිනි.

මොහොතක් සිතමු. දිවියෙන් සමුගත් පසු කාලයකට පමණක් ඔවුන් සිහිකර අපේ සිත් සනසා ගන්නවාට වඩා ජීවත්ව සිටියදී ඔවුනගේ වියපත් හිතට හා ගතට සුවයක්, අස්වැසිල්ලක් වන්නට අපට හැකිනම් එය මුළු ජීවිතය පුරාවටම අප ලබන භාග්‍යයකි.

✍ කටාන
**නිර්මලී පීරිස් මිහිඳුකුලසූරිය**

## සමරමු මළවුන්

අපෙන් වියෝ වූ සහෘදයන් සමරන දින ළඟ එයි තවත් විටක්
මලින් පලින් සුදු වැල්ලෙන් සැරසුන පුංචි නිවහනක කල එළියක්
ගේ දොරවත් නැත ඉන් නික්මෙන සුවඳින් සිරියාවත් හරිම චමත්
පාරාදීසය එතැන මැවෙනවා සමරමු මළවුන් තවත් දිනක්

ලෙඩ දුක් රෝ බිය රිය සක ලෙස බැඳිලා ඇත ජීවිත කතර මැදින්
නෙක දුක් දොම්නස් කරදර විඳි අය මේ බිම සැතපී සිටින බැවින්
දූ දරු සෙනෙහස නිසි සතුටක් ලැබ දෙවිඳුන් දුටුවා කෙනෙක් තවත්
ලෝ දම් නියතය දෙවිඳුන් කැමතිය සිදුවන්නේ මේ අප කාටත්

දිය බිඳ බත් පිඬ කුසගිනි නිවුමට ලැබුනේ නැහැ සිඟමන් යැද්දත්
හිසට සෙවණ නැත ගස් යට අගු පිල වැරහැලි ඇඳුමින් විලි වැසුනත්
කවුරු කොහේ හෝ දූ දරුවන් ඇත මව්පිය පාරට ඇද වැටුනත්
උසස් පහත්කම අහලකවත් නැත නිවුනු සිතින් සැමදෙන සැතපෙත්

✍ දඹදෙණිය
**මියුරියල් රීටා ප්‍රනාන්දු**

# ශුද්ධ ආත්මයන් සඳහා සහනය

**නොවැම්බර් මාසය මළවුන්ගේ මාසය වශයෙන් බොහෝ දෙනා අතර ව්‍යවහර වන වචනයයි. එහෙත් එය මළවුන්ගේ මාසය නොව පුනරුත්පත්තින්ගේ මාසය ලෙස අදහස් වේ. එය එසේ වන්නේ භෞතික වශයෙන් මෙලොවින් තුරන් වූ අය වෙනත් ස්ථානයක නැවත උත්පත්තිය ලබන හෙයිනි.**

ඒ ස්වර්ගීය ශුද්ධිකාගිනිස්ථානය හෝ නිරය වේ. එම නිසා කිතුනු ඇසින් මරණය ගැන මෙනෙහි කිරීම වටී.

සුසාන භූමියන්හි භූමදාන කර ඇති මෘත දේහයන් අසළ සිහිවටන සහ දැන්වීම් පත්‍රිකාවල සටහන් කර ඇත්තේ උපත හා විපත වශයෙන් වුවද මරණය විපතක් නොවේ. එය නැවත උපතකි. එබැවින් මෙම පුවරු හා දැන්වීම් මනු උපත සහ සග උපත වශයෙන් සඳහන් කිරීම අර්ථාන්විත වේ. කිතුනු අපගේ ජීවිත මරණයෙන් කෙළවර වන්නක් නොවන බැවිනි. "මෙන්න මම ඔබට අභිරහසක් පවසමි. අපි සියල්ලෝම නොමැරෙන්නෙමු." (1 කොරින්ති 15:51). "දිරන සුලු මේ සිරුර නොදිරන සුලු බවට පත්විය යුතුය. මැරෙන සුලු මේ සිරුර අමරණීයත්වයට පත්විය යුතුය." (1 කොරින්ති 15:53). "මා අදහාගන්නා මැරුණත් ජීවත් වන්නේය" (ජුවාම් 11:25).

1241 දී ශු. දොමිනික් තුමා අතින් පැවිදි දිවියට ඇතුළුවීමට ගිය දේශනාවාදියකුගේ එක්තරා කතාවක් මෙසේ ය. නොවැළැක්විය හැකි හේතුන් නිසා තම රැකියාව නතර කළ නීතිඥයෙක් විය. මොහුට ඉතාම දුගී මිතුරෙක් විය. මේ මිතුරා රෝගාතුර විය. එවිට මේ නීතිඥවරයා ඔහුට ඇප උපස්ථාන කළේය. ඔහු රැකබලා ගත්තේය. එහෙත් රෝගය උත්සන්න වී හෙතෙම මරණයට පත් විය.

මසකට පසු මරණයට පත් මිතුරා ඔහුට සිහිනෙන් පෙනී තමා ශුද්ධිකාගිනිස්ථානයේ වද විඳින බවත් ඊට තම මිතුරාගේ සහය උවමනා බවත් කීය.

නීතිඥවරයා "යාලුවා ඔබගේ වද වේදනා ඉවසිය නොහැකි තරම් දරුණු දැ"යි ඇසීය. මිතුරා පිළිතුරු දෙමින් "එසේය, මා මෙහි දැවෙන ගිනි ජාලාව කෝටි වාරයකින් වැඩි"යි කීය. නීතිඥවරයා භය වී ඔහුට කතා කරමින් "මම දෙවියන් ඉදිරියේ කුමන තත්ත්වයක දැ"යි ඇසීය. "නරක තත්ත්වයකැ"යි ඔහුගෙන් පිළිතුරු ලැබිණි. "මා ඊට කළ යුත්තේ කුමක් දැ"යි නීතිඥවරයා ඇසීය. "ඔබ දැන් ලෞකික රැකියාවෙන් අස්වී ඔබේ ආත්මය ගලවා ගැනීම සඳහා කටයුතු කරන්නැ"යි කියා නොපෙනී ගියේය. පසුව නීතිඥවරයා නීති වෘත්තිය අත්හැර දොමිනිකාන නිකායට ඇතුල් වී පැවිදි විය.

☛ 15 පිටුවට

✍ **මෙල්වින් ද කොස්තා**

# මැරි මැරී ජීවත්වන අයත් සිහිකරමු

**නොවැම්බර් මාසය මළවුන්ගේ මාසය ලෙස කතෝලික සභාව නම්කර ඇත.**

නොවැම්බර් 02 දින මළවුන්ගේ මංගල්‍යය පවත්වන්නෙමු. වසර පුරාම කටු පඳුරු වැවිලා, කුරුස සොහොන් බිම වසාගෙන වල් බිහිව තිබූ මිනි පිට්ටනිය හොඳට සුද්ධ පවිත්‍ර වෙලා පොළොවට සමතලාවී තිබුණ මිනි වළවල් පස් පුරවලා සුදු වැලි අතුරලා, කුරුස සොහොන් කොත් තීන්ත ගාලා, මැකී ගිය නම් ගම් දින අලුත් කරලා මිනී වල ළඟ මල් පොකුරු, ඉටිපන්දම් දල්වලා මළවුන්ගෙ මාසයට නම් මිනී පිට්ටනිය හරිම ලස්සනයි. මියගිය අයගේ දරුවන්, ඥාතින් මිනී වල වටකරගෙන මළවුන්ට හරි සැලකිලි මේ මළා වූ අය ජීවත්ව සිටියදී මෙවැනි සැලකිලි ලැබුවාද? දැන් නම් ඔවුන් සිහිවෙන්න සිහිවටන හදලා දාන ධර්ම ආදි නොයෙකුත් පුන්‍ය කටයුතු.

මිනිපිටියේ කිසිම උස් පහත් භේදයක් නැත. අක්කර ගණන් ඉඩම් හිමිව සිටි අයටත් බිම් අඟලක්වත් නැතිව සිටිය අයටත් මේ බිමේ හතර රියනට අයිතිය ඇත. අප, දැහැමියා යයි සිතා සිටි අය ළඟම පව්කාරයෙක් යයි සිතා සිටි අය වැතිර සිටී. මෙහි ජාති, ආගම්, කුල, පොහොසත් දුප්පත් කිසිම භේදයක් නැතිව සැමදෙනා සමාදානයෙන් සැතපී සිටිති.

ජීවත්ව සිටින අප මළාවූ අය සිහිකිරීම, ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම යහපත්ය. එහෙත් නැතිබැරිකමට, කාමාතුරයන්ට ගොදුරු වූ, අනියම් පෙම් සබඳතා, කපටි පෙම්වතුන්ට රැවටී තම නම්බුව රැකගැනීමට අසරණ වූ තරුණියන්, කාන්තාවන් තම කුස තුළදීම මරා දමන කිරි කැටි දරුවන්



වෙනුවෙන් මිනිකඳු නැත. කුරුස සිහිවටන මල් පොකුරු නැත. ඉටිපන්දම් නැත. මේ දරුවන් ද දේව තිළිණයන් බව මොවුන් නොදන්නවාද?

අද ජනවාර්ගික යුද්ධය නැතත් අද අපට අසන්නට ලැබෙන්නේ කණගාටුදායක සිද්ධීන්ය. උතුරේ ඇතැම් ජනතාවට තවමත් හරිහැටි ඉන්න හිටින්නට තැනක් නැතිව අනාථ කඳවුරු වලය. ජාති ආගම කුමක් වුවත් ඇතැම් පවුල්වල බිරිඳට සැමියා නැත. මව්පියන්ට දරුවන් අහිමිවී ඇත. ජීවත්වීමට හරි හැටි ආදායමක් නැත. තම ගම්බිම් අහිමි වූ ඇතැම් උතුරේ ජනතාව මැරි මැරී ජීවත් වෙති.

මේ අපේම සහෝදර සහෝදරියන්ය. සුළු වැටුපකට ඩහදිය හෙලමින් සිතට සැනසීමක්, විවේකයක් නැතිව, කුසට නිසි අහරක් නැතිව තම දරු පවුල් ජීවත් කරවන්න කී දාහක් මැරි මැරී ජීවත් වෙනවාද? තම දරුවාට කිරි ටිකක්, පෝෂ්‍ය ආහාර වේලක් කෙසේ වෙතත් සම්බෝලයි බතුයි හෝ එක වේලක්වත් දෙන්න නොහැකිව මව්වරු කී දෙනෙක් මැරි මැරී ජීවත් වෙනවාද?

විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර කෙසේ වෙතත් රජයේ රෝහලක බේත් නැතිව ලියා දෙන තුණ්ඩුවට බේත් ගන්න මුදල් නැතිව කී දාහක් රෝගීන් මැරි මැරී ජීවත් වෙනවාද?

දහසක් බාධක මැද දුකසේ නිදි මරා පාඩම් කර විභාග සමත් වූවත් රැකියාවක් නැතිව සියල්ල සිහිනයක් බවට පත් වූ තරුණ තරුණියන් කී දාහක් මැරි මැරී ජීවත් වෙනවාද? වයසට යන දූවරුන් විවාහ කර දීමට නොහැකිව හූල්ලන දෙමාපියෝ කොපමණ ද? මෙලෙස දිනපතා මැරි මැරී ජීවත්වන අයවත් මේ මාසය තුළ දී සිහිකරමු. ඔවුන්ටද පිළිසරණය වෙන්න අදිටන් කරගනිමු.

✍ මොරටුව
**ඩොරින් පෙරේරා**

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවන සතිය සිකුරාදා උදා යාම යැදුම

### 51 වැනි ගීය

**පසුගිය සතිය හා සබැඳේ...**

**පවට නැම්ම ඇතිවයි මා මෙලොව උපන්නේ :**
මෙම සාහිත්‍යමය යෙදුම මගින් ගීතිකා කතුවරයා සැදැහැවතකු පූර්ණ ලෙසින් සිය ජීවිත යථාර්ථය වටහා ගැනීමක් පෙන්නුම් කරයි. උපත හා සබැඳි මෙම අවබෝධය පාපයේ යථාර්ථය එක් පැත්තකින්ද දෙවි සමිඳුන් මිනිසා වෙත දක්වන පීතෘක හා මාතෘක ආදරය තව පැත්තකින්ද පෙන්වයි (ගීතා. 22:9-10). මෙම පදය කිසිසේත්ම ජන්ම පාපය පිළිබඳ අර්ථකථනයක් නොවේ. දුබල මිනිසා දෙවි සමිඳුන් දක්වන සමාව පිරි දයාව ශු. ලියවිල්ලෙහි නිතොර සඳහන් වේ. (උත්. 8:21, ජෝබ් 15:14-15, ගීතා 143:2)

**ආසිරි පැන් මට ඉසිනු මැනව :**
හෙබ්‍රෙව් පිටපතට අනුව "හිසොප් මගින් පැන් ඉස මා පවිත්‍ර කළ මැනව" ලෙසින් දැක්වේ. හිසොප් ශාකයේ අතු රිකිලි වලින් පැන් ඉසීම දේව වන්දනා පිළිවෙත් හා සම්බන්ධව ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වේ. (ලෙවී 14:4, ගණන් 19:18, හෙබ්‍රෙව් 9:19)

**සතුට හා සොම්නස :**
සැදැහැවතා තම වේදනාවන්හිදි දෙවි සමිඳාණන් වෙතින් ලබන ආසිරි තුළින් උදාවන සොම්නස අරබයා දෙවි සමිඳාණන්ට තුති පුදයි. (ගීතා 27:6).


**ඔබේ බැල්ම හරවා ගත මැනව**
දෙවිඳුන්ගේ බැල්ම හඟවනුයේ උන්වහන්සේ සිය ජනතාව මත දක්වන දයා කරුණාවේ ආකල්පයයි. (ගීතා 13:1). එහෙත් මේ සංදර්භයේ ඇති වෙනස වන්නේ පාපයේ යථාර්ථය හමුවේ දේව විනිශ්චයෙන් මිදීමේ දැඩි ආශාවයි (ගීතා. 38:1).

**නිර්මල සිතක් මවා වදාළ මැනව :**
මෙහි ක්‍රියා පදය සඳහා යෙදෙන "බාරා" හෙබ්‍රෙව් වදන උත්පත්ති පොතේ දෙවි සමිඳුන්ගේ මැවීමේ ක්‍රියාව අපට සිහිපත් කරවයි. (උත්. 1:1). එය පසුතැවිල්ල තුළින් සැදැහැවතා අත් දකින නව මැවිල්ලක යථාර්ථය ප්‍රබලව දක්වයි.

**තිරසර නව ආධ්‍යාත්මයක් :**
අනාගතයේ යළි පාපයට නොවැටී දෙවිඳුන්ට ප්‍රසන්නව දිවිමඟ යැම සඳහා කෙරෙන ගැඹුරු ප්‍රාර්ථනාවකි. අලුත් ආධ්‍යාත්මයක් තුළින් ප්‍රකාශ වන්නේ සියලු අයහපත් ගුණාංගවලින් හා පුරුදුවලින් බැහැර වී ඇතුළාන්ත දිවියේ නව ජීවයකින් යුතුව පැවතීමට ඇප කැපවීමය. (එසකි. 36:25-27, ජෙරම් 31:33).

**අවනත සිතක් දී :**
මෙය පසුතැවිලි වූ හදකට උරුම වන ඇතුළාන්ත ජීව ගුණය පෙන්වයි. දෙවි සමිඳාණන්ගේ අසීමිත කරුණාව හමුවේ නිසි ආකල්ප ඇතිව උන්වහන්සේට කීකරු වීම මෙහි අදහසය. (ගීතා 143 : 10)

**ඔබ මඟ පහදා දෙන්නෙමි:**
මේ අයුරින් තම අත්දැකීම් පාදක කරගෙන දෙවි සමිඳුන් ගැන අන් අයට උගැන්වීමට යොමුවීම විලාප ගී වල එක් ලක්ෂණයකි (උදා 22:22). එය එක්තරා අන්දමක ධර්මදූතික ආකල්පයක් ඉදිරිපත් කරන්නේය.




ශුද්ධ ලියැවිලි වසර

**(71)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

☛ ලබන සතියට

**ගරු හෙන්රි සිල්වා පියතුමා**

## එළිදරව්වෙහි 01 පරිච්ඡේදය පිළිබඳ විවරණයක්




**පසුගිය සතිය හා සබැඳේ...**

ජේසු ක්‍රිස්තුන් වහන්සේ වළාකුළු පිරිවරා තේජශ්‍රීයෙන් පැමිණීම එනම් "දෙවන පැමිණීම" දානියෙල්ගේ පොතේ 7 වෙනි පරිච්ඡේදයේ 13 හා 14 වෙනි වගන්තීන්හි සඳහන් කෙරෙන මනුෂ්‍ය පුත්‍රයාගේ ආගමනයේ ආභාෂයෙන් ලියැවුණ දෙයකි. දානියෙල් සඳහන් කරන මනුෂ්‍ය පුත්‍රයා වැනි කෙනෙකුගේ පැමිණීම නපුරු බලවේගයන්ගේ විනිශ්චයේ පරිසරයෙන් ඉදිරිපත් කර ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනය සකල ලෝකයාට ප්‍රකාශ වේ. ඔවුන් වහන්සේ මරණයට පත් කළ අයට ඔවුන් වහන්සේගේ ජයග්‍රහණය හා තේජශ්‍රීය ඔවුන්වම මවිත කරන්නකි. ඔවුන්ගේ බලාපොරොත්තු සුනු විසුනු කරන්නකි. එම නිසා තමන් කළ වරද පිළිගත්තා සේ ඒ සම්බන්ධයෙන් ඔවුහු අඬා වැළපෙන්නාක් මෙන් පෙන්නුම් කරැත. දෙවියන් වහන්සේගේ සේවකයා පිළිබඳ ඉසයියා 52:13-53:12 දක්වා ඇති දිවැසි වැකියෙත් විශේෂයෙන්ම සෙකරියා දිවැසිවරයාගේ පොතේ 12:10 සඳහන් වෙන පසුතැවිල්ලෙත් ආභාෂය එළිදරව්ව 1:7 ලබා ඇති බව පෙනී යයි. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීම ප්‍රබල ලෙස විස්තර කර ඇත්තේ ඔවුන් වහන්සේගේ දුක්විඳීම හා මරණය මඟින් අසමසම ජයග්‍රහණයක ආරම්භය ඉස්මතු කර එමඟින් දුක් විඳින සැදැහැවතුන් දිරිගැන්වීමටය.

**8 වන වගන්තිය**

"අල්ෆා සහ ඔමේගා මම වෙමියි, වැඩ සිටින, වැඩ සිටි, මතු වඩින සර්වපරාක්‍රම ස්වාමින් වන දෙවියන් වහන්සේ වදාරණ සේක"

ග්‍රීක භාෂාවේ පිළිවෙලින් මුල් හා අග අකුර වන "අල්ෆා" හා "ඔමේගා" දෙවියන් වහන්සේ සියල්ලෙහි මැවුම්කාරයාණන් බවත් එතුමන් තුළ සෑම දෙයක්ම නිමාවට පත්වන බවත් සංකේතවත් කරයි. මෙවැනි කියමනක් අවශ්‍ය වී ඇත්තේ දැනට උදා වී ඇති පීඩාකාරී තත්ත්වය පවා ඔවුන් වහන්සේගේ සැලැස්ම හා සම්පූර්ණ පාලනය යටතේ ක්‍රියාත්මක වන බව පෙන්නුම් කිරීමටය. යෙසායා. 41:4, 44:6 යන වගන්තීන්හි ආභාෂයෙන් මෙම වගන්තිය ලියැවී ඇතැයි සිතිය හැකිය.

☛ ලබන සතියට

# බෞතිස්මීය කැඳවීම

පසුගිය සතියෙන්...

ස්වාමින් වහන්සේගේ දුක්ප්‍රාප්තිය / මරණය සහ විජයග්‍රාහී උත්ථානයට ප්‍රබල ලෙස සම්බන්ධ වන්නට යොමු වන ආරාධනය කිසිසේත්ම අමතක කළ නොහැකිය. තවද උන්වහන්සේගේ ත්‍රිවිධ කාර්යයන් වන පූජක, දිවැසිවර සහ එඬේරික දිවි පෙවතට සෘජුවද සමීපවද සම්බන්ධ වෙමින් එය දෛනික දිවි පෙවෙත මගින් ජීවත් කරවීමද බෞතිස්මීය කැඳවීම තවදුරටත් විග්‍රහ කළ හැකිය.

කොතෙක් අසීරු වුවද මෙම ත්‍රිවිධ කාර්යයන් සඳහා සාක්ෂි දරන්නට ගනු ලබන අවංක ප්‍රයත්නය නිතැතින්ම දෙවි මහෝත්තමයාණන් අභියස ප්‍රසන්න වනු ඇත. උත්තම පූජකයාණන් ලෙස මනුෂ්‍ය වර්ගයාට දැක් වූ අසහාය ප්‍රේමය කරණකොට ගෙන තම ජීවිතය පූජා කළ සේක.

"එසේම ක්‍රිස්තුන් වහන්සේත් නායක පූජකයකු වීමේ ගෞරවය තමන් වහන්සේම පවරා නොගත් සේක. එහෙත් ඔබ මාගේ පුත්‍රයා ය. අද මම ඔබ ජනිත කළෙමි"යි උන්වහන්සේම ඒ ගෞරවය පැවරූ සේක. එලෙසම වෙන තැනක ඔබ මෙල්කිසදෙක් පූජක පරපුර අනුව සදහටම පූජකයෙක් වන්නෙහි යයි ඒ තැනැත් වහන්සේ වදාරණ සේක" (හෙබ්‍රෙව් 5:5-6). "තවද මෙල්කිසදෙක් පූජක පරපුර අනුව, උත්තම පූජක නාමයද දෙවියන් වහන්සේගෙන් ලත් සේක." (හෙබ්‍රෙව් 5:5-6).

☛ ලබන සතියට

✍ අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ
**ගරු ඉන්ද්‍රා රත්නසිරි පියතුමා**

# පිළිපදින්න



**දිව්‍ය පූජාව සඳහා එක් ශුද්ධවූ අල්තාර ඇතිරිල්ලක්වත් තිබිය යුතුය. එය සැම විටම සුදු වර්ණයෙන් තිබිය යුතුය.**

**(අගරදගුරු පදවි ජන වන්දනා කොමිසම)**

## පූජා සතිය
## නොවැ. 03 - 10 දක්වා

| | |
|---|---|
| 03 ඉරිදා | **සාමාන්‍ය සමයේ තිස්එක් වන ඉරුදින**<br>(කොළ) ප්‍රඥා 11:22 - 12:2<br>ගීතාවලිය 145:1-2, 8-11, 13-14<br>2 තෙසලෝනික 1:11-2:2 ලූක් 19:1-10 |
| 04 සඳුදා | **ශු. චාර්ල්ස් බ්‍රෝමියෝ අනිවාර්ය අනුස්මරණය**<br>(සුදු) රෝම 11:29-36<br>ගීතාවලිය 69:29-30,32-33, 35-36<br>ලූක් 14:12-14 |
| 05 අඟහරුවාදා | (කොළ) රෝම 12:5-16<br>ගීතාවලිය 131:1-3 ලූක් 14:15-24 |
| 06 බදාදා | (කොළ) රෝම 13:8-10<br>ගීතාවලිය 112: 1-2, 4-5, 9 ලූක් 14:25-33 |
| 07 බ්‍රහස්පතින්දා | (කොළ) රෝම 14:7-12<br>ගීතාවලිය 27:1, 4, 13-14 ලූක් 15:1-10 |
| 08 සිකුරාදා | (කොළ/සුදු) රෝම 15:14-21<br>ගීතාවලිය 98:1-4 ලූක් 16:1-8 |
| 09 සෙනසුරාදා | **රෝමයේ ලතරානු බැසිලිකා දෙව්මැඳුර කැපකිරීමේ මංගල උළෙල**<br>(සුදු) එසකියෙල් 47:1-12 හෝ<br>1 කොරින්ති 3:9-17<br>ගීතාවලිය 46:2-3, 5-6, 8-9<br>ජුවාම් 2:13-22 |
| 10 ඉරිදා | **සාමාන්‍ය සමයේ තිස් දෙවන ඉරුදින**<br>(කොළ) 2 මකබී 7:1-2, 9-14<br>ගීතාවලිය 17:1, 5-6, 8, 15<br>2 තෙසලෝනික 2:16 - 3:5<br>ලූක් 20 : 27-38 හෝ<br>20:27, 34-38 |

# පාප වලට මනස්ථාපනය වී සමිඳුන්ගේ ප්‍රේමයට නතුවෙමු




## සාමාන්‍ය සමයේ 31 වන ඉරුදින

**සාමාන්‍ය සමයේ තිස්එක් වන ඉරුදින දේව වචනය මගින් අපට ආරාධනා කරන්නේ ගැලවීම ලැබීමට නම් පුද්ගලයකුගේ සමාජ තත්ත්වය කිසිවිටක බාධාවක් නොවන බවයි. අවශ්‍ය වන්නේ සැබෑ මනස්ථාපනයක් තුළ දෙවිඳුන්ගේ ප්‍රේමයට නතුවීමය.**

පුරාණ ගිවිසුමේ මනස්ථාපනය සඳහා යොදා ඇති හෙබ්‍රෙව් වචනය පදය වන්නේ "පුබ්" යන්නය. එහි අර්ථය නම් ප්‍රතිවිරුද්ධ දිශාවට හැරීමය. (2 රාජාවලිය 17, 13) නව ගිවිසුම තුළ සඳහන් මනස්ථාපනය, පාපය හා ධර්මිෂ්ඨකම පිළිබඳ මෙතෙක් දැරූ ආකල්පය මුළුමනින්ම වෙනස් වීම හේතුකොට ගෙන ජීවිතයේ ඇතිවන පෙරළිය පෙන්නුම් කිරීමට යොදා ගෙන ඇත. මනස්ථාපනය සඳහා යොදා ගෙන ඇති ග්‍රීක වචනය වන්නේ "මෙටනොයියා" ය. එහි අර්ථය වන්නේ කෙනෙකුගේ සිතුවිල්ලේ හා හැසිරීමේ වෙනස්වීමකි.

මෙම වෙනස්වීම කෙනෙකුගේ ජීවිතයට සෘජුවම බලපායි. මේ අනුව මනස්ථාපනය තුළින් සිදුවන්නේ පාප වලට ශෝක වීම, පසුතැවීම හා එම වැරදි නිවැරදි කර ගැනීමට වඩා දෙවිඳුන් සමඟ ගැඹුරු



අභ්‍යන්තර සුහදවීමකි. එනම් යම් පුද්ගලයකුගේ පෞරුෂත්වය හෙවත් පුද්ගලභාවය මුළුමනින්ම නැවත හැඩගස්වා එය වඩාත් දෙවිඳුන්ට සමීප කර ගැනීමකි.

අද දින ශුද්ධවූ සුවිශේෂය තුළින් අපට ඉදිරිපත් කරන සකේවුස් ජෙරිකෝවේ විසූ ප්‍රසිද්ධ ධනවත් අයකැමියෙකි. ඔහුට අවශ්‍ය වූයේ ජේසුස් වහන්සේ කවුදැයි යන්න දැක බලා ගැනීමට පමණි. ඔහු තුළ තිබූ අධික බලාපොරොත්තුව නිසාම ජේසුස් වහන්සේ වෙතට සමීප වීමට ඔහු හට උවමනාවක් තිබිනි. සියල්ල සිදුවූයේ දේව සැලැස්මට අනුවය.

ජේසුස් වහන්සේ සකේවුස් හට පැවසූ වදන් මගින් ඔහු එම මොහොතේම ඔවුන් වහන්සේව තම නිවසට පිළිගැනීම තුළ තමා පව්කාරයකු බව වටහාගෙන ඒවාට මනස්ථාපනය වෙමින් එමගින් තමාගේ පව්කාර ජීවිතයෙන් ඉවත් වී, ජේසුස් වහන්සේගේ ප්‍රේමය තුළ තමා වෙනස් වූ බව සමාජයට පෙන්වීමට අවශ්‍ය විය. එනම් තමා විසින්ම තමා පිළිබඳව ස්වයං අවබෝධයක් ලබා ගත් අතර එයට මූලික හේතුව වූයේ ජේසුස් වහන්සේගේ කරුණාව හා ප්‍රේමයයි. එහි ප්‍රතිඵලයක් ලෙස තමා සතු සියල්ලෙන් අඩක් දුප්පතුන් සඳහා දීමට තීරණය කරයි. එමෙන්ම වන්දි ගෙවීමේ නීතියේ සීමාවද ඉක්මවා ඔහු ක්‍රියා කළේය. එනම් මෝසෙස්ගේ ව්‍යවස්ථාවට අනුව නියම කර තිබූ ප්‍රමාණය ඉක්මවා ආපසු ගෙවීමට ඔහු එකඟ විය.

ජේසුස් වහන්සේ සකේවුස්ට දෙවියන් වහන්සේ වෙත හැරෙන්නට ආරාධනාවක් කළ සේක. නව ජීවිතයකට කැඳවූ සේක. දුබල සකේවුස් මෙම ආරාධනාව අභියෝගයක් ලෙස පිළිගත්තේ ය. මන්දයත් මෙය තමාට දෙවියන් වහන්සේ විසින් ලබා දුන් වරප්‍රසාදයක් බවත්, එය යළි නොලැබෙන අවස්ථාවක් සේ සළකා එය පිළිගෙන ධර්මිෂ්ඨ ජීවිතයකට කැඳවීම ලැබුවේය.

දෙවියන් වහන්සේ මිනිසාට අසීමිත ලෙස ප්‍රේම කරන සේක. මනුෂ්‍යයා කොතරම් දෙවිඳුන්ට පිටුපා ගියත් ඔවුන් වහන්සේ කිසිදා අප අත්නොහරින සේක.

මනුෂ්‍යයන් ලෙස අප එකිනෙකා තුළ වැරදි ඇති බව පිළිගත යුතුයි. අපගේ ජීවිතය වඩා යහපත් කර ගැනීමට නම් අපගේ ජීවිතයේ වැරදි හඳුනාගෙන ඒවාට සැබෑ ලෙස මනස්ථාපනය විය යුතුය. එවිට සකෙවුස්ගේ ජීවිතය මෙන් අපගේ ජීවිත තුළ ඔවුන් වහන්සේගේ ප්‍රේමය ජීවත් කරවීමටත් යාච්ඤාව තුළ ඔවුන් වහන්සේගේ වරප්‍රසාදය අත්විඳිමින් ගැලවීමේ කාර්යයෙහි පංගුකාරයන් වීමටත් උත්සාහ කරමු. ඒ සඳහා අපගේ ජීවිත ඔවුන් වහන්සේට විවර කරමු.

"ස්වාමිනි, අප හදවත් ඔබ සඳහා නිර්මාණය වී ඇත. එහෙත්, ඔබ ඒ තුළ ලැගුම් ගන්නා තුරු ඒවාට සැනසීමක් නැත."

✍ ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
**ගරු හර්ෂ දිනෙත් සහෝදරතුමා**

ජනතා හඬ

# අක්මා වනසන 'පුංචි රෝමයේ' රා වාඩි



**කතුතුමනි,**

ශ්‍රීගමුව ඇතුළු පමුණුගම ප්‍රදේශ එවක පුංචි රෝමය ලෙස විරුදාවලි නම් ලැබුවේ එදා 100% ක්ම කතෝලික බැතිමතුන් පිරී සිටි ලංකාවේ එකම භූමිය වූ බැවිනි. අපට සුරාව හුරු කළේ පෘතුගීසින් බවද කියැවෙයි. අතීතයේ සිටම අද දක්වා මෙම කතෝලික පෙදෙස්වල පොල් රා මැදීමද සිදුවෙයි. එහෙත් පුදුමයකි. එම පෙදෙස්වල එදා තිබූ පොල්ගස් සංඛ්‍යාව අද ඉතාම හීනවී ඇතත්, බොහෝ රා තැබෑරුම් වල (වාඩිවල) විකිණෙන රා ප්‍රමාණය සිය දහස් ගුණයකින් වැඩිවීමේ ප්‍රාතිහාර්යයක්ද අපට දැන් පැහැදිලිව පෙනේ.

අතීතයේදී රා ගෙන එන වාහනය එනතුරු තැබෑරුම අසලම රැඳී සිටි අය කීවේ තවම රා ගෙනල්ල නැහැ. ටිකක් ඉඳිමු කියාය. අද එකී සුරා ලෝලීන්ම පවසන්නේ තාම රා හදල නැතුව ඇති ටිකක් ඉඳිමු යනුවෙනි. මෙය කෙතරම් මෝඩ මානසිකයක්ද? විපතට වැටීමක් නොව පැනීමක් නොවේද? පොල්ගස් රහිතව අද රා නිපදවන්නේ ඩිස්ප්‍රින් පෙති ඇතුළු තවත් සිරුරට අහිතකර රසායනද එකතුකරමින් බව නොරහසකි. ඉන් සිරුරට වන විනාශය කියා නිමකළ නොහැකිය. මෙකී මිනිස් අවයව විනාශය හා අපරාධ පිළිබඳව රා නිපදවන්නන් මෙන්ම අපේ දුප්පත් ග්‍රාමීය සුරා ලෝලීන් හා වගකිව යුත්තන්ද දැඩිව සිතා බලා ඉක්මන් පියවර ගත යුතුව තිබේ.

**සිසිල් රුද්‍රිගු**
නුගපෙ

# මළවුන් සිහිපත් කරන ඉල්මහේ

**කතුතුමනි,**

ඉල්මහ මළවුන්ගේ මාසයයි. කිතු දහමට අනුව මරණය යනු නව ජීවනයක ආරම්භයයි. ශරීරය දිරාපත්වී පසට හැරුනද ආත්මය නොනැසී පවතින්නේමය. එමෙන්ම අන්තිම විනිශ්චයේදී තීන්දුව දෙවියන් අතය. කතෝලිකයනට සොහොන් පිටිය ශුද්ධභූමියකි. එතන ජාති, කුල මල, ධනවත්, දුප්පත්, තරාතිරම් භේද කිසිවක් නැත. සියල්ලෝ මිහිතලයේ එකට සමාදානයේ සැතපෙති.

ජීවත්ව සිටින විට එකිනෙකා පරයා මම උගතා, පොහොසතා, බලවතා යයි සමාජයේ ඉස්මතු වන්නට දඟලයි. තවත් විටෙක බලයක් නැතිව කිසිවක් කළ නොහැකියයි ජීවිත පවා විනාශකරමින් බලයට පොරකයි. මේ සියල්ල නිසරු බව වැටහෙන්නේත් දෙවියන් සිහි වන්නේත් මරණ මංචකයේදීය. සමාජයේ තරුණ දූ, පුතුන්. උගතුන් පවා තමන් ඇඩිකළ මව්පියන් වියපත් වූ විට බස් නැවතුමක දමා යති. මුදලක් ගෙවා මහළු නිවාසයකට තල්ලු කරති. සමහරු මහමඟ හිඟමන් යදිති. මේ සියල්ලෝ දරුවන් වැදූ හැදූ අයවෙති. තවත් සමහරු නිවසේ හෝ අසල කාමරයක දමා වතුරවත් නැතිව මැරෙන්නට අරිති.

උජාරුවට මියැදුනාට පසුව මළ ගෙදරට මඟුල් ගෙදරක සිරියක් ආරූඪ කර ගනිති. නා නා ප්‍රකාර විලාසිතාය. භෝජන සංග්‍රහයන්ය. මළවුන්ගේ මංගල්ලයය ළංවත්වම සොහොන් කොත් කුරුස වර්ණවත් වෙයි. අලංකාර මල් පොකුරු වර්ණවත් ඉටිපහන් මේවායින් මියගිය තැනැත්තන්ට ඵලයක් තිබේද? ඇත්තෙන්ම නැත. සියල්ල ලෝකයාට පෙනෙන්නටය.

දූ, දරුවනි, දෙමාපියනි මේ මළවුන්ගේ මංගල්‍යය සමයෙහිවත් අප ජීවිතාදර්ශයට ගතයුතු වන්නේ දසපනතින් එකක් වන "දෙමාපියන්ට සැලකීම" ඔවුන් ජීවත්වන කාලයේදී ලබාදීමයි. උපස්ථාන ගෞරව කිරීමයි.

**සුනීතා මාලනී විජේසිංහ**
මතුගම

# මළවුන්ගේ මාසය යැයි භාවිතා කිරීම සුදුසුද?

**කතුතුමනි,**

කතෝලික අප හට මළා වූ අය සිහිපත් කිරීමටත් ඔවුන් වෙනුවෙන් දාන මාන, පුණ්‍ය ක්‍රියා සිදු කිරීමටත් "මළවුන්ගේ මාසය" යනුවෙන් නොවැම්බරය වෙන් කැර තිබීම සුවිශේෂී කරුණකි.

එහෙත් මෙය මළවුන්ගේ මාසය යැයි කියා නම් කිරීම එතරම් සුදුසු නැතැයි අපට සිතේ. ඒ මන්දයත් 'මළවුන්' යන වචනය සෑදී ඇත්තේ 'මළ+උන්' යන ප්‍රත්‍ය එකතුවීමෙනි. මෙහි 'අන්' යන්න සිංහලයෙහි ගෞරවාන්විත වදනක් නොවේ. මළා වූ අයට 'උන්' කියා භාවිත කිරීම සුදුසු නැත. එනිසා මෙය 'මළ අයගේ මාසය' නැතහොත් 'සග සැපත් අයගේ මාසය' යැයි හැඳින්වීම වඩා උචිතය. මේ ගැන කතෝලික සභාවේ වියතුන්ගේ අවධානය යොමුවන්නේ නම් ඉතා යහපති.

**ලුෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# දහම්ගුරු හඬ

**කතුතුමනි,**

ශ්‍රී ලංකාවේ සමක දහම් ගුරුවරු යනු මීසම් සේවක පියතුමාගේ ධර්මෝපදේශය බෙදාදීමේ කටයුත්තට හවුල්වන ප්‍රධාන හවුල්කරුවන්ය. ඔවුන් ධර්මෝපදේශ කටයුතු සඳහා සිය කැපවීම. නිරන්තරයෙන් සිය හදවතින්ම ලබා දෙන පිරිසකි. නමුත් ඔවුන් හට දේවස්ථානයේ ඇති විවිධ සමිති වල ඇතැම් බුද්ධිහීන ක්‍රියාකාරින්ගෙන් නොයෙකුත්, හිරිහැර හා චරිත ඝාතන ආදී දේ සිදුවන අතර ඒවා නැවැත්වීමට මීසම් සේවක පියතුමන්ලාද අපොහොසත් වෙති.

සමහර අවස්ථා වලදි එම ප්‍රශ්න මැද ඇතැම් මීසම් සේවක පියතුමන්ලාද තීරණයක් ගත නොහැකිව අසරණ වෙති. ඒ හේතුවෙන් දිසාවේ මීසම තුළ දහම් ගුරුවරුන්ගේ ක්‍රියාකාරී සංවිධායක අවශ්‍යතාව දැන් දැන් මතුව පෙනේ. එබැවින් එසේ දිසා මට්ටමින් දහම් ගුරුවරුන්ගේ ප්‍රශ්න ගැටලු සම්බන්ධව හඬක් නැඟීමට එවැනි 'දිසා දහම්ගුරු කමිටුවක්' ඇති කළ යුතු අතර දිසා අධ්‍යක්ෂ පියතුමන්ලාද ඒ පිළිබඳ සිය අවධානය යොමු කිරීම වටී. තවද ඒ සම්බන්ධව සියලු දහම් ගුරුවරුන්ව දැනුම්වත් කිරීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ.

**රොමේෂ් නෝනිස්**
කැලණිය විශ්ව විද්‍යාලය

# ශිෂ්‍යත්ව විභාගය 8 වසරේ පැවැත්වීම කාලෝචිතයි

**කතුතුමනි,**

5 වසර ශිෂ්‍යත්ව විභාගය ප්‍රතිඵල පසුගිය ඔක්තෝබර් 01 වැනිදා ලෝක ළමා දින නිකුත් කරනු ලැබිණි. වෙන අවස්ථාවල මෙන්ම මෙවරද මෙම විභාගය තුළ සමාජය තුළ විවිධ කතිකාවත් ඇතිවිය.

මෙම විභාගයට මුහුණ දෙන ළමයා 3 වන වසරේ සිටම මෙම පීඩනයට ලක්වන බව මගේ විශ්වාසයයි. එමෙන්ම එම දරුවාගේ දෙමව්පියන්ද මානසික පීඩාවන් තම දරුවා කෙරේ එල්ල කරයි. දෙමාපියන් තම දරුවාට ඇති ආදරය ඔවුන් නොදැනුවත්වම දරුවා රෝගියකු බවට පත් කරනු ලබයි.

8 වසර වනවිට මෙම විභාගය පැවැත්වුවහොත් මෙය ශාරීරිකව යමක් දරා ගැනීමට ද කයික හා මානසික ශක්තිය ඇත. අප අපගේ දරුවන්ගේ අනාගතය පිළිබඳ යහපත් සිතුවිලි දකින්නේ නම් අප සැම විටම අනවශ්‍ය පීඩාවන් දරුවා කෙරෙහි යොමු නොකොට දරුවාට නිදහස් පරිසරයක් සකස් කර දිය යුතුය.

**පී. අජිත් ලක්මාල්**
කට්ටුව

# නොසිතු මොහොතක උදාවු උදාර දිනයක්!



**කතුතුමනි,**

පළමු වතාවට යම් දෙව්මැඳුරකට ඇතුලු වන්නේ නම් ඉල්ලීම් 03 ක් දෙවිඳුන්ගෙන් ඉල්ලුවිට එයින් එකක් දෙවිඳුන්ට ප්‍රසන්න නම් එය ලැබෙන බව අපව වන්දනා ගමන් ගෙන ගිය, බදුල්ල පදවියේ ගරු ලියෝ පෙඩ්රික් පෙරේරා පියතුමා අපට පවසා ඇත.

මේ නිසාම මා දෙවිඳුන්ගෙන් ඉල්ලූ ඉල්ලීම් තුනෙන්ම ඉල්ලුවේ මා මියයාමට පෙර ගුවනින් ලූර්දු හෝ ශු. දේශය දැක බලා ගැනීමටයි. ගුවන් යානයක් අහසේ යනවිට මා ආශාවෙන් බලා සිටියේ මා කවදා මෙවන් ගුවන් යානයකින් යන්නද කියායි. මා වෙන කිසි සම්පතක් ඉල්ලුවේ නැත.


ලෝක විනාශය අත ළඟ බව කට කතා මගින් ප්‍රචාරය වන විට, මා සිතුවේ මගේ එකම සිහිනය බොඳවී යනු ඇත කියායි. මගේ පවුලේ සොයුරු සොයුරියන් දූ දරුවන් මුදලින් ධනවත් වූවත් මාහට රැකියාවක් කිරීමටවත් නොහැකිව පියා නොමැති අපව ආදරයෙන් හැදූ වැඩූ අම්මාව බලාගෙන ආගමික කටයුතුවල පමණක් යෙදෙමින් නිවසට වී සිටියෙමි. සැමවිටම දේව කැමැත්තට හිස නමමින් කටයුතු කළෙමි.

2013 මාර්තු මස 06 වන දින මා පැතූ මාගේ එකම සිහිනය සැබෑ කරන්නට කරුණාබර දෙව් පියාණෝ ධනයෙන් දිළිඳු නමුත් දහමින් පොහොසත් මාව තෝරාගත් සේක. දේව දයාවේ සමිඳුන් මෙන්ම දේව අම්මාද මා කළ යැදුම්වලට සවන් දුන්හ. ශුද්ධවූ දේශයට ගුවනින් යාමේ සිහිනය සැබෑ කරමින් එම ගමන යාමට (මාර්තු 06-13) මාගේ ගුවන් ටිකට් පත නොසිතූ අයුරින් මට ලැබුනි. එම ප්‍රාතිහාර්ය කළ දෙව් සමිඳුන්ට ප්‍රශංසා වේවා. මගේ පවුලේ කිසිම කෙනෙකුට නොලැබුන එම අවස්ථාව දෙව් පියාණන් මට ලබාදුන්නේ ජෙරමියා දිවැසිවරයා තෝරාගත් ලෙස මව් කුසයේ පිළිසිඳීමට පෙර මා නුඹ තෝරාගත්තෙමි" යන වදන් සිහිපත් කරමිනි (ජෙරමියා 1:5).

මා සැමවිටම සැම අභියෝගයකදීම රෝගී අවස්ථාවලදීත් දෙවිඳුන් අත් නොහළ නිසයි මෙවන් ප්‍රාතිහාර්යක් මට අත්දකින්න ලැබුනේ. එය මගේ පවුලේ සැම පවසන දෙයකි. මෙම ප්‍රාතිහාර්ය කළ දෙවිඳුන්ට දිනපතා ශු. පැය කරමින් තුති පුදන අතර, මේ ගමන යාමට දායකවු අයට දෙව් ආසිරි යදිමි.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**
බදුල්ල

# කෝ ආසිරි පැන්?




**කතුතුමනි,**

කිතුනු අපගේ සැම දේවස්ථානයකම ඇතුළු වන දොර කවුළුවට සමීපව ආසිරි පැන් පුරවා තැබීමට යම් ආකාරයක ස්ථානයක් සකසා තිබෙනු දැකිය හැක. අපේ දෙව්මැඳුරු වලට ඇතුළු වන හා පිටවන සැදැහැවතුන් බහුතරයක් නිරායාසයෙන්ම මෙම ආසිරි පැන් ඇති ස්ථානයට සිය දකුණත යොමු කර ආසිරි පැන් බිඳකින් ආශිර්වාදයක් ලබා ගන්නට උනන්දුවන ආකාරය දැකිය හැකිය.

ඒත් අවාසනාවකට මෙන් අපගේ බහුතරයක් දෙව් මැඳුරු වල අදාල භාජනවල ආසිරි පැන් නොමැතිවීම ඇත්තෙන්ම කණගාටුවට කරුණකි. එහෙයින් මේ පිළිබඳව විශේෂ අවධානයට යොමුකර , අඩුතරමින් අල්තාරයට සමීපව නිරතුරුව විවෘතව තිබෙන දොර කවුළු හෝ ආසිරි පැනින් පුරවා තැබීමට සිය කාරුණික අවධානය යොමුකරන මෙන් දේවස්ථාන භාර අපේ ගරු පියතුමන්ගෙන් ඉල්ලා සිටිනු කැමැත්තෙමි.

**ජූඩ් සේනාධීර**
වට්ටක්කුලිය



## විසිපස් වසරක් පුරා ලාංකේය දහම් කෙත අස්වද්දන

# මෝල්ටාවේ දොමිනිකාන සොහොයුරියෝ

ක්‍රි. ව. 1170 දී ස්පාඤ්ඤයේ පැරණි කුස්ටිලිහී කලෙරුඒගා නම් ග්‍රාමයෙහි උපන් ශාන්ත දොමිනික් තුමා සැබෑ ධ්‍යානශීලී පුද්ගලයෙකි. පසුව එතුමා ශුද්ධවන්ත භාවයට ද පත්කරනු ලැබීය.

ලෝකයේ අස්සක් මුල්ලක් නැර තම අපෝස්තලික සේවාව රැගෙන යාම පිණිස පැවිදි නිකායක් ආරම්භ කිරීම ශාන්ත දොමිනික් තුමාගේ සිහිනය විය. එය යථාර්ථයක් බවට පත් කරමින් 1215 දී දේශනාවාදීන්ගේ නිකාය පිහිටුවූ අතර 1216 දී ශුද්ධස්ථානය මඟින් එය සම්මත කරනු ලැබීය. දිව්‍ය සත්ප්‍රසාදය කේන්ද්‍ර කොට ගෙන පිහිටුවනු ලැබූ මෙම දොමිනිකාන සංඝය බොහෝ දෙනෙකුගේ ජීවිත වෙනස් කිරීමටත් ශාන්ත තෝමස් ඇක්වයිනස් තුමා, සියනාවේ ශාන්ත කැතරිනා තුමිය, ශාන්ත මාටින් පෝරස් තුමා, ලීමා හී රෝස් තුමිය වැනි බලවත් ශ්‍රේෂ්ඨ ශුද්ධ වන්තයින් බිහිකරන්නටද සමත් විය. ඉතා ඉක්මනින් දොමිනිකාන පැවිදි ධර්මදූතවරුන් ලෝකය පුරා පැතිරුණු අතර ඔවුහු පෙරදිග තම ධර්මදූත කටයුතු ආරම්භ කළහ.

ශුද්ධ වූ දොමිනික් මුනිතුමන්ගේ ස්ප්‍රීතුව ලොව පුරා පතල කරන්නට මෝල්ටාවේ දොමිනිකානු සොහොයුරියන්ගේ නිකාය 1889 දී කැරොලිනා කවුකි නැමති දොමිනිකාන තෙවන පංතියේ තරුණ සාමාජිකාව විසින් අරඹන ලදී. ඇයගේ මුල් බලාපොරොත්තුව වූයේ ආශ්‍රමික තාපසිකාරාමයක් ආරම්භ කිරීම වුවද ප්‍රථමයෙන්ම ඇයට එක් වූ සාමාජිකාවන් හය දෙනා සභාවේ අවශ්‍යතාවයන්ට අනුව සාත්තු සේවය හා අධ්‍යාපනය සඳහා කැපවූ හෙයින් ඇගේ මුල් අදහස අත් හැරීමට සිදු විය. "ඇදහිලිවන්ත සමූහයා එක්සත්ව එක්සිත්ව සිටියහ." (ක්‍රියා 4:32) යන ක්‍රිස්තියානි ආදර්ශ පාඨය තම පරමාදර්ශය කොට ගනිමින් මෝල්ටාවේ දොමිනිකාන සොහොයුරියන්ගේ සංඝය ආරම්භ කරන ලදී.

- **දුබල හා වයස්ගතවූවන් රැක බලා ගැනීම**
- **ඉගැන්වීම හා දරුවන් යහමඟට යොමු කිරීම**
- **ප්‍රශ්න සහිත තරුණ තරුණියන් හා ළමුන් රැක බලා ගැනීම**
- **සාමාජීය ගැටලු සහිත කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන්ට රැකවරණය දීම**

යන, දූතික කාර්යයන් ඔවුන්ගේ සේවාවේ ප්‍රධාන අංගයන් වේ.

කොළඹ අගරදගුරු පදවිය තුළ සේවය කිරීමට මෝල්ටාවේ පැවිදි සොයුරියන් ව කෙලේලිය, බායි, තෙරෙස් පෙනෙත්, ඩොසිති ෆෙරෝ සහ ඇන්ඩෲ සුල්තානා යන මෝල්ටාවේ දොමිනිකාන පැවිදි සොහොයුරියෝ හතර දෙනෙක් ප්‍රථම වරට 1954 දී ශ්‍රී ලංකාවට සැපැත්වූහ. ඔවුන්ගේ ප්‍රථම කාර්යය වූයේ දුගී මව්වරුන්ට සහාය වීම සඳහා දිවා සුරකුම් මධ්‍යස්ථානයක් ඇරඹීමයි. 1956 දී හලාවත රදගුරු තුමන්ගේ ආරාධනය පරිදි තම සේවාව එම පදවිය කරා දියත් කළ දොමිනිකාන සොහොයුරියෝ දුගී තරුණියන් රැක බලා ගැනීම සඳහා මාවතගම කන්‍යාරාමයක් විවෘත කළහ. කෙසේ වුවද 1960 මුල් භාගයේදී ඇතිවූ විරෝධතාවයන් හේතු කොට ගෙන මෝල්ටාවේ දොමිනිකාන සොහොයුරියෝ 1966 දී ශ්‍රී ලංකාවේ තම සේවාව නවතා දමා තම තරුණ ශ්‍රී ලාංකික සොහොයුරියන් රැගෙන ආපසු මෝල්ටාව බලා ගියහ.

කුරුණෑගල නව රදගුරු පදවිය බිහිවීමත් සමඟ එහි ප්‍රථම රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් කළ ආරාධනයක් අනුව නැවතත් මෝල්ටාවේ දොමිනිකානු සොහොයුරියන්ට ශ්‍රී ලංකාව තුළ තම සේවාව ආරම්භ කිරීමට අවස්ථාවක් උදාවිය. රදගුරු තුමන්ගේ ආරාධනය පිළිගත් එවකට මෝල්ටාවේ දොමිනිකානු සොහොයුරියන්ගේ ශ්‍රේෂ්ඨාධිපතිනියව සිටි ගරු වර්ජිනියා එල්යුල් මව්තුමිය ශ්‍රී ලංකාවේ පළමු දොමිනිකාන සොහොයුරිය වූ ගරු හයසින්ත් නානායක්කාර සොහොයුරිය හා තවත් ශ්‍රී ලාංකික සොහොයුරියන් වූ ගරු තෙරෙස් ප්‍රනාන්දු සොහොයුරිය, ගරු සිරිමා ඕපනායක සොයුරිය සමඟ ශ්‍රී ලංකාවට එවන ලදී. මෙලෙස 1988 දී කුරුණෑගල පදවියේ මැල්සිරිපුර නව කන්‍යාරාමයක් අරඹා දොමිනිකාන සේවාව නැවත දියත් කරනු ලැබීය. එදා මෙදා තුර මැල්සිරිපුර ග්‍රාමය තුළ වපුළ දහම් බීජය නැමති ධර්ම දූතික සේවයට පස් විසි වසර සනිටුහන් වනුයේ 2013 වර්ෂයටය.

මැල්සිරිපුර, මොරොත්ත, දිද්දෙනිය, ගාලේවැව, කුඹුක්වැව, දොඩම්ගස්ලන්ද, බක්මීගොල්ල යන දේවස්ථාන සහ මීසම් වල මෝල්ටාවේ දොමිනිකානු සොහොයුරියන්ගේ ධර්මදූතික සේවා කලාපය විය. එම දූතික සේවාව විශාල ප්‍රදේශයක් කරා විහිදී ගිය අතර බෞද්ධ බැතිමතුන් විශාල පිරිසක් ජීවත් වන මෙම මීසමේ ක්‍රිස්තියානි සංඝය සැබවින්ම තැනින් තැන විසූ කුඩා කණ්ඩායම් වලින් සමන්විත විය.



ප්‍රදේශාධිපතිනි ගරු සිරිමා ඕපනායක පැවිදි සොයුරිය



නිකායේ මෙරට ආරම්භක සොයුරියන් වන ගරු හයසින්ත් සහ තෙරෙස් ප්‍රනාන්දු පැවිදි සොයුරියන්

ක්‍රිස්තියානි දහම පිළිබඳව ඔවුන්ගේ දැනුම අල්ප වූ අතර සක්‍රමේන්තු හා එදිනෙදා ක්‍රිස්තියානි ජීවිතය ජීවත් වීම සම්බන්ධයෙන්ද ඔවුහු මහත් පසුබෑමකට ලක්වී සිටියහ. මෙය ඉතා පහසුවෙන්ම ඔවුන් වටා පැවති අන්‍ය ආගම් කරා ඔවුන්ව ඇදී යාමේ අනතුරක් ඇතිකරවන්නක් විය. මෙම කුඩා සංඝය විශ්වාසයේ ජීවිතයෙන් පෝෂණය කිරීමත්, ඔවුන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීමත් දොමිනිකාන සොහොයුරියන්ගේ ධර්මදූත කාර්යය විය. එඩේරෙකු නොමැතිව මං මුළා වූ බැටළුවන් තම රැළට එක්කර ගැනීමේ භාරධූර ධර්මදූත කාර්යය ද ඔවුන් සතුවිය.

සොහොයුරියන් භාරගත් කාර්යය සැබැවින්ම පහසු එකක් නොවීය. මක්නිසාද යත් තම දූත කාර්යයන් ඉතාමත් සංකීර්ණවූ අතර මෙම කිතුනුවන්ගේ ජීවිතයේ සෑම අංශයක් පිළිබඳව මෙන්ම සෑම පුද්ගලයෙකු ගැනම සොයා බැලීමටත් සොහොයුරියන්ට සිදු විය. බක්මීගොල්ල මීසම් සේවක පියතුමාගේ මඟපෙන්වීම හා උපදෙස් අනුව ළමුන් සඳහා ධර්මෝපදේශ පංති ආරම්භ කිරීම, වැඩිහිටි ධර්මෝපදේශ විශ්වාසයෙහි තර කරනු වස් පවුල් බැහැදැකීම, ගැටලු වලට මුහුණපා සිටින තරුණ තරුණියන්ට මඟ පෙන්වීම හා කිතුනු සංඝය තුළ ජනවන්දනා මෙහෙයන් පැවැත්වීම හා කිතුනු බොදුනු හොඳ හිත සහ සහජීවනය වැඩි කරනු වස් ළදරු පාසල් ආරම්භ කිරීම වැනි දේ සොහොයුරියන් විසින් ආරම්භ කරන ලදී.

මොරොත්ත, දිද්දෙනිය සහ ගාලේවැව යන ස්ථානවල වැඩිහිටියන්, දේව විශ්වාසය පිළිබඳව අල්ප දැනුමකින් යුතු වූ අතර මූලික දහම් දැනුම ඔවුහු දැන නොසිටියහ. ධර්මදූත සේවාවේ ආරම්භකයන් වූ ගරු හයිසින්ත් සොහොයුරිය සහ තෙරෙස් ප්‍රනාන්දු සොහොයුරිය හා සිරිමා ඕපනායක සොයුරියන් දිවා රෑ නොබලා මෙහෙයවමින් කළ සේවාවේ ප්‍රතිඵලයක් ලෙස පැවිදි කණ්ඩායමේ ප්‍රධානියාවූ ගරු හයිසින්ත් සොහොයුරිය මෙම කිතුනු සංඝයෙහි සියල්ලන්ටම පවනක් බඳු විය. මෙම සොහොයුරියන් ජන ජීවිතය හා මුසු දුෂ්කර අවස්ථාවන් වලට ධෛර්යමත්ව මුහුණ දුන් අතර, විටෙක වර්ෂා කාලයේදී ඇල දොළ ගංගා උතුරා යාම හේතුවෙන් තම කන්‍යාරාමයට නැවත ඒමට නොහැකිව තම සේවා ස්ථානයේම රැය පහන් කිරීමට සොහොයුරියන්ට සිදු වූ අවස්ථාවන් ද බොහෝ විය.

දෙවියන්වහන්සේගේ ආශිර්වාදය මැද දේව කැඳවීම් වර්ධනය වීමත් සමඟ සොහොයුරියන් තම සේවාව අසල්වැසි හිරිපිටිය වැනි දුෂ්කර මීසම් කරාද දියත් කළහ. ධර්මදූත සේවාව වැඩි දියුණු වීමත් සමඟ දේව කැඳවීම්ද වර්ධනය වීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළම ආධුනිකාරාමයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය පැනනැගුණි. මෙලෙස 1990 දී පැවිදි දිවියට ඇතුළත් වීමට අදහස් කරන තරුණියන් සඳහා වූ "මාටින් ද පොරස් ආධුනික තරුණ පුහුණු නිවාසය" මහනුවර මීසමේ කටුගස්තොට දී ආරම්භ කරන ලදී. ආධුනිකාරාමය අධ්‍යාත්මික ජීවිතයේ වැඩි වර්ධනයට මෙන්ම සේවය සඳහා පුහුණු කරවන්නාවූ තෝතැන්නක් ලෙස හැඳින්විය හැක.

ආධුනික පුහුණු නිවාසයට යාබදව දුගී දරුවන් සඳහා වූ නිවාසයක් ද වෙයි. එය විවිධාකාර පවුල් අපහසුතා හේතුවෙන් පැමිණි දරුවනට අධ්‍යාත්මික පෝෂණය හා අධ්‍යාපනය මෙන්ම රැකවරණය සහිත ස්ථානයක්ද වෙයි. වත්මන් හී මෙම දරුවන්ගේ ජීවිතය පිළිබඳව සුභදායී වාතාවරණයක් සලසා දෙන සියලු පහසුකම් සහිත ස්ථානයක් ලෙස වැඩි දියුණුවී ඇත. 1997 දී ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ ආරාධනය පරිදි කොළඹ බැල්කම් පෙදෙසේ කන්‍යාරාමයක් ආරම්භ කිරීම මඟින් දොමිනිකානු සොහොයුරියන්ගේ දූත සේවාව තව දුරටත් පුළුල් විය. එම සොහොයුරියන්ගේ දූත කාර්යය වනුයේ, ගෙයින් ගෙට ගොස් දේවස්ථානයට පැමිණීමට නොහැකි වයෝවෘධ රෝගීන්ට දිව්‍යසත්ප්‍රසාද වහන්සේ ලබාදීම හා අවට දේවස්ථානවල දහම් සේවාව සඳහා දායක වීම සහ රදගුරු මණ්ඩලයේ දෛනික අවශ්‍යතාවන් සඳහා දායක වීමය. 2004 වර්ෂයේදී මීගමුව, අක්කරපනහ ප්‍රදේශයේ ආවේ මරියා ශාඛා විදුහල මෝල්ටාවේ දොමිනිකාන සොහොයුරියන්ගේ භාරයට පත් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ මෝල්ටාවේ දොමිනිකාන සොහොයුරියන්ගේ සේවාවේ තවත් වැදගත් අදියරක් සනිටුහන් විය. එය තවමත් වැඩි දියුණු වෙමින් පවතින තත්වයක තිබූ හෙයින් විද්‍යාලයට ආසන්නව කන්‍යාරාමයක් විවෘත කිරීමේ අවශ්‍යතාවය මතුවීම නිසා එය සාර්ථක කර ගැනීමට එම සොහොයුරියන්ට අවස්ථාව උදාවිය. අද වන විට මෙම විද්‍යාලයේ ශිෂ්‍යාවන්ට උසස් අධ්‍යාපනයක් සලසා දීම පමණක් නොව ඔවුන් තුළ දේව විශ්වාසය වර්ධනය කිරීමට ද මෙම පාසල මහගු තෝතැන්නක් වී ඇත.

දොමිනිකාන සොහොයුරියන්ගේ උණුසුම් හා ආදරය මුසුව දියත් වන දොමිනිකානු තරුණ සංවිධානය දොමිනිකාන ස්ප්‍රීන්තුව ලෝකය වෙත ගෙන යාමට අරඹා ඇති තවත් පියවරකි. මෙම තරුණ ව්‍යාපාරය මඟින් එහි සාමාජිකාවන් මෙන්ම ඔවුන්ගේ පවුල් වල අය හා හිත මිතුරන්ද ද්‍රව්‍ය දෘෂ්ඨිමය සංස්කෘතියෙන් මුදා දෙවියන් කරා ළංකර වීමට සමත් වී ඇත.

"දෙවියන්වහන්සේ සමඟ හා දෙවියන් වහන්සේ ගැන පමණක් කථා කරන්න" යන දොමිනිකාන ආදර්ශ පාඨය කෙරෙහි මහත්සේ විශ්වාසයක් තබන මෙම සොහොයුරියෝ, ඔවුන් විසින් වගුරුවනු ලැබුවාවූ විශ්වාසයේ බීජ මහත්සේ ඵල දරණු පිණිස යාච්ඤා කරති.

පස් විසි වසරක දූත සේවාව ගැන දෙවියන්වහන්සේට තුති පුදන දොමිනිකාන සොහොයුරියෝ මිහි පිට දේව රාජ්‍ය ජනිත කරනු වස් දොමිනිකාන ස්ප්‍රීන්තුව තුළින් ජනතාව දෙවියන් කරා ගෙන ඒම සඳහා ඔවුන් හා එක් වීමට අප දේශයේ තරුණ දියණියන්ට සාදරයෙන් ඇරයුම් කරති.

**සටහන හා සේයා**
**ටී. සුනිල් ප්‍රනාන්දු**

# ඇක්වයිනස් විශ්ව විද්‍යාල වි

# ඉහළම ආයතන පහ

## ඇක්වයිනස් විශ්ව විද්‍යාල විද්‍යායතනයේ අධි

මානව හිමිකම් ප්‍රඥප්තිය ඔස්සේ සලකා බලන විට මිනිස් අයිතීන් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නේ අධ්‍යාපනයට ඇති අයිතියයි. සාම්ප්‍රදායික ප්‍රඥාවට අනුව සමාජයේ බොහෝ සමාජ වෙනස්කම් ගෙන ඒමට අධ්‍යාපනය හේතු සාධක වූ බව පිළිගැනීමයි.

සැබවින්ම එදා අපේ නායකයන් අධ්‍යාපනයේ වැදගත්කම වටහා ගත් බැවින් ශ්‍රී ලංකාව නිදහස ලබා ගත් දිනවලදීම නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන්නට පියවර ගත්තේ ය. මේ ඔස්සේ ශ්‍රී ලංකාව අධ්‍යාපනයේ ප්‍රතිඵලයන් ලෙස ඉහළ සාක්ෂරතාවය, ඉහළ ප්‍රතිශතයක් ගත් ප්‍රාථමික පාසල් වලට සිසු සිසුවියන් ඇතුළත් කිරීම මෙන්ම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය එක සමානව අධ්‍යාපනයට වරම් ලැබීමෙන් එහි ප්‍රතිඵල භුක්ති විඳීමේ ඉහළ අනුපාතය කලාපයේ සෙසු රටවල් සමඟ සසඳද්දී ඉහළ අගයක් ගෙන ඇත. නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාද ලැබුවෝ නිදහසින් පසු මේ රටේ සුබසිද්ධිය උදෙසා දායක වූහ. මේ තත්ත්වය ශ්‍රී ලංකාවේ නායකයන් තුළ නිදහස් අධ්‍යාපන ක්‍රමය ආරක්ෂා කරගන්නටත්, ප්‍රගුණ කරන්නටත් හේතු විය යුතු මුත් අවාසනාවකට මෙන් එය එසේ සිදු නොවීය.


අධ්‍යාපනයේ වැදගත්කම සංවර්ධනය වන ආර්ථිකයක සහ සමාජ ප්‍රවනතා සහිත විශ්වීයකරණයක වූ ලෝකයක සලකුණු වුවද ශ්‍රී ලංකාවට එය එසේ වූයේ නැත්තේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ ආර්ථික සහ රටේ සමාජ අවශ්‍යතාවන්හි බරපතල හිඩැස නිසාත් සිසුන්ගේ අධ්‍යාපනික කුසලතාත් හේතුවෙනි. උපාධිධාරින් පවා ත්‍රස්තවාදී යුද්ධය නිමා වූ රටට අවශ්‍ය ප්‍රතිසංධාන ක්‍රියාකාරකම් සඳහා මෙන්ම තාක්ෂණික ඒකාධිපතිත්වයෙන් යුතු ආර්ථිකයේ ඉල්ලීම් සපුරාලන්නට අසමත් වී සිටී.


එමෙන්ම ශ්‍රී ලංකාවේ රජයයන් විටින් විට අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දීම ගැන කතා බස් කරමින් බොහෝ විට ටික ටික සිදුකරන ප්‍රතිසංස්කරණයන් රටේ ආර්ථික හෝ ප්‍රතිසංධාන අවශ්‍යතා හා කවර හෝ සම්බන්ධකමක් නැත. සමහර රජයයන් සිය දේශපාලනමය අරමුණ සපුරා ගැනීමේ අරමුණින් ජාතික දේශපාලන න්‍යායයන් හි බෙදීම් සඳහා ද අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් යොදා ගනු දැකිය හැකිය. එක්වරක දී සිසුන් එකම දේශයක පුරවැසියන් ලෙස සැළකිය යුතු වුවද පාසල්වල භාෂා වෙනස්කිරීම් ලෙස සිංහල හා දෙමළ ලෙස කොටස් වලට බෙදනු ලැබේ. මෙය සිය මවුබසින් ඉගෙනුම ලැබූ දරුවන් අතර නොවැළැක්විය හැකි බරපතළ තත්ත්වයක් බවට පත් වේ. සමහර ප්‍රතිසංස්කරණයන් දේශපාලන වාසි තකා කඩිමුඩියේ හඳුන්වාදීමේ අත්දැකීම් වලට ද අපි මුහුණ පා ඇත්තෙමු. උසස් අධ්‍යාපනය මෙන්ම ද්විතියික අධ්‍යාපනය ද අවහිර බාධක මධ්‍යයේ පසුගාමී වන්නේ විශ්වීය සැලසුම් අනුව ආර්ථික සංවර්ධනය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා නොගැලපීමත්, ශ්‍රම වෙළෙඳපොළේ අවශ්‍යතා අනුව නොපැවතීමත් නිසාවෙනි.

"ඉතා කෙටි කාලයක් තුළ වර්ධනය වී මහා බේදවාචකයන් ලෙස හඳුන්වන විවිධ සිදුවීම් අගිස්සේ අපි කාලය ගත කරමු. අධ්‍යයන නොවන හා අධ්‍යයන කාර්ය මණ්ඩලයන් වැඩි වැටුප් ඉල්ලා වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයන්ට අවතීර්ණ වීම, අධ්‍යාපනය සඳහා රාජ්‍ය අංශයේ වැඩි ආයෝජනයන් ඉල්ලා උද්ඝෝෂණ කිරීම, Z ලකුණු මායාව, 1978 සරසවි පනතට සංශෝධන යෝජනා කිරීම සහ ජාත්‍යන්තර පෞද්ගලික ආයෝජකයන්ට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යපනය සඳහා ආයෝජනය කරන්නැයි ආරාධනා කරමින් පෞද්ගලික විශ්ව විද්‍යාල පිහිටුවීමට අවකාශ සලසා දීම ආදිය වර්තමාන විවාදයන්හි සමහර තේමාවන් හා සිද්ධීන් බවට පත්ව තිබේ. රුහුණු විශ්ව විද්‍යාලයේ උපකුලපති සුසිරිත් මෙන්ඩිස් මහතා එම සරසවියේ ප්‍රවෘත්ති ප්‍රකාශනයේ මංගල කලාපයට ලියා තිබෙන්නේ ඉතාමත් වැදගත් හා දැවෙන ප්‍රශ්නයක් ඉස්මතු කරමින් ඊට පිළිතුරු ලබා ගන්නට ය. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය අර්බුදයක ද? සිවුමංසලක ද?

තවදුරටත් බොහෝ හේතු දක්වන ඉතාමත් විශේෂඥ අධ්‍යාපනඥයෝ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබූ තරුණයන් අතර විරැකියාව පිළිබඳව විවිධ කරුණු ප්‍රකාශ කරති. එහිදී වඩාත් වැදගත් හේතුව ලෙස අනාවරණය වන්නේ වෘත්තිය කුසලතා

නොගැලපීම වන අතර
අවශ්‍යතා සපුරන්නට අ
සමත් වී නැත. තවත්
වනුයේ රාජ්‍ය සේවයේ
වැටුප් ප්‍රතිපත්තිය ජනග
සිත් ඇද බැඳ ගත් රැකි
ගැසීමේ ප්‍රවනතාවයක්
සමත් වී ඇත. පෞද්ගලි
අවස්ථා සුරක්ෂිත කිරීම
වෙළෙඳපොළ නීතිරීති





# ිද්‍යායතනය මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අතරට එක්වීමට වරම් ලබා ඇත

## න්තෘ ගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමා වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කරයි

ශ්‍රම වෙළෙඳපොළේ
ධ්‍යාපන ක්‍රමය
හේතු දැක්වීමක්
රැකියා සහ රටේ
හනය අතර වඩාත්
යා සඳහා පෝලිම්
ඇති කරන්නට
ික අංශයේ රැකියා
ට බරපතළ ශ්‍රම
හේතු වී තිබේ.

කොතැනද, සියලු ප්‍රාතිහාර්යාත්මක ක්‍රියා මාර්ගයන් ආරම්භවේ. යමකු වැරැදි මාර්ග යක යන්නේ නම් ඔහුට වේගවත් වීමට හැඩගැස්මක් අවශ්‍ය නැතැයි කියමනක් තිබේ. ඔහුට අවශ්‍ය වන්නේ නැවත හරවා එවීම සඳහා හොඳ අධ්‍යාපනයක් පමණි.

සමාජ වෙනස්කම් සඳහා අධ්‍යාපනය ප්‍රධාන සාධකයකි. අප සිතන්නේ අපගේ විශ්ව විද්‍යාලයත් ජාතික සමෝධානය සහ සමාජ සාධාරණත්වය උදෙසා ක්‍රියාකාරි





ම් සියලුම තොරතුරු
රැකියා තත්ත්වය ශ්‍රී
ප්‍රශ්නයක් වී ඇතත් ඒ
ධ්‍යාපනය සහ
ර්ධනය රජයේ
ශයේ ද පවතින
රැකියා සඳහා
ා සපුරන්නට

නියෝජිතයන් ලෙස සිය කාර්ය භාරය බාර ගැනීමේ වැදගත් බවයි. අපට සියල්ලන් සංවර්ධනය කරගන්නට හැකි වන්නේ පූර්ණ අධ්‍යාපනය සැම සියලු දෙනා වෙත ලැබීමෙනි.

අපගේ විශ්ව විද්‍යාල දැනුම්වත් කිරීම් ඔස්සේ අවදි වන්නේ නම් සමස්ත දේශයම ස්වකීය කර්තව්‍යය සපුරා ගැනීමට

**ලට සකස් කළේ : ශිරාන් මෛත්‍රී**

හිසාවෙනි.
අර්බුදයන් එක්ව
ළ පැන නැගීම
ළ ප්‍රජාවන් තුළ
ජය තුළ ද
සහ අඩමානයන්
වශයෙනි. එහිදී එක්
ශ්‍ය වනුයේ ශ්‍රී
නයේ අනාගත
අර්බුදයන්
වධියකට රැගෙන
කාරක ද සමත්ව
ට උසස්
හ තත්ත්වය
ක් වෙමින් පවතින
ත් වීමකට එමඟින්
වෙනත් වචන
පගේ පාසල් සහ
පූර්ණ අධ්‍යාපනයක්

නැම සමාජයක
වන අතර ශ්‍රී
මින් පවතින රටකට
දේශය සිය අනාගත
රීමේදී ඉහළම
පරපුරේ උසස් හා
ලබා දිය යුතුය.
ත්වයේ ආරම්භයයි.
බ්‍ය සම්පන්න බවේ
ධ්‍යාපනය
ි. හොඳ අධ්‍යාපනය
මූලාරම්භයයි.
ාත්මිකත්වයේ පටන්
නයක් ඇත්තේ

සම්පත් සැපයීමට එක්වන්නේය. අපගේ සරසවි වර්තමාන සමාජයේ වෙනස්වීම්වලට සහභාගි වෙමින් වඩාත් යහපත් මානව කොන්දේසි ඇති කරන්නට කටයුතු කළ යුතුය.

අපගේ සරසවි දේශයේ සෙසු සියල්ලන් සමඟ කැපවෙමින් ස්වකීය සමාජ ප්‍රශ්න වෙත අවධානය යොමු කළ යුතුය. අපගේ සමාජය වෙනස් කිරීමේ භාරධූර කර්තව්‍යයේ දී ඔවුන් සතුව බරපතල කාර්යභාරයක් තිබේ. අප රටේ ප්‍රමිතියෙන් සහ පූර්ණ අධ්‍යාපනය අසාධාරණ සමාජ පසුතලයන්හි පදනම වී ඇති බව අප අමතක නොකළ යුතුය.

දැන් නැවතත් වරක් රජය සිය ඒකායන අරමුණු අතරට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතින්නේ ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ දැනුමේ කේන්ද්‍රය බවට පත් කිරීම සඳහා ය. උසස් අධ්‍යාපනික ආයතනයක් සඳහා නව නීතිරීති දැනටමත් සැකසෙමින් පවතින්නේ ඒවායේ ඉහළ ප්‍රමිතිය සහතික කිරීමටය. සුදුසුකම් ප්‍රකාශ කිරීමේ මූලික පනතත් ළඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යන්නේ ඉහත අරමුණ පෙරදැරි කරගෙනය. එමඟින් ප්‍රාග්ධනය හා මානව සම්පත් එතෙරින් මෙන්ම මෙතෙරින් ද අධ්‍යාපන ක්ෂේත්‍රයට ගලාගෙන ඒමට සලස්වනු ලැබේ. එහෙත් අධ්‍යාපන බලධාරින් මේ ප්‍රතිසංස්කරණයන් වලදී අධ්‍යාපනය මේ වෙනස්කම්වල උත්ප්‍රේරකයක් ලෙස පාසල් උසස් අධ්‍යාපන ආයතන සහ විශ්ව විද්‍යාලයන් මඟින් පූර්ණ චරිතයකින් යුතු පුද්ගලයන් බිහිකිරීමේ සුවිශේෂී අවශ්‍යතාවය ගැනද අවධානය යොමු කළ යුතුය. ශ්‍රී ලංකාවට පූර්ණ, සැබෑ දූරදර්ශී පුද්ගලයන් මඟින් සංවර්ධිත දේශයක් තුළ අප සමාජයට මඟ පෙන්වන්නට ඔවුන් අවශ්‍ය කර තිබේ.

හදිසි අවශ්‍යතාවයක් ලෙස ජනාධිපති තුමා උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම වැනි කොමිසමක් පත්කර එමඟින් විය යුතු සැබෑ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ සකස් කළ යුතු වන්නේ ඇමැතිවරුන් විටින් විට උද්ගතවන ගැටලු වලට යොදන තාවකාලික පැලැස්තර විසඳුම් මඟින් ඒවා ඉටු නොවන බැවිනි. පාසල්වලට ඇතුළත් කර ගැනීම්, විශ්ව විද්‍යාල පටිපාටියේ වෙනස්කම්, පාසල් විෂය මාලාව, වෘත්තීය අධ්‍යාපනයට හිමි තැන සහ උපාධිධාරින් විරැකියාවෙන් පෙළීමේ බේදවාචකය වැනි දෑ සැලකිල්ලට ගත යුතුය.

මේ කොමිසම මඟින් මහත් ප්‍රසිද්ධියට පත් අධ්‍යාපන ධවල පත්‍රිකාවට සිද්ධ වූයේ කුමක්දැයි අධ්‍යයනය කළ යුතුය. පොකුරු පාසල් අධ්‍යාපන ක්‍රමය සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (G.C.E.) වෙනුවට ආදේශ කළ ජාතික සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (N.C.G.E.) හඳුන්වා දුන් අතර ඉතාමත් ඉක්මනින් එය ඉවතලන්නට වූ අතර එය හඳුන්වා දුන්නේ බොහෝ හේතු සාධක ඇතිවය.

මේ කොමිසම සමන්විත විය යුතු වන්නේ අධ්‍යයනවේදීන්, ප්‍රකට අධ්‍යාපනඥයන්, සිවිල් සමාජ නායකයන්, ආගමික නායකයන්ගෙන් විය යුතු අතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ලබා දිය යුතු වන්නේ සියලු යථාර්ථයන් ග්‍රහණය කර ගනිමින් තරුණයන් සඳහා සියලු සම්පත් උපයෝගී කරගන්නා අධ්‍යාපනයක් ඔස්සේය.

රටක් වශයෙන් අපගේ ප්‍රගතිය වේගවත් වන්නේ අපගේ අධ්‍යාපනයේ ප්‍රගතිය වේගවත් වූ තරමටය. මානව සිත අපගේ පුද්ගල සම්පතයි. අධ්‍යාපනය අපගේ සුවිශේෂී හැකියාවන් සංවර්ධනය කිරීමේ මඟක් ලෙස සලකනු ලබන්නේ අප එකිනෙකා තුළ පෞද්ගලික බලාපොරොත්තු සහ සිහිනයන් පවතින අතර ඒවා සපුරා ගැනීමේදී සැම දෙනාටම සහ අපගේ රටට මහත් ශක්තියක් හා ප්‍රතිලාභ දෙන්නක් වන්නේය.

උසස් අධ්‍යාපනය යන්න අරුත් ගැන්වීමේ දී සාමාන්‍යයෙන් එක්වනම සිහියට නැගෙනුයේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය වුවත් ප්‍රායෝගිකව සිසුන් සිය අධ්‍යාපනය ඉහළ නංවා ගැනීමේදී විශ්ව විද්‍යාල අධ්‍යාපනය විශේෂඥ අධ්‍යාපනය සහ වෘත්තියමය යන ක්ෂේත්‍රයන් කරා සිය පාසල් අධ්‍යාපනයෙන් පසු යොමුවේ.

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තළ ඉකුත් හැට වසර පුරා ඇක්වයිනස් විශ්ව විද්‍යාල විද්‍යායතනය සිය දැක්ම තුළ ඊට අනුගාමී වන්නට සමත් වී සිටීම සාඩම්බරයකි. වර්තමානයේ ඉහත දැක්වෙන ක්ෂේත්‍ර තුන පුරා තත්වයෙන් ඉහළ උසස් අධ්‍යාපන වරම් ලබා දෙන්නට සමත්ව සිටී. මෑත කාලීන සමීක්ෂණයක දී ඇක්වයිනස් විශ්ව විද්‍යාල විද්‍යායතනය මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළම ආයතන පහ අතරට එක්වීමට වරම් ලබා ඇති අතර ප්‍රමිතියෙන් ඉහළ විශ්ව විද්‍යාලයක්, විශේෂඥ අධ්‍යාපනය සහ වෘත්තීයමය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර වලින් ශ්‍රී ලංකාවේ ඉහළම තැනට ඔසොවා තිබේ.


ඇක්වයිනස් විශ්ව විද්‍යාලය වජ්‍ර ජයන්තියේ එළිපත්තට පිය නගා තිබේ. ඉකුත් 59 අවුරුද්ද පුරා දස දහස් සංඛ්‍යාත මෙරට තරුණ පරපුර උසස් අධ්‍යාපනයෙන් සන්නද්ධ කිරීමේ නොනිමි මෙහෙවරක බර දරාගෙන අපි පැමිණියෙමු. අප ඒ කටයුත්ත ඉටු නොකළේ නම් මෙරට තරුණ පරපුරට සිය උසස් අධ්‍යාපන අවස්ථා සපුරා ගන්නට දොරටු වැසී යාමට ද ඉඩ තිබිණ.

කොළඹ අගරදගුරු වසමේ ආශිර්වාදය ඇතිව ආරම්භ වූ ඇක්වයිනස් ආයතනය මේ වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමතයෙන් උපාධි පිරිනැමීමේ ආයතනයක් බවට පත්ව තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ තරුණ පරපුරේ උසස් අධ්‍යාපන බලාපොරොත්තු හා වගකීම් සපුරාලන්නට හෙට දිනයේ දී ද ඇප කැපවන අතර විදෙස් සරසවි හා අත්වැල් බැඳගෙන ඒවාට අනුබද්ධිතව කටයුතු කිරීමට ද හැකියාව තිබේ.

# දේශීය පූජක පුතුන් පුහුණුවේ ආරම්භය

දිවයිනේ ඕලන්ද පීඩනය නිම වී සුළු කලක් ගත වූ ඉක්බිති, හෙවත් ක්‍රි.ව. 1806 ජුනි 4 වැනි දා ක්‍රියාත්මක වූ තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාර තුමාගේ නියෝගය අනුව, කතෝලිකයෝ ආගමික නිදහස ලදහ. මෙ තැන් සිට ක්‍රමයෙන් දහම පිළිගැනීම මෙන් ම පිළිපැදීම ද වර්ධනය විය.

එහෙත් දහම් සේවාව සඳහා පූජක තුමන් තවදුරටත් ලබා ගත යුතු වූයේ විදේශීය රටවලින්ම ය. මේ වන විට ගෝවෙන් වැඩම කළ ඔරතෝරියාන පියවරුන් සේවාවෙහි යෙදී සිටියත් ක්‍රි.ව. 1833 සිට එම නිකාය කෙරෙහි බලපෑ පෘතුගීසි මහා රජයේ තහංචිය හේතුකොටගෙන එතුමන්ලාගේ නිකාය අහෝසි වී දහම් සේවාව ද අඩපණ විය. මේ හේතුවෙන් අප මුල් රදගුරු හිමිවරුනට සිදු වූයේ යුරෝපීය නිකායන් ගේ සරණ පතන්නට යි. මේ අනුව රෝමයේ ධර්ම වර්ධන කාර්යාංශය මැදිහත් වී පැවිදි නිකායික පියවරුන් මෙන්ම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ



**යටගිය දවස**

විශ්‍රාමික අගරදගුරු අති උතුම් **ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**152**

පූජාප්‍රසාදිවරුන් කිහිප නමක් මෙහි එව්වේ ය. ඒ අතර ඉතා උසස් සේවාවක් ඉටු කළ පියවරු ද සිටියහයි කිව යුතුයි.

මේ පියවරුන් හා නිකායන් අතර නිමල මරිය නිකායේ පියවරුන් ද දිවයිනට පැමිණියහ. ක්‍රි.ව. 1847 දිවයිනේ පා තැබූ මෙම නිකායේ පියවරු දේශීය පුතුන් පූජකවරයට පුහුණු කිරීමේ ක්‍රියා මාර්ගය ආරම්භ කළහ. මේ සම්බන්ධයෙන් පුරෝගාමීව කටයුතු කළෝ එවකට යාපනය රදගුරු වසම භාරව සිටි අති උතුම් ක්‍රිස්ටෝපර් බොන්ජින් රදගුරු හිමිපාණෝ ය.

එතුමන් ගේ පුරෝගාමීත්වයෙන් ප්‍රථම සිසු කණ්ඩායමක් සංවිධානය කරන ලද්දේ යාපනයේම ය. එකල සභා පරිපාලනය සඳහා දිවයින කොටස් දෙකකට බෙදී තිබිණි. උතුරු අනුපදවිය සහ දකුණු අනුපදවිය මේ කොටස් දෙක විය. මේ අනුව, යාපනයේ සිට උතුරු අනුපදවිය පාලනය කළෝ ක්‍රි.ව. 1868 එහි රදගුරු වශයෙන් පත් වූ අති උතුම් ක්‍රිස්ටෝපර් බොන්ජින් හිමිපාණෝ ය. එතුමෝ දිවයිනේ නි.ම. නිකායට අයත් ප්‍රථම රදගුරු හිමිපාණෝ ද වූහ.

මේ කාලයේදී ම රෝමයේ ධර්ම වර්ධන කටයුතු බාර කාර්යාංශය ද දේශීය පූජකවරුන් පුහුණු කිරීමේ වැදගත්කම ගැන මෙහි රදගුරු හිමිවරුනට නිර්දේශ කැර තිබිණි. ක්‍රි.ව. 1869 මෙම නිර්දේශය ලැබෙන විටත් බොන්ජින් රදගුරුතුමා සැලැස්මක් සූදානම් කැර තිබුණේ ය. ඒ අනුව එම වසරේ ම එතුමා තම සැලැස්ම ක්‍රියාවට නැගුවේ ය. මෙලෙස ක්‍රි.ව. 1869 දී පදවි පූජකවරුන් මෙන් ම නිමල මරිය නිකාය සඳහා ද පූජකවරුන් පුහුණු කරනු වස් දෙව්සත්හලක් අරඹන ලදි.

ක්‍රි.ව. 1874 දී මෙම දෙව්සත්හල ටුවර්ස්හි ශුද්ධවූ මාටින් තුමා ගේ දෙව්සත්හල යනුවෙන් නම් කරන ලදි. මෙය පූජක සිසු හලක් (කුඩා සෙමිනේරියක්) වශයෙන් දෙව්සත්හලක් (මහා සෙමිනේරියක්) වශයෙන් ද ක්‍රියාත්මක විය. ආරම්භයේදී මෙම දෙව්සත්හලේ සිසුහු වැඩි දෙනෙක් නි. ම. නිකායටම බැඳුණාහ.

බොන්ජින් රදගුරු හිමිපාණන් ක්‍රි.ව. 1874 ඉදිරිපත් කළ වාර්තාව අනුව සිසුහලේ සිසුන් 17 දෙනෙකු ද දෙව්සත්හලේ සිසුන් 7 දෙනෙකු ද සිටින බව වාර්තා කොට ඇත. මේ අතර පූජක දිවිය සඳහා ඇති පියවර රැසෙන් මුල් පියවර ගත් දෙදෙනකු ද සුළුවර ලද දෙදෙනෙකු ද, උප තේවාචාරවරයකු සහ තේවාචාරිවරයකු ද ඇති වග එහි සඳහන් වන්නේ ය.

ආරම්භයේ දී මෙම දෙව්සත්හල පිහිටියේ රදගුරු මැදුරේම කොටසකයි. එහෙත් 1878 දි විශාල ප්‍රමාණයේ ඉඩමක් මිලදී ගෙන එහි පැරැණි ගොඩනැගිල්ලකට ගෙන යැවිණි. එහි ප්‍රථම අධ්‍යක්‍ෂ වූයේ ගරු සී මැසියේ පියතුමා ය. එතුමා ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් ක්‍රි.ව. 1881 දී පත් කරන ලද ගරු චාල්ස් කොලින් පියතුමා 1884 දී කොළඹ අගරදගුරු පදවියට පැමිණියේ ය. මෙහි ප්‍රථම අගරදගුරු ලෙස පත්කරන ලද අති උතුම් ක්‍රිස්ටෝෆර් බොන්ජීන් හිමිපාණන් ගේ අනුනායක ලෙස කලක් ක්‍රියා කළ එතුමන් ඉනික්බිති කොළඹ සාන්ත ජෝසෆ් මහා විදුහලේ ප්‍රථම විදුහල්පති වශයෙන් ක්‍රි.ව. 1896 සිට 1910 දක්වා සේවා කළේ ය.

ක්‍රි.ව. 1884 දී දෙව්සත්හලේ පැරැණි ගොඩනැගිලි ඉවත් කර දමන ලදි. ගරු කොලින් පියතුමන් ගේ අනුප්‍රාප්තික ගරු ජේ. බී. මියරි පියතුමා ගේ දක්ෂ මෙහෙයුම යටතේ ඒ වෙනුවට ඉතා අලංකාර ගොඩනැගිලි රැසක් ඉදිකරන ලදි. ඒවායේ ඉදිකිරීම් නිම කරන ලද්දේ 1889 දී ය. මෙම ගොඩනැගිලි මෙහෙයුම් කරන ලද්දේ එවකට යාපනේ රදගුරු තැන්පත්ව සිටි පසුව කොළඹ දෙවැනි රදගුරු වශයෙන් පත්වීම් ලත් අති උතුම් ඇන්ඩෘ මෙලිසන් හිමිපාණන් විසිනි.

මෙම දෙව්සත්හලෙන් පුහුණුව ලබා පූජකවරයට ඔසවන ලද ප්‍රථමයා ගරු සවරිමුත්තු සන්ද්‍රසාගර පියතුමා ය. ක්‍රි.ව. 1842 යාපනේ උපන් එතුමා 1876 දෙසැම්බර් 29 වැනිදා පූජාත්වරය ලබා 1912 දී පරලෝ සැපත් විය. දෙව්සත්හලට ඇතුළු වීමට පෙර එතුමා කලක් ශු. ජුසේ මුනිඳුන්ගේ සහෝදර නිකාය තුළද පැවිදි පුහුණුව ලබා සිටි කෙනෙකි. නව දෙව්සත්හලේ පූර්ණ පුහුණුව ලබා පූජාත්වරයට ඔසවන ලද පියවරුන් සිව් දෙනා අතර ගරු ජෝන් පහමුනේ පියතුමා ය. එතුමා මල්වතු පාර්ශ්වයේ මහා නායක අති පූජ්‍ය පහමුනේ ශ්‍රී සරණංකර සුමංගල හිමිපාණන් ගේ සොහොයුරෙකි. පසු කලෙක මෙතුමා බොරැල්ලේ සියලු සාන්තුවරයන් ගේ දෙව්මැඳුර බාරව සිටි අතර "ඥානාර්ථ ප්‍රදීපය" සහ "ද කැතලික් මැසෙන්ජර් " පුවත්පතේ සංස්කාරක ලෙසද සේවා කළේ ය.

යථෝක්ත කරුණු අනුව දිවයින තුළ දිවයින සඳහා දේශීය පුතුන් පූජකවරයට පුහුණු කළ ප්‍රථම දෙව්සත්හල යාපනයේ සාන්ත මාර්ටින් දෙව්සත්හල යි. ඒ සඳහා පුරෝගාමීව ක්‍රියා කළෝ අති උතුම් ක්‍රිස්ටෝෆර් බොන්ජින් රදගුරු (පසුව අගරදගුරු) හිමිපාණෝ ය.

මෙ තුමා කොළඹ ප්‍රථම අගරදගුරු ලෙස පත්වීම් ලබා ක්‍රි.ව. 1883 දී පැමිණි විගස වඩාත් පුළුල් ලෙස දේශීය පූජකවරුන් පුහුණු කිරීම සඳහා සාන්ත බර්නාඩ් දෙව්සත්හල ආරම්භ කෙළේය. එතැන් සිට 1955 දක්වා කොළඹ, යාපනය, හලාවත යන රදගුරු පදවි සඳහා පූජාප්‍රසාදිවරුන් පුහුණු කරනු ලැබුවේ මෙහි ය.

# පැදි නදිය

## ප්‍රාර්ථනා

ලෝකය වැනසෙනවා
විලාප දෙති ඇතමුන්
වැනසෙන මිහිතලයට
උදා කළ හැක්කේ සහනය
දෙවිඳුන්ට පමණ බව
පවසති දැහැමියෝ

**ක්‍රිස්ටෝපර් රණසිංහ**
පන්නිපිටිය

## සන්තන්තෝනි මුනිදේ!

රුස්වුන දන ඉදිරිපිටම පෙළහර පෑවේ
තර්ක කරන හුන් අයගේ සිත් හැරවූවේ
බව්තිස්මය ලබමින් කිතු දහමට ආවේ
මුනිඳුට වැඳ සැමදෙන තුති වේවා කීවේ

එක බසකින් දේසනාව මුනිඳුන් කළ විට
විවිධ බසින් කරනා සේ ඇසුනේ සවනට
නොසෙල්වෙමින් සිටි සැමදෙන දෙසුමේ මිහිරට
සුරිඳුන් තැබුවේ ඔබෙ දිව නොදිරා යෑමට

**බර්නාඩ් බොතේජු** – වැලිකන්න - 913

## ගතක මහිම

නොදිරන සිරුරකින් කියැවෙන කතන්දරේ
නොදිරන සිතක් හා සම නැත නිරන්තරේ
මහිමය සිතක නොරැඳේ දිරනා සිරුරේ
දම් සිත වඩන විට අගයක් ඇත සිරුරේ

ගත පිරිසිදුයි එතරම් සිත පිරිසිදු ද?
සිනහව හැඩයි එතරම් හද හැඩවැඩ ද?
හදවත තුළින් එන හස කෙතරම් සුදු ද?
නො දිරන ගතක මහිමය හිමි කා හට ද?

**ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු**
තලවිල

## ජූඩ් මුනිඳුනී ඔබටයි බැතිමල්



ජීවන මහ සයුරේ
පැද යන නෞකාවේ
දළ රළ පෙළ මැද
අප දිවි හසුරන
දිවි සුක්කානම
ඔබයි ජූඩ් මුනිඳේ

බලාපොරොත්තුව
සුන්වන මොහොතක
නෙත කඳුලැලි වැගිරේ
එනමදු මැදහත් භාවය යදිනා කළ
වත හසම් ගැවසෙයි

**රෙක්සි ප්‍රැන්ක්**
බලගල

## පෙම්බර දෙව් මව්නි

වෙසක් සඳටත් වඩා පින්බර
දිලෙයි ඔබෙ ඔය මුහුණ සුන්දර
විඩාබර මා හදේ දුක්බර
නිවෙයි ආදර මව්නි පෙම්බර

**එස්. පී. වසන්ත මාලා**
කොටරුපේ

## දෙව්පියා නමදිමු

ආදර දෙව් පියෙනි ඔබ මැවූ මිහිතලය
අපහට ඇවැසි සැම දෙයකින් පිරිපුන් ය
මිනිසත් බව ලැබූ අප ඔබ හට ණයගැතිය
අදරින් සදා තුති දෙමු එක්කොට බැතිය

ජීවන හුස්ම හෙලමින් මිනිසුන් මැව්වා
හැම සම්පතින් පිරි උයනක් පිරිනැමුවා
ගුණමකු දනන් වුව සෙනෙහෙන් සැනසෙව්වා
ආදර පුතුන් ලොව ගලවන ලෙස එව්වා

**ඩොරති විජේසිංහ**
සමණබැද්ද



## මගේ ආච්චි

ගුරු සේවෙන් ඉසිඹු ලබා ගෙදරයි ඉන්නේ
පුතා කියා කරුණාවෙන් මා සනසන්නේ
දරු මුණුබුරු සැමගේ ආදරය ලබන්නේ
එයාට අප ආච්චි කියලයි අමතන්නේ

අප හැමගේ දුක සැප ඇය නිති විමසන්නේ
කවිද, කතන්දර රසවත් ලෙස පවසන්නේ
අපට දැනුම දෙන්න තමයි ඇය වෙහෙසෙන්නේ
ජේසුනි, මගෙ ආච්චි රැකදෙනු මැන නිතිනේ

**තුෂාන් සුරවීර**
මහවත්ත

## නිමල මරිය මවේ



මඩෙහි පිපී උඩට නැගී
දිළෙන සුසුදු පියුම ලෙසින්
මෙලොව දිනූ මරිය මවුන්
නිමල ගුණෙන් සුදිළුණාය

මෙලොව නමැති සයුරු තලේ
යනෙන අයට කුළුණු බරව
නියම මගට එළිය පාන
උදා තරුව ඔබය මවේ

**දළුපත පිලීෂියන්**

## ඔබේ ආදරේ

විල තුළේ මඩ දියතරින් සුවඳ නෙළුමක් නැගී දිලුනේ
කටු පිරුණු නටුවේ අගින් රෝස කුසුමක් පිපී සැලුනේ
ගල් පරේ හැපි හැපී ගලනා ගං දියේ අසිරියයි පෙනුනේ
වේදනාවේ කඳුළ තුළ දෙව් ප්‍රේමයේ අනුහසයි දැනුනේ

විදුලි කෙටිලි ගෙරවුම් නද දෙදරුවත් සිත බියක් නැත්තේ
එහැම යටවී වටන වැස්සෙන් මිහිතලේ සිසිලසයි ඇත්තේ
වියළි ගහ කොළ දළු දමයි විහඟුන් ගයයි ගී හිඳී අත්තේ
වැසෙයි ගැරහුම් ඇසෙයි ඔබගේ ආදරේ හඬ හතර පැත්තේ

**ග්‍රේස් පොන්වීර**
නාගොඩ

## මගේ පැතුම!

යුද ගිනි නිවා ඇල්වූ සාමය මෙතෙර
එය පිබිදේව හෙළයේ ජාතින් අතර
හැම දහමකම කියවෙන උපදෙස් නොහැර
පිළිපැද රකිමු හෙළයිනි සාමය නිතර

අව්වැසි දෙකම සමතුලිතව ලැබේවා
හෙළයේ ගොවියාට සෙත්සිරි ලැබේවා
වැව් බැඳි රටේ ඒ වැව් සැම පිරේවා
අපෙ රන් බිමට දෙව් ආසිරි ලැබේවා

**සිරිල් අමරතුංග**
බෝලවලාන

## ඩෙවල්

සමාවෙයං කුකුළෝ
'චිකන්' කියා උඹ කෑවට
සමාවෙයං හරකෝ
'බීෆ්' කියා උඹ කෑවට
සමාවෙයං එළුවෝ
'මටන්' කියා උඹ කෑවට
සමාවෙයං ඌරෝ
'පෝක්' කියා උඹ කෑවට

බෝඩ් එකේ උඹ හිටියට
හිනාවෙලා අපි දිහාට
උඹ කනවට - උඹ කැමතිද
දැන හිටියා හොඳ හැටි මම

**සැම්සන් පෙරේරා**
දැලතුර

## ආයාචනය

බැරිකම කරපින්නාගෙන ඉගිල්ලිලා වැලි කතරට
සිරි දෙව් දුව පලාගිහින් මැදිවී අප ගත අඳුරට
හරි නින්දක් නැත කොට්ටය පෙඟෙයි පතන පුහු සිහිනෙට
කිරි සුවඳක් නැත අම්මේ පපුව ගැහෙයි සංකාවට

ගෙලට රනින් එපා අම්මෙ බොල් මුතුපොට හොඳටම ඇති
කනට තෝඩු ඕනෑ නැත කරපිඤ්චා නැටි යහපති
අතට කදා වළලු හොඳා රනින් නැතත් දිලිසුම ඇති
ගමට එන්න ඩොලර් එපා අම්මේ ඔබ ආවොත් ඇති

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**
පින්නගොල්ල

## සිත හරවා බලන් සබඳ

සීමා මායිම් වටකොට
මන්දිර වල වසනා සඳ
දුගී මගී යාචකයන්
සිටියාදෝ පිටු දැකලා

අගනා සළු පිළි පළඳා
සැප රියකින් බසිනා සඳ
ගත වැරැහැලි දැවටුවත්
බැලුවදෝ ඇස රවලා

තවමත් නැත පමාවෙලා
සිත හරවා බලන් සබඳ
සැමදේ මෙහි තනිකරලා
නොයාවිදෝ ලොව හැරලා

**පද්මා ප්‍රනාන්දු**
දුම්මලදෙනිය

## අපි දරුවෝ

නිමල මරිය මෑණියේ
සවන් යොමා....
අපේ සුසුම්.......
සරණේ වෙනු මෑණියේ
සමාව දී.....
පාපි අපට.....
නිබඳ සරණේ......
මෑණියේ
ඔබයි අපේ මව
අපි දරුවෝ ඔබේ
නිමල මරිය
රැජිණියේ

**ශිරෝමි නිර්මලා**
දළුගම

## තුන්පත් කඳුළු රතු පස්වල

ආසියාවේ ආශ්චර්ය සමත් පිංබර දිවයිනේ
කඳුළු බිඳු නෙත් ගෑවුන දින උදා වුනා....
වෙඩි හඬින් මරලතෝනි මැද අසරණ සිත් ගැස්සුනා.....
වැලිවේරිය රතු පස්වල ලේ බිඳු මුසුවුනා......
මෙය දුටු හිරු මඬ සිහිසුන්ව වැලපුනා

රවිශාන් අකිල සහ තරුණ ජීවිතයක් අහිමි විණ
තිස් ගණනක් රෝහල වෙත පිය නැගුන
පූජනීය පුදබිමටත් ගිනි බිඳුමට
තුන්පත් කඳුළු දැක තව හදවත් වැළපෙන....

**ආර්. ජෝශප් ප්‍රිය**
කොටිකාවත්ත



## අමරණීය රුක්මණී

හෙළසිනමාවේ මුල්නිළි රුක්මණී දේවී
හෙළ සංගීතේ රසකළ ග මිහිරාවී
සමුගෙන අපෙන් තිස්පස් වසරක් වේවී
එනමුදු නාමේ අමරයි රුක්මණී දේවී

ආවත් නොයෙක් නිළියන් ඔබගෙන් පසුව
නැකිසි කෙනෙක් සිටිනුයේ දිගු නෙත් සතුව
ගයමින් ගීත නැටුමෙන් රංගන පැව
නැත පිරවුනේ තවමත් ඔබගේ අඩුව

**ලක්ෂමන් රණසිංහ**
හේකිත්ත

## නූපන් අපට

දරුවන් එපා උන් එන මඟ අහුරන්නේ
ඉහළින් තිළිණ සම්මාන ලැබ ගන්නේ
දවසින් දවස ජාතිය වඳ වී යන්නේ
පින්කෙත අපේ ටික ටික වල් බිහි වෙන්නේ

සුරතල් අපේ සුරතල් විස වුනාදෝ
රුපියල් ගණනකට අප බිලි කෙරේදෝ
ලක්බිම වටා පාලන වැට බැඳේදෝ
නූපන් අපට උපදින්නට ලැබේදෝ

**නුගපේ බී. සී. රුද්‍රිගු**

## දිවි ගමනේ සැමරුම්

පස් දරු සම්පතින් මගෙ නිවහන පිරුණා
නැණ ගුණ දහම් ගුණ වරුණෙන් උන් වැඩුණා
ශිල්පසත දෙවා හරි මග සැම යැවුණා
බලා එදෙස තුටු කඳුලින් නෙත් පිරුණා

මා නොලද කිරුළ දරුවන් හට ලැබ දෙන්ට
දිව රෑ වෙහෙසුනෙමි ලැබගත්තෙමි ඒ සතුට
දෙවිඳුනි සදා ඔබ මා අත් නොහරින බව
ගතවුන මේ දිවි පුරාවට දැනුනි මට


**ඩ. ක්ලොටිල්ඩා දොන්දිනු ජෑන්ස්**

## දෙවිඳුන්ගේ තිළිණය


ප්‍රැන්සිස් නම දරණ සුදොතුම් පියෙනි ගරු
ජේසුගෙ දහම ඔබ ලොවටම කරයි සරු
අසරණයින් ගැන නිතරම සිතන ගුරු
ඔබහට පිදේ මල් පොකුරක් අපෙන් මරු

දවස් දෙසීයයි ඔබ අපෙ එඬේරා
එනමුත් ඔබ ගත්තා අප සිත් සැමැ දුරා
සියලු දෙනාගේ හදවත් යයි උතුරා
දෙවියෝ රැක දේවා අපෙ සුදු එඬේරා

**අයිරින් කොස්තා**
කළුඑළිය



# දික්කසාද වී යළි විවාහ වන්නන්ට සත්ප්‍රසාද ලැබීමේ තහනම ස්ථිරයි



දික්කසාදයෙන් පසුව, යළි විවාහ වන්නාවූ කතෝලිකයන්ට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ තහනම ස්ථිර කරනු ලැබ ඇතැයි වතිකාන පුවත් විසින් වාර්තා කරයි.

මෙම තහනම පිළිබඳව සවිස්තර විග්‍රහයක්, ශුද්ධාසන උගැන්වීම් භාර කාර්යාලයේ ප්‍රධානි අගරදගුරු ගර්හාර් මුළුලර් විසින් වතිකාන පුවත් පතෙහි පළ කොට ඇත. කතෝලික සභාව විසින්, විවාහයක් අවලංගු කැරෙන අවස්ථාවකදී නම්, අදාල පාර්ශවයන්ට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත හැකි යයි ද දක්වා ඇත. එසේ වුවද දික්කසාදයෙන් පසුව, යළි විවාහ වන්නාවූ අයවලුන්ගේ අසීරුතාවයන් හිදි ඔවුන් හට යෝග්‍ය ආධාර උපකාර කිරීම යුතුකම යයි ද පෙන්වා දී ඇත.

දික්කසාද වී යළි විවාහයට පත්ව ඇති දියුණු රටවලැ ජීවත්වන කතෝලික පාර්ශවයන්ගේ ජීවිත ගැටලු හා ප්‍රශ්න උග්‍ර වෙමින් පවතී. එම රටවල් අතුරෙන්, යළි විවාහ වී ඇති ජර්මානු ජාතික කතෝලික යුවළගේ ගැටලු අතිශය උග්‍ර තත්ත්වයන්ට පත්ව ඇත. එරටේ කතෝලික සභාවේ ඇතැම් පදවි විසින් එවැන්නන් හට යම් සහනයක් දීම සඳහා අවසරය ඉල්ලා ඇතත් ශුද්ධාසනය විසින් එවන් ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. විවාහයක් අවලංගු කළ නොහැකි යයි කතෝලික සභාවේ පොදු නියමය වේ. සභාව විසින් විමර්ෂණයට ලක් කරනු ලබන හේතු කාරකයන් මත නිර්නය කරනු ලැබීමේදී පමණක්, සුවිශේෂ හේතූන් මත විවාහයන් අවලංගු කිරීමේ බලය කතෝලික සභාව විසින් ක්‍රියාත්මක කැරෙනා බැව් පුවත්පත් හෙළි දැක්වීම මගින් පෙන්වා දී ඇත.

# කතෝලික හා ජුදා සම්බන්ධතා කමිටු රැස්වීම



ජාත්‍යන්තර කතෝලික හා ජුදා සම්බන්ධතා කමිටුව 22 වෙනි වතාවට ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවරදී ඔක්තෝබර් මස 13-16 දිනයන් හිදි පැවැත්විණි. එම සභා වාරයට සත්කාරකත්වය ලබා දුන්නේ, ස්පාඤ්ඤයේ රදගුරු සමුළුව හා ජුදා නායක නියෝජිතයෝය. මෙම සැසිවාරයේ මුඛ්‍ය තේමාව වුයේ "තත්කාලීන සමාජයේ ආගමික අභියෝග" යන්නයි.

එම අභියෝගයන් විග්‍රහයට පාත්‍ර කරනු ලැබුවේ, සමාජීය, දේශපාලන, සංස්කෘතික, ආගමික වාතාවරණයන් හමුවේ, සිය ආගමික, උගැන්වීම් හා සංස්කෘතීන් කෙළෙස ක්‍රියාවට නංවන්නේ දැයි සාකච්ඡාවට පාත්‍ර කරවමිනි.

ඉතිහාසය පුරා මිනිස් පවුල සමග දෙවි මහෝත්තමයාණන්ගේ සම්බන්ධතාවය පිළිබඳ බයිබලීය සාක්ෂියේ දායාදය කිතුනුවන් හා ජුදා ජාතිකයන් විසින් බෙදා ගන්නා බැව් සනාථ කරගන්නා ලදි. එමෙන්මැ ලොව පුරා ආගමික නිදහස දෙපාර්ශවයන් විසින්මැ පිළිගනිමින් ප්‍රකාශ කරනා බැව් සනාථ කරනු ලැබීය. තවද මැදපෙරදිග රටවලැ මෙන්මැ ලෝකය පුරා ජීවත්වන සුළුතර කිතුනුවන්ට කැරෙන තාඩන පීඩන හෙළා දකිනා බවටත් ඔවුන්ගේ කිතුනු අයිතීන් රැකුමට සක්‍රීය වන බවටත් එකඟත්වය ප්‍රකාශ කරනු ලැබීය. මෙම ජාත්‍යන්තර කමිටුව විසින් කතෝලික හා ජුදා පූජකවරය සඳහා සූදානම් වන්නන් හට ආගම් ද්වය පිළිබඳ අධ්‍යයනය ලබාදීම යෙහෙකි යයි ද නිර්දේශ කරනු ලැබීය. තවද ලෝපුරා පවත්නා දිළිඳු භාවය ද අයුක්තිය ද, අසාධාරණය ද,තුරන් කිරිම සඳහා සක්‍රීය ක්‍රියා මාර්ගයන් එකාවන්ව ගැනීමට ද දෙපාර්ශවය විසින් තීරණයන් ගනු ලැබූ බැව් කිතුනු පුවත් වාර්තා කරයි.

# මවගේ ඉල්ලීමෙන් සුවිසල් කුරුසියක් තැනේ



චිලී දේශයේ අයුකෝ නගරයේ අන්ඩේස් හී සාන්ත තෙරේසා තුමියගේ සිද්ධස්ථාන පිහිටි මිටියාවතේ අඩි 39 ක් උසැති කුරුසියක් ගොඩනැගීම ඔක්තෝබර් මස 19 වෙනිදා ආරම්භ විය.

මෙම කුරුසිය චිලී දේශයේ දූත මෙහෙවරේ ප්‍රකාශනයක් ලෙසින් ද හඳුන්වනු ලබයි. අයුකෝ නගරයේ ජීවත් වූ ජුලියා මොන්ටෙනේග්‍රෝ නම් වූ මවගේ ඉල්ලීම පරිදි ඇගේ පුතා විසින් මෙම ශුද්ධ වූ කුරුසිය ගොඩ නැගේ. ජීවිතය පුරා ඈ කිතු සමිඳුන් වෙත දැක්වූ ආදරය සංකේත කරවීම සඳහා මෙම කුරුසිය නිර්මාණය කොට මිටියාවතේ පිහිටුවාලිය යුතු යයි මවගේ ඉල්ලීම වී ඇත. එසේ මිටියාවෙතේ ඉදිකැරෙන එම කුරුසය ඈතට ඈතට දිස් වන විට, බොහෝදෙනාගේ හදවත් ක්‍රිස්තුන් වහන්සේගේ දයා ප්‍රේමයෙන් පිරී යනු ඇතැයි බොහෝ කතෝලිකයෝ පවසත්. කුරුසිය පිහිටුවාලීමේ සියලු කටයුතු ඉදිරි මාස කීපය තුළදී නිමකොට 2014 පාස්කු සමයේදී එය ආසිරි ගන්වනු ඇතැයි ජුලියාගේ පුත් මරියානෝ ගන්ඩමේස් විසින් මාධ්‍ය වෙත පවසා ඇත.

චිලී දේශයේ කතෝලික පළාත් නියෝජනය කරමින් කුරුස 27 කින් යුත් යෞවනයන්ගේ පෙරහරක් වර්ෂ 2012 දී ආරම්භ කොට ඇත. මෙම දැවැන්ත කුරුසිය ද චිලී තරුණ තරුණියන්ගේ ඇදහිල්ලේ වර්ධනයට උපකාර වනු ඇතැයි ද වාර්තා වේ. උස අඩි 39 ක් වන මෙම සුවිසල් කුරුසිය චිලී රටේ පාරම්පරික දැව යොදාගෙන නිර්මාණය කරනු ලබයි. තවද චිලී හී සියලු කතෝලික පදවි බැතිමතුන් විසින් මෙම කුරුසිය තැනීමේ කාර්යයට විවිධාකාරයෙන් සහයෝගය දෙනු ලබන බැව් ප්‍රත්‍යක්ෂ වී ඇත.

# බ්‍රසීලයේ සමලිංගික විවාහයන් නොපිළිගැන්මට සභාවට නීති අවසර



සමලිංගික විවාහයන් නොපිළිගැනීමේ නීතිමය අයිතිය කතෝලික සභාවට ඇතැයි බ්‍රසීලයේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඇත.

වර්ෂ 2004 සිට සමලිංගික සම්බන්ධතාවයන් බ්‍රසීලයේ ඒ ඒ සමාජ කොට්ඨාශයන් විසින් යම් පිළිගැන්මකට පාත්‍රවි තිබුණත් එය නීති ගතකැරුණේ, මේ වසරේ මුල් භාගයේදීය. එසේ වුවද බ්‍රසීලයේ දේශපාලන පක්ෂයක් වන 'සමාජ කිතුනු පක්ෂය" විසින් ගෙනෙන ලද යෝජනාවක් අනුව කතෝලික උගැන්වීම් හා ඇදැහිල්ල මත සමලිංගික විවාහයන් ඒ ඒ අවස්ථාවන්හිදී පූජකවරුන් විසින් පිළිනොගෙන කටයුතු කිරීම නිසා ඔවුන්ට මහත්සේ හිරිහැර විඳින්නට සිදුවූ අවස්ථාවන් බොහෝය.

එහෙත් බ්‍රසීලයේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව විසින් දෙන ලද තීන්දුව අනුව, සමලිංගික විවාහයන් ආගමික වශයෙන් පිළිගැන්මට කතෝලික සභාව වෙත බලකිරීම් කළ නොහැකි බැව් දැන් තහවුරු වී ඇත.

එහෙත් මෙම නීතිමය තත්ත්වය ඇතැම් ජන කොටස් වලැ කෝපයට පාත්‍ර වී ඇත. එසේ වුවද කතෝලික සභාවේ අදාළ අයිතිය තවදුරටත් සහතික කැරෙන අන්දමේ පනතක් මගින් මහජන නියෝජිත බහුතර කැමැත්ත ලබාගත යුතු යයි ද ජනතාවගෙන් ඉල්ලීමක් ඉදිරිපත් වී ඇත.

# කෙන්යාවේ කිතුනු පූජකවරුන් දෙදෙනෙක් මරා දැමේ

කෙන්යාවේ මුහුදු කරයේ මොම්බසා හී ස්ථාන දෙකකදී ප්‍රොතෙස්තන්ත පැවිදිවරු දෙදෙනෙකු ඔක්තෝබර් මස 19 වෙනිදා ඝාතන කරති බැව් වාර්තා වේ.

දැනට සති දෙකකට ඉහතදී ද එම ප්‍රදේශයේමැ ඉස්ලාම් නායකයකු ද මරා දමා තිබුනි. චාර්ලස් මාඩෝල් නම් එම පූජකවරයා බයිබලය අතැතිව පුටුවක වාඩි වී සිටියදී වෙඩි තබා ඇති බැව් ඉරිදා මෙහෙයට පැමිණි බැතිමතුන් විසින් සියැසින් දැක ඇත.

වෙඩි තැබීමෙන් හිසෙන් ගලා ගිය රුධිරයෙන් මුළු ශරීරය වැසී ගොස් තිබිණි. ඝාතකයන් විසින් කිසිදු දෙයක් සොරගෙන ගොස් නැතැයි ද වාර්තා වේ.

තවද මොම්බසා නගරයට කිලෝමීටර් 60 කට ඈතින් පිහිටි ප්‍රොතෙස්තන්ත දෙව් මැඳුරක පූජකවරයා ද එදිනම ඝාතනය කොට පඳුරක දමා පැන ගොස් ඇත. මැදි වයසේ වූ ඉබ්‍රාහිම් කිදානා නම් එම පූජකවරයා පැවැදිවරය ලබා ඇත්තේ දැනට සති කීපයකට ඉහතදීය.

ඔහු ඝාතනය කරනු ලැබූ ත්‍රස්තයන් විසින් ඔහුගේ මෝටර් සයිකලය ද රැගෙන ගොස් ඇත. මෙම ඝාතන පිළිබඳ ආරංචි පැතිර යාමත් සමගමැ පළාත සසළ වී ඇත. එහෙත් පොලිස් නිළධාරින් විසින් කිසිදු කෙනෙකු තවම අත්අඩංගුවට ගෙන නොමැති යයි ද වාර්තා වේ.

# කිතුනු විවාහ මංගල්‍යය ලේ විලකට හැරේ

ඊජිප්තුවේ කයිරෝ හිදි, ඔක්තෝබර් මස 18 වෙනිදා සවස් භාගයේ මංගල ඇඳුමෙන් සැරැසුනු පිරිසක් කන්‍යා මාතා දෙව් මැඳුරු පරිසරයේ මනමාල මහතා සමගින් රැඳී සිටියේ මනාලියගේ පැමිණීම බලාපොරොත්තුවෙන්ය. එම පිරිස සිනහ මුහුණින් කථා බයෙහි යෙදී සිටිද්දි නිමේෂයකින් මුහුණු වසා ගත් දෙදෙනෙක් මෝටර් සයිකලයකින් සෙනඟ අතරට කඩා වැදුණෝය.

ගතවූයේ මොහොතකි. ත්‍රස්තයෝ දෙදෙනා ස්වයංක්‍රීය තුවක්කු දෙකකින් පිරිස ඉලක්ක කොට වෙඩි තබන්නට පටන් ගත්හ. වෙඩි හඬක් සමග මංගල පූජක ඇඳුමෙන් සැරසී සිටි යොයිරිස් බොන්රා නම් පියතුමා එතැනට දුව ආයේය. "මිනිසුන් ද, ගැහැනුන් ද. දරු දැරියන් ද රුධිරයෙහි පිනනවා මා දුටුවා." එලෙසින් එතුමා ප්‍රකාශ කළේය. අවුරුදු 8 ක් වයසැති ගැහැනු දරුවෙක් ද තවත් තිදෙනෙක් ද එතැනම මැරී සිටියහ. තවත් 17 දෙනෙකු මාරාන්තික තුවාල ලබා ඇතැයි ද රෝහල් මාර්ග වාර්තා කරයි. සාමාන්‍ය තුවාල ලබා භීතියට පත් තවත් පිරිසක් රෝහල් ගතව සිටිති. මනාල යුවල ශාරීරික හානි අත්නොදුටුවත් එම ශෝක ජනක අත්දැකීම ජීවිතය පුරා ඔවුන්ට අමතක කළ නොහැකි යයි වෛද්‍යවරුන් විසින් ද ප්‍රකාශ කොට ඇත. සතරදෙනාගේ භූමදාන අවස්ථාවට දහස් සංඛ්‍යාත පිරිසක් සහභාගි වූහ. "අපි රුධිර පූජාවෙන් වුවද, ඇදැහිල්ල සුරකින්නෙමු" යනුවෙන් කිතුනු ජනතාව කෑ මොර දුන්හ.

ජනාධිපති මොහොමද් මුර්ෂි බලයෙන් පහ කිරීම සඳහා කිතුනු සහයෝගය මිලිටරි කණ්ඩාම් වලට ලබාදීම සඳහා මුස්ලිම් සහෝදරත්වයේ කණ්ඩායම් විසින් කිතුනුවන්ට නිරන්තරයෙන් පහරදෙනු ලබන බැව් ද වාර්තා වේ. මෙම මංගල අවස්ථාවේදී එල්ල කරනු ලැබූ පහරදීම් මේ වසරේ අගෝස්තු මාසයේදී කරනු ලැබූ දැවැන්ත විනාශය තවදුරටත් ඉදිරියට ගෙන යන්නක් යයි ද ජාත්‍යන්තර පුවත් විසින් වාර්තා කරයි. අගෝස්තු මස කැරුණු පහරදීමේදී දෙව් මැඳුරු 50 ක් ද කිතුනු ආයතන 200 ක් පමණද විනාශ කරන ලදි. බොහෝ කිතුනුවන්ගේ චංචල හා නිශ්චළ දේපළ ද විනාශ කරනු ලැබීය. 30 කට වැඩි සංඛ්‍යාවක් ද ඝාතනය කරනු ලැබීය.

# කාදිනල් ග්‍රාසියාස් හා සෝනියා ගාන්ධි සුවිශේෂි හමුවීමක්

ඉන්දියාවේ බොම්බායෙ හී අගරදගුරු මෙන්මැ එරටේ රදගුරු සම්මේලනයේ සභාපති ඔස්වල්ඩ් ග්‍රාසියාස් හා එක්සත් සමාජවාදි සංධානයේ සභාපති සෝනියා ගාන්ධි අතර අති සුවිශේෂි සාකච්ඡාවක් ඔක්තෝබර් මස 16 වැනිදා පැවැත්විණි.

එම සාකච්ඡාවේ අරමුණ වූයේ අනුග්‍රහයන් ඉල්ලා සිටීම නොව සමාජ සාධාරණය සියල්ලන් වෙත එකාකාරව ලබාගැන්ම අරමුණ වී යයි කාදිනල් තුමා විසින් මාධ්‍යය වෙත ප්‍රකාශ කරනු ලැබීය. සෝනියා ගාන්ධි මහත්මිය ද සාකච්ඡාවට අවතීර්ණ වෙමින් පවසා ඇත්තේ, ඉන්දීය කතෝලික සභාව විසින් පොදු සමාජ අභිවර්ධනය සඳහා ක්‍රියාත්මක කැරෙන සියලු සේවාවන් වෙනුවෙන් මහත් සේ තුති පුද දෙනු ලබන බවයි.

කාදිනල් තුමා විසින් අවධාරණය කරනු ලැබුවේ, සුළුතර ජන කොටස් වලැ ආගමික හා මිනිස් අයිතිවාසිකම් තහවුරු කැරෙන පරිදි කාලෝචිත පියවර ගැන්ම සිදුවිය යුක්තක් බවයි. ඉන්දීය ව්‍යවස්ථාව විසින් සනාථ කරති පරිදි ඉන්දීය කිතුනුවන්ගේ ආගමික නිදහස භුක්ති විඳීමේ අයිතිය සුරැකීම සඳහා සියලු පියවර ගතයුතු යයි ද ඉල්ලා සිටිනු ලැබීය. ඉන්දියාවේ ඒ ඒ ප්‍රදේශයන් හී සිදුවන කිතුනු පීඩාවන් ඉලක්ක කොට අදහස් ප්‍රකාශ නොකැරුණත් ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදි දේශය වන ඉන්දියාව තුළ කිතුනුවන්ගේ සමාජ සමානාත්මභාවය සුරැකීම සමස්ථ කිතුනු ජනතාව විසින් බලාපොරොත්තු වන බැව් ද කාදිනල් තුමා අවධාරණය කළ සේක.

අඩු ආදායම් ලාභි මිලියන 800 ක් පමණ වූ දිළිඳු ජනතාවන්ට අඩු මිලැති ආහාර පානාදීය ලබාදීමේ සක්‍රීය ක්‍රියාදාමයක් රජය විසින් ඉදිරිපත් කිරිම කෙරෙහි, ඉන්දීය කතෝලික ජනතාවගේ ප්‍රණාමය රජය වෙත පිරි නමනා බැව් ද කාදිනල් තුමා විසින් ප්‍රකාශ කරනු ලැබීය. සෝනියා ගාන්ධි මහත්මිය විසින් ද තවදුරටත් පවසනු ලැබුවේ වසර සිය ගණනක් මුළුල්ලේ කිසිදු ආගම් හා කුල බේදයන් නොතකා ජනතාවන් නගාලීම සඳහා කටයුතු කරති ආකාරයෙන් කිතුනුවන්ගේ නිදහස් පැවැත්ම දේශය තුළ තහවුරු කරවාලීම සඳහා පියවර ගන්නා බැව් ගාන්ධි මහත්මිය විසින් ද තහවුරු කරන ලදී. කාදිනල් තුමා විසින් දැක්වූ අදහස් අනුව කිතුනු ආගමික නිදහස තහවුරු කරවීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීමට පසුබට නොවන බැව් සෝනියා ගාන්ධි විසින් තහවුරු කරන ලදි. ඉන්දීය ජනතාවගෙන් 2.5% වන කිතුනු ජනතාවගේ සුවිශේෂි සහාය දේශයේ උන්නතිය සඳහා කතෝලිකයන් විසින් තවදුරටත් ලබාදෙන බැව් කාදිනල් තුමෝ අවධාරණය කළ සේක. තවද දේශයේ අනෙක් දේශපාලන පක්ෂ නායකයන් සමග ද එබඳු සාකච්ඡාවන් කැරුමට බලාපොරොත්තු වන බැව් ද කාදිනල් තුමා පැවැසූ සේක.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

# බයිබල් දැනුම මිනුම - 2013 ජාතික තරගාවලිය

**ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට දීප ව්‍යාප්ත වාචික ශු. බයිබල් දැනුම මිනුම තරගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සැප්තැම්බර් මස 28 සෙනසුරාදා දිනයේ කොළඹ, මරදාන සා. ජෝශප් විදුහලේ දී පවත්වන ලදි.**

එහිදී ජයග්‍රහණය ලැබූ කණ්ඩායමේ මෙන්ම ඉහළම ලකුණු ලබාගත් සිසුන් සඳහා රන් පදක්කම්, සිහිවටන හා සහතික පත් බෙදා දීමේ ත්‍යාග ප්‍රදානෝත්සවය ඉතා උත්කර්ෂවත් අයුරින් ඔක්තෝබර් 12 දින පස්වරුවේ පැවැත්විණි.

එහි ප්‍රධාන අමුත්තා වූයේ අග්‍රාමාත්‍ය හා බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය දි. මු. ජයරත්න මැතිතුමා වූ අතර අනෙකුත් සම්භාවනීය අමුත්තන් අතර ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් ද , කොළඹ විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් ද, කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන් ද, කතෝලික ජාතික ධර්මෝපදේශ හා බයිබල් දූත සේවා අධ්‍යක්ෂ ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමන් ද කොළඹ කතෝලික පාසල් සම්බන්ධ අධ්‍යක්ෂ ගරු රංජිත් මදුරාවල පියතුමන්, සා. ජෝශප් විදුහලේ අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ හා සා. ජෝශප් විදුහලේ අනෙකුත් පියතුමන් ද, අනෙකුත් ක්‍රිස්තියානි සභාවල දේවගැති තුමන් ද, ගරු සහෝදර තුමන් හා පැවිදි සොයුරියන් ද කිතුනු නොවන අන්‍යාගමික පූජක තුමන් ද බුද්ධ ශාසන හා ආගමික කටයුතු ගරු නියෝජ්‍ය ඇමතිතුමන්, අනෙකුත් කිතුනු කැබිනට් අමාත්‍යවරුන් හා නියෝජ්‍ය ඇමතිවරුන් විදුහල්පතිවරුන්, ජොසපියානු බයිබල් අධ්‍යයන සංගමයේ සාමාජිකයන් ද වූහ.

රන් පදක්කම් 15 ක් ලබා ගත් දරු දැරියන් විවිධ පදවි වලට අයත් වූහ. කණ්ඩායම් ප්‍රතිඵල පහත සඳහන් ආකාරයෙන් විය.

**කණිෂ්ඨ අංශය - සිංහල මාධ්‍යය**
1. ශා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07. - පළමු ස්ථානය
2. ශු. පවුලේ කන්‍යාරාමය, කළුතර - දෙවන ස්ථානය
3. ශු. පවුලේ කන්‍යාරාමය, බම්බලපිටිය - තෙවන ස්ථානය

**කණිෂ්ඨ අංශය - දෙමළ මාධ්‍යය**
1. සා. මරියා දහම් පාසල, නාවලපිටිය - පළමු ස්ථානය
2. සිරි කුරුස දහම් පාසල, හැටන් - දෙවන ස්ථානය
3. සා. ලූර්දු මාතා දහම් පාසල, ත්‍රිකුණාමලය - තෙවන ස්ථානය

**කණිෂ්ඨ අංශය - ඉංග්‍රීසි මාධ්‍යය**
1. සා. ජෝශප් විදුහල, කොළඹ 10. - පළමු ස්ථානය
2. යහපත් එඬේරා කන්‍යාරාමය, කොළඹ 13 - දෙවන ස්ථානය
3. බාලිකා විදුහල, දංකොටුව - තෙවන ස්ථානය

**මධ්‍යම අංශය - සිංහල මාධ්‍යය**
1. සා. මරියා දහම් පාසල, නාවලපිටිය - පළමු ස්ථානය
2. සුරදූතික බාලිකා විදුහල, කුරුණෑගල - දෙවන ස්ථානය
3. ශ්‍රී හෘදය දහම් පාසල, කටුගස්තොට - තෙවන ස්ථානය

**මධ්‍යම අංශය - දෙමළ මාධ්‍යය**
1. ශු. පවුලේ කන්‍යාරාමය, යාපනය - පළමු ස්ථානය
2. සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07 - දෙවන ස්ථානය
3. සිරිකුරුස දහම් පාසල, හැටන් - දෙවන ස්ථානය

**මධ්‍යම අංශය - ඉංග්‍රීසි මාධ්‍යය**
1. බාලිකා විදුහල, දංකොටුව - පළමු ස්ථානය
2. ශු. පවුලේ කන්‍යාරාමය, කොළඹ 04 - දෙවන ස්ථානය
3. යහපත් එඬේරාගේ කන්‍යාරාමය, කොටහේන - තෙවන ස්ථානය




**ජ්‍යෙෂ්ඨ අංශය - සිංහල මාධ්‍යය**
1. සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 7 - පළමු ස්ථානය
2. සුරදූතික බාලිකා විදුහල, කුරුණෑගල - දෙවන ස්ථානය
3. සා. සේවියර් විදුහල, මාරවිල - දෙවන ස්ථානය

**ජ්‍යෙෂ්ඨ අංශය - දෙමළ මාධ්‍යය**
1. ශු. පවුලේ කන්‍යාරාමය, යාපනය - පළමු ස්ථානය
2. යහපත් එඬේරාගේ කන්‍යාරාමය, කොළඹ 13 - දෙවන ස්ථානය
3. ශු. පවුලේ කන්‍යාරාමය, කොළඹ 04 - දෙවන ස්ථානය

**ජ්‍යෙෂ්ඨ අංශය - ඉංග්‍රීසි මාධ්‍යය**
1. ශු. පවුලේ කන්‍යාරාමය, කොළඹ 04 - පළමු ස්ථානය
2. සා. ජෝශප් විදුහල, කොළඹ 10 - දෙවන ස්ථානය

මෙතෙක් කොළඹ අගරදගුරු පදවියට පමණක් සීමා වී සංවිධානය වූ මෙම බයිබල් දැනුම මිනුම වාචික තරගය මෙවර මෙසේ කොළඹ සා. ජෝශප් විද්‍යාලයේ බයිබල් අධ්‍යයන කවය, ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ වීමේ ප්‍රතිඵලයක් ලෙස දීප ව්‍යාප්ත බයිබල් දැනුම මිනුම තරගයක් ලෙස සංවිධානය කරන්නට හැකි වීම, කොළඹ සා. ජෝශප් විද්‍යාලීය බයිබල් අධ්‍යයන කවය ලැබූ මහත් ජයග්‍රහණයකි. එහි නියමුවාණන් වන අදියුරු පියතුමන් ද, උප අදියුරු ගරු ගැමුණු ඩයස් පියතුමන් ද සංගමය භාරව කටයුතු කරන ගරු ප්‍රගීත් දිශාන් පියතුමන් ද, ගරු එම්. සදානි පැවිදි සොයුරිය ද, ක්ලෙමන්ට් රුබේරු ගුරු මහතා ද, ඉවෙන්ඩා බොතේජු, ශ්‍යාමලින් පෙරේරා, ජසින්තා ජගනේෂන්, කැමිල්ටා පෙරේරා, මේනකා පෙරේරා, රවී ෆොන්සේකා, අජිත් ඩෙප්, නිර්මලී පෙරේරා ගුරු මහත්ම මහත්මීන්ගේ නොමසුරු දායකත්වය එහි සාර්ථකත්වයට ඉවහල් වුණි.

සංගමයේ නිලධාරි මණ්ඩලයේ ශිෂ්‍යයන් වන ශ්‍රී වින්ද ජයවර්ධන, දුලින්ද පෙරේරා, ශංක, රනිඳු, සමීර, ලක්ෂිත, කවිඳු, දිල්ශාන්, දිලංක යන අයගේ කැපවීම ද අපි අගය කරමු.

**ජොසපියානු බයිබල් අධ්‍යයන කවය**


## ප්‍රදීපයේ ගමන් මඟට වික්ටර් රත්නායකයන්ගෙන් පැසසුම්!



**කලාවත් සැබෑ කලාකරුවාත් අගයමින් දේශීය චින්තනය මුල්කොටගත් සැබෑ පුවත්පත් කලාවකට මඟ පාදමින් ඥානාර්ථ ප්‍රදීපය ගන්නාවූ යහපත් ගමන් මාර්ගයට තමන් සුබ පතන බවත් ඒ පිළිබඳව මහත් විශ්වාසයක් තමන් තුළ ජනිත වූ බවත් සංගීත් නිපුන් ආචාර්ය වික්ටර් රත්නායකයන් පවසයි.**

2013 අගෝස්තු මස 25 දින ඥානාර්ථ ප්‍රදීපයහි පළවූ “ලාංකීය සංගීත වංශ කථාවේ උත්තම ගාන්ධර්වයා” නම් ප්‍රදීපය කර්තෘ පියතුමන් ලියූ කර්තෘ සටහන පිළිබඳව සිය අදහස් පළ කරමින් වික්ටර් රත්නායකයන් පැවසුවේ ප්‍රදීපය හා කෙටි පිළිසඳරකට එක්වෙමිනි. මෙහිදී එතුමන් වැඩි දුරටත් පවසා සිටියේ හරවත් දේ වටිනා දේ යටපත් වෙමින් විකෘති වූ දේ මතුව එහි සමාජයක් තුළ සිරිලක පළවන ඉපැරණි පුවත්පතින් යථාර්ථය ඉස්මතු කොට පෙන්වීම පිණිස ගත් උත්සාහය තමන් බෙහෙවින් අගය කරන බවය.

**ප්‍රියන්ත පීටර්ස් විසිනි**



## පැලේ කවිය

කියන්නට පළමු නොසිතන එක — වැරදී
නොසිතා කියන දේ පසුවට ගිනි — පරිදී
රට - දැය නසා ඇවිලෙන විට කෑ මොර — දී
කුමටද පලේ කට රැකගනු ඉහ මොළ — දී

සිය කට නිසා නැසුනේ එක — මාළුවෙකි
එනමුදු මෝඩකම රටටමැ මරු — වැලකි
ලොවටමැ එළිය සැනසුම සංවර — දිවකි
තම කට වටා වැට බැඳ ගැනුමද — හොඳකි

රාළ මීගමුවේ

## අපේ දරුවා විශිෂ්ටයෙක් කරමු

**පසුගිය සතියෙන්....**

ඔබගේ නිවසට මාසිකව ලැබෙන ආදායම වියදම් කරන්නේ කෙසේද කියා ඔබ දන්නවාද? සමහර අවස්ථාවලදී අපගේ මාසික ආදායම වියදම් වන්නේ කෙසේද කියා අපිටම අවබෝධයක් නැහැ. මේ නිසා අපට බොහෝ අවස්ථාවලදී ජීවත් වන්නට සිදුවන්නේ ණය කාරයෝ ලෙසයි.

### අවශ්‍ය දේ පමණක් දෙමු

බොහෝ දෙමාපියන් දරුවන්ගේ සිත් සනසවන්න සහ ඔවුන්ගේ සිත් දිනා ගන්න දරුවන් ඉල්ලන සෑම දෙයක්ම ඔවුන්ට ලබා දීමට උත්සාහ කරනවා. ඔබ එය කිසිම වග විභාගයක් නැතිව ලබා දෙනවා. ළමුන්ගේ සිත් රිදෙයි කියල ඔබ බයවෙනවා. මේ නිසා සිදුවන්නේ දරුවන් හැමදෙයක්ම ඔබෙන් ඉල්ලීමට පුරුදු වීමයි. එහෙත් එක් අවස්ථාවක දී දරුවන් එසේ ඉල්ලන යමක් ඔබට ඔවුන්ට ලබා දීමට නොහැකි වුනොත් දරුවන් ඔබට වෛර කරන්නට පටන් ගන්නවා. එබැවින් දරුවන් “ඉල්ලන දෙය නොව” ඔවුන්ට “අවශ්‍ය දෙය” පමණක් ලබා දෙන්න.

### ළඟා විය හැකි ඉලක්ක දෙමු

අධ්‍යාපනය කියන්නේ ඉතාමත් වටිනා දෙයක්. එය ලබා ගත් කෙනෙකුගෙන් තවත් කෙනෙකුට සොරා ගන්න බැහැ. අධ්‍යාපනය ලබා ගත් කෙනෙකුට තිබෙන්නේ දැඩි ආත්ම අභිමානයක්. නමුත් මේ නිසාම අධ්‍යාපනයේදී දරුවාට ළඟා විය නොහැකි ඉලක්ක සහ අභියෝග ලබා දෙන්න එපා. අද බොහෝ දෙමාපියන්ට අවශ්‍ය වෙලා තියෙන්නේ තමන්ගේ දරුවා සාමාන්‍ය පෙළ විභාග යෙන් විෂයන් සියල්ලටම “ඒ” සාමාර්ථ ගැනීමයි. මෙහි කිසි පදනමක් නැහැ. සාමාන්‍ය පෙළ විභාගය කියන්නේ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ගන්නා විභාගයක් පමණයි.



මෙහිදී අවශ්‍ය වෙන්නේ දරුවාට තමන් උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂිත විෂයන් කිරීමට නිශ්චිත සුදුසුකමක් ලබා ගැනීම පමණයි. එබැවින් ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය ඉලක්ක පමණක් ලබා දෙන්න. ඔබ ඔවුන්ට අනවශ්‍ය ඉලක්කයන් ලබාදුනහොත් ඔවුන්ට ඒවා ළඟා කර ගැනීමට නොහැකි වේවි.

අඩි 4 අඟල් 5 ක උසක් පනින ක්‍රීඩකයකුට එකවරම අඩි 5 ක උසක් පනින ඉලක්කයක් ලබා දුනහොත් ඔහු දුවගෙන ඇවිත් යටින් දුවගෙන යාවි. එහෙත් අපි ඔහුට අඩි 4 යි අඟල් 6 ක ඉලක්කයක් දුන්නොත් එම උස පැනීමට ඔහු නියත වශයෙන්ම උත්සාහ කරනු ඇත. එබැවින් විභාගයක දී අපි අපගේ දරුවාට ළඟා විය හැකි ඉලක්කයක් ලබා දිය යුතුයි. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් වන්නේ ඔබේ දරුවා මෙවර අධ්‍යාපන සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනවා නම් මේ ප්‍රථම අවස්ථාවේදීම විභාගයෙන් සමත් වීමට දරුවාව උනන්දු කරවන්න ඕනෑම විභාගයකින් ප්‍රථම අවස්ථාවේදී එය සමත් වීමට ඇති අවස්ථාව ඉතා වැඩියි.

### දරුවන්ගේ මිතුරන් වෙමු

අද අපගේ දරුවන්ට තිබෙන තවත් ප්‍රධානම ගැටලුවක් වන්නේ දෙමාපියන් සමඟ ඔවුන්ගේ නිසි සංනිවේදනයක් නොමැති වීමයි. බොහෝ දෙමාපියන් සහ දරුවන් අතර කිසිම සංවාදයක් ඇතිවන්නේ නැහැ. දෙමව්පියන් දරුවන් සමඟ මිතුරු මිතුරියන් ලෙස කතා බහ කළ යුතුයි. බොහෝ අවස්ථාවලදි දෙමාපියන් දරුවන් සමඟ කතා කරන්නේ දරුවන්ගේ වැරදි හොයන්නයි, නැතිනම් ඔවුන්ගේ හොර අල්ලන්නයි. මේ ගැන අපේ දරුවන් ඉතා හොඳින් දන්නවා. එබැවින් ඔබ දරුවාගෙන් යමක් විමසා සිටින විට හෝ ඔවුන්ට යමක් ප්‍රකාශ කරන විට ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීමට උත්සාහ කරන්න. දරුවා පාසලේ සිට පැමිණි විට ඔවුන්ගේ දවසේ පන්තියේ හෝ පාසලේ සිදුවූ දේ ගැන විමසන්න.


අද බොහෝ විට දරුවා පාසලේ සිට පැමිණි විට දෙමාපියන් කතා කරන්නේ දරුවාව හවස අතිරේක පන්තියට යවන එක ගැනයි. මේ නිසා දරුවන් සිතන්නේ තමන් ගෙදර ඉන්නවාට තමන් ක්‍රීඩා කරනවාට හෝ විනෝද වෙනවාට දෙමාපියන් කැමති නැහැයි කියලයි. එය ඉතාමත් අනවශ්‍ය ලෙස දරුවන්ගේ සිත් තුළ ඔබ කෙරෙහි, දෙමාපියන් කෙරෙහි ඇතිවන ඍණාත්මක සිතුවිල්ලක්.

### ආදරය කරමු

සෑම දෙමාපියෙක්ම තම දරුවන්ට ආදරය - සෙනෙහස දැක්විය යුතු ආකාරය ගැන අවබෝධයෙන් සිටිය යුතු අතර ඒ ආදරය - සෙනෙහස ලබා දිය යුත්තේ කොයි ආකාරයට ද මොන අවස්ථාවේදී ද යන්න ගැනද දැන ගත යුතුයි. මේ සඳහා ආදර තටාක න්‍යාය” (Love Tank Theory) ගැන දැනගෙන සිටීම වැදගත්. එය මේ ආකාරයට පියවරෙන් පියවර විස්තර කළ හැකියි. ඕනෑම ගසකට පොහොර යොදන අවස්ථා ගණනාවක් තිබේ. එය බීජයක් අවස්ථාවේදී පටන් ගසක් දක්වා වැඩී ඵල දරනා අවස්ථාව දක්වා පොහොර යොදන්නේ කිසියම් නිශ්චිත කාලයකට සහ රටාවකට අනුවයි. දරුවන්ට ආදරය - සෙනෙහස ලබා දිය යුත්තේ ද ඒ ආකාරයටයි.

☛ ලබන සතියට

**අරුණ ශාන්ත නෝනිස්**



## මාසික ආර්ථික විමසුම

ඉදිරිපත් කිරීම ප්‍රවීන ආර්ථික විශ්ලේෂක
**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

# රටට දැවැන්ත අභිමානයක් සමග ආර්ථික උත්තේජනයක් ගෙනෙන චෝගම් (chogm)

**හරියටම අද සිට තවත් දින 12 කින් එනම් නොවැම්බර් 15 දා ඇරඹෙන පොදු රාජ්‍ය මණ්ඩලයීය සමුළුව හෙවත් "චෝගම්" (CHOGM) 16 හා 17 යන දිනවලදී පැවැත්වීමට නියමිතය. එම දිනවල දී පැවැත්වෙන්නේ රාජ්‍ය නායකයින්ගේ සමුළුවයි. එය මෑතකදි ඉදි කළ නෙලුම් පොකුණේ දී හා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා තිබීම සුවිශේෂ සිද්ධියකි. එහිදි ප්‍රධාන දේශනය පවත්වනු ලබනුයේ මහ රැජින නියෝජනය කරමින් පැමිණෙන චාර්ල්ස් කුමරුන් විසිනි. එහිදි ශ්‍රී ලංකා ජනාධිපති තුමා, ඕස්ට්‍රේලියාවේ ටෝනි මහතා ද කථා කිරීමට නියමිතය.**

1948 වර්ෂයේ ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 8 කින් ඇරැඹුනු මෙම සමුළුව රටවල් 54 ක් දක්වා තම සාමාජිකත්වය වැඩිකර ගත්තද, මෑතකදී ගැම්බියාව එයින් ඉවත් වීම සමග එහි ස්ථාපිත සංඛ්‍යාව රටවල් 53 කට සීමා විය. එයින් මෙම සමුළුවට සහභාගි නොවන බව දැනට ප්‍රකාශ කොට ඇත්තේ කැනඩා අගමැති ස්ටීවන් හාපර් හා විදේශ අමාත්‍ය ජෝන් බෙයාර්ඩ් පමණි. එයින් නොනැවති ඉදිරියේදි සමුළුවට තමන් විසින් ලබා දෙන ප්‍රතිපාදන ද ලබා නොදෙන බවට ඔවුන් තර්ජනය කොට ඇත.

මේ අතරතුර අපේ අසල්වැසි ඉන්දියාවේ රාජ්‍යනායක ආචාර්ය මන්මෝහන් සිං ද සහභාගි වීමට ඇති ඉඩකඩ පිළිබඳවද සැක මතු වී තිබේ. සමුළුව වර්ජනය කිරීමට අර අඳින අය හුවා දැක්වීමට උත්සාහ කරනුයේ ශ්‍රී ලංකාව යුද්ධ සමයේ මානව හිමිකම් කඩ කළ බවය. එහෙත් ඒ අයටම අතුල් පහරක් එල්ල කරමින් මෑතකදි උතුරේ ජනතාවගේ ඡන්දයෙන් උතුරේ මහ ඇමැති ධූරයට පත්වූ සී. වී. විග්නේෂ්වරන් මහතා කොළඹට පැමිණ අතිගරු මහින්ද රාජපක්ෂ මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය. ඔහු මේ වන විට ජනාධිපති තුමා හමුවීමට පැමිණි වාර ගණන දෙකකි. එහෙත් දෙමළ ජාතික සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රී සුබන්තිරන් මහතා ප්‍රකාශ කළේ චෝගම් සමුළුව වර්ජනය කිරීමට තම පක්ෂය තීරණය කළ බවය. එහෙත් රාජ්‍ය නායකයන් හමුවීම සිදුකරන බවය. ඒ අතර තුර ශ්‍රී ලංකාවේ ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයද සමුළුව වර්ජනය කරන බව ප්‍රකාශ කර ඇති අතර එම පක්ෂයේම තවත් කොටසක් කියන්නේ එසේ කිරීම ජාති ද්‍රෝහි ක්‍රියාවක් බවය. මේ අනුව චෝගම් සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වෙන්නේ දෙස් විදෙස් පක්ෂ හා විපක්ෂ ලෙස දෙපිරිසක් බෙදී සිටින මොහොතකය. එවැනි පසුබිමක් තුළ හා වසර 30 ක් තිස්සේ දැවන්ත යුද්ධයකට මුහුණ දී ශ්‍රී ලංකාවට සාමය අත්පත්කර දී දමිළ ජනතාව සමග සංහිඳියාව ගොඩනඟා ගැනීමට කටයුතු කරන මොහොතක මෙම සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජනා කිරීමම අප ලද පළමු ජයග්‍රහණයයි. එමගින් ශ්‍රී ලංකාව පිළිබඳව ලෝ ජනතාව අතර පැවැති කලු පැල්ලම් මකා දැමීමට එම අවස්ථාව යොදා ගෙන ශ්‍රී ලංකාවේ අභිමානය ලොවට ප්‍රකාශ කිරීමට මෙය යොදාගත හැකිවීම දෙවැනි ප්‍රතිලාභයයි. තෙවැනි හේතුව නම් රටට සාමය ඇති කොට දැවන්ත සංවර්ධනයකට රට යොමුකරන මොහොතක පැවැත්වෙන මෙම සමුළුව මගින් රටේ ආර්ථිකයට උත්තේජනයක් ලබාගැනීමට හැකිවීමය.

යටත් විජිත වාදයේ සංකේතයක් ලෙස හඳුන්වන, බ්‍රිතාන්‍ය සිය පැරණි යටත් විජිත එකතු කොට ගොඩනගන ලද 'චෝගම්' (CHOGM) වසර දෙකකට වරක් සාමාජික රටක පැවැත්වීම තුළින් හිරු නොබසින අධිරාජ්‍යයේ යසෝකීර්තිය සැමරීම පමණක් සිදු වන බව හා ඒ සඳහා වැය කරන මුදල (දැනට රුපියල් බිලියන 5 ක් ලෙස නිල නොවන සේ ගණන් බැලූ) නාස්තියක් බවට ඇතැම් අය කරුනු ඉදිරිපත් කරති. එමගින් අත්වන සාමජ හා ආර්ථික ප්‍රතිලාබ ඔවුන් අමතක කරයි. ඇත්ත වශයෙන්ම මෙම සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජනා වූයේ 2007 කම්පාලා නුවරදීය. 2009 ට්‍රිනිඩෑඩ්වල දී එම අදහස් යළි මතුවිය. 2011 වර්ෂයේ ඕස්ට්‍රේලියාවේ පර්ත් වලදි එය ස්ථිර විය. ඒවන විට කැනඩාව හා ඉන්දියාව ද එම ස්ථිරත්වය තීරණය කරන විට සමුළු නියෝජනය කළ අතර එවිට කිසිවකු විරුද්ධ වූයේ නැත. එසේ නම් දැන් විරුද්ධ වනුයේ ඔවුනොවුන්ගේ රටවලින් එල්ල වන දේශපාලන බලපෑම් නිසා මිස. ඒ රටවල් ශ්‍රී ලංකාවට අකමැති නිසා නොවේයැයි පිළිගන්නට සිදුවේ. ඒනිසා ලෝකයේ රටවල් 53 ක් ම ශ්‍රී ලංකාවේ මෙම සමුළුව පැවැත්වීමට එකඟ වීමම මෙතෙක් ශ්‍රී ලංකාව ගැන ලෝකයේ තිබූ වැරදි ප්‍රතිරූපය ඉවත් කර ගැනීමට රුකුලකි. ලබන වසරේ ජිනිවා හි දිග හැරීමට යන ශ්‍රී ලංකාවට එරෙහි යෝජනා දුර්වල කිරීමටද මෙම සමුළුව රුකුලක් වේ යැයි සිතිය හැකිය.

චෝගම් (CHOGM) ශ්‍රී ලංකාවේ පැවැත්වීමේ තවත් වැදගත්කමක් නම් ව්‍යාපාරික හා ආයෝජන අවස්ථා ඇතිකර ගැනීමට රුකුල්වන ව්‍යාපාරික සංසදයක් පැවැත්වීමට හැකිවීමය. එමගින් ශ්‍රී ලංකාවට නව ආයෝජන ඉඩ ප්‍රස්ථා උදාකර ගැනීමට හා නව වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීමට අවස්ථාවක් උදාවන්නේය. එසේ ම දැනට ශීඝ්‍රයෙන් වර්ධනය වන සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කර ගැනීමට ද එය රුකුලක් වන්නේය.

නොවැම්බර් 10-14 දින වල හම්බන්තොට පැවැත්වෙන තරුණ සමුළුවද සුවිශේෂි තැනක් ගනු ඇත. එමගින් ශ්‍රී ලංකාවේ තරුණයන්ට විදේශීය තරුණයන් සමග සම්බන්ධ වී නූතන තාක්ෂණ දියුණුවේ ප්‍රතිලාභ බෙදා හදා ගැනීමට. විශ්ව විද්‍යාල සබඳතා තර කර ගැනීමට හැකියාවක්ද උදාවන්නේය. ඒ සමගම රාජ්‍ය නොවන සංවිධාන මගින් හික්කඩුවේදි පැවැත්වීමට කටයුතු යොදා තිබෙන 'මහජන හමුව' මහින්ද රාජ්‍ය නායකයන්ට මෙරට පිළිබඳව තිබෙන වැරදි ප්‍රතිරූපය ජනතාව සමග කථා බස් කොට නිවැරදි කර ගැනීමට හොඳ අවස්ථාවක් ද උදාකරයි.

රාජ්‍ය නායකයන් සමග පැමිණෙන එක් දූත කණ්ඩායමකට 12 ක පිරිසක් අයත් වේ. එයින් කිහිප දෙනකුගේ වියදම් ශ්‍රී ලංකාව මගින් කළත් ඉතිරි අය තම තමන්ගේ වියදම් දරා ගනී. එසේම ඒ සමගම පැමිණෙන 4000 කින් යුක්ත ජනමාධ්‍යවේදීන් ද තම තමන්ගේ වියදම් ඔවුන්ම කරගනී. එමගින් රටට ලැබෙන ආදායම හමුවේද දැනට ඒ සඳහා කරන වියදම නාස්තියක් යැයි ඇතැම් අය ගෙනෙන තර්කයද බිඳ වැටේ.

චෝගම් සමුළුව නියෝජනය කරන රටවල් 53, බිලියන 2.2 ක ජනගහනයක් නියෝජනය කරයි. එම රටවල 60% ක් ම ඉන්නේ අවුරුදු 30 ට අඩු පිරිස්ය. රටවල් 32 ක් ම කුඩා රටවල්ය. ඇතැම් රටවල් ඒක පුද්ගල ආදායම ඩොලර් 250 ක් වන අතර අපේ වගේ ඩොලර් 3000 ඒක පුද්ගල ආදායමැති රටවල්ද ඩොලර් 50000 ඒක පුද්ගල ආදායම් ඇති රටවල්ද මෙම සමුළුව නියෝජනය කරයි. ඒනිසා ඒ අය රට ගැන දකින නිවැරදි පින්තූරය කොළඹ නගරයේ ලස්සන, යුද්ධයෙන් පසු ඉදිවී තිබෙන අධිවේගී මාර්ග හා සංවර්ධනයන් දැකීමෙන් රට ගැන ඇතිකර ගන්නා ප්‍රතිරූප ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සැලසුම් සාක්ෂාත් කර ගැනීමට හා 2016 මිලියන 2.5 ක සංචාරක ඉලක්කය ළඟා කර ගැනීමට රුකුලක් වනු ඇත. ඒ සියල්ලටම වඩා ඉදිරි වසර 2 ක තුළ ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා රටවල් 53 ක නායකයා වීම ම අපට අභිමානයකි. ඒ නිසා කෙටිකාලිනව විශාල වියදමක් කර හෝ පැවැත්වෙන මෙම සමුළුව හරහා ශ්‍රී ලංකාවට දිගු කාලිනව විශාල ප්‍රතිලාභ රැසක් අත්වනවා පමණක් නොවශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමේ මහින්ද චින්තන දැක්ම සාක්ෂාත් කර ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත යන්න අපගේ විශ්වාසයයි.

---

# කොළඹ නගරයේ ඉඩම් අත්පත් කර ගැනීම ගැන සෙත්සරණ මගින් සිදුකළ සමීක්ෂණයේ වාර්තාව

**විශේෂ ලිපියකි**

කොළඹ නගර සභාව මගින් 2004 වසරේ දී කරන ලද පරීක්ෂණ වාර්තා අනුව කොළඹ නගරය ආශ්‍රිත වතු සංඛ්‍යාව සහ පවුල් සංඛ්‍යාව

- වතු 1,614
- පවුල් 72,612

2002 ඉඩම් ප්‍රොෆයිල් සිටි වාර්තාව අනුව වතු සංඛ්‍යාව 1,614 වන අතර, එක වත්තකට අයිති පවුල් සංඛ්‍යාව 36 ක් පමණ වේ. නිවාස සංඛ්‍යාව 53,659 කි.

50% ක් එක පවුලකට වඩා ජීවත්වන නිවාස වේ.

එක පවුලක පස්දෙනකු ලෙස ගතහොත් මුළු ජන සංඛ්‍යාව 388,060 (තුන්ලක්ෂ අසූ අටදාස් හැටක් වේ) මෙම වතුවල නිත්‍යානුකූල ඉඩම් හිමිකම ඇති පිරිස 19,117 පමණ වේ.

### නිවෙස්වල ස්ථිර භාවය

- 23% තට්ටු නිවාස
- 47% තනි තට්ටු නිවාස
- 19% අර්ධ ස්ථිර නිවාස
- 11% තාවකාලික නිවාස

මුළු කොළඹ නගර ප්‍රදේශය සැලකිල්ලට ගැනීමේ දී මෙම ජනගහණය පදිංචි ඉඩම් ප්‍රමාණ 11% ක් වේ. මෙම ඉඩම් පර්ච් 1 ක් මිලියන 8 කට විකිණීමට බලාපොරොත්තු වේ.

### රැකියා තත්ත්වය

- ස්ථිර ආදායම් තිබෙන පවුල් සංඛ්‍යාව 9314 පමණ

නුපුහුණු රැකියාවන් හි නිරත වන අය 45% පමණ වේ. (නාට්ටාමිලා කාඩ්බෝඩ් බෝතල් පත්තර විකුණන අය පෙට්ටි කඩ කඩයප්පන් සදන අය) 2004 සුනාමියෙන් පසු 2005 වර්ෂය තුළ මෙම ප්‍රදේශවල පවුල් සංඛ්‍යාව 5% කින් වැඩිවී ඇත.

### නිවාස ඉවත් කිරීමට යෝජිත ප්‍රදේශ

- මට්ටක්කුලිය, කොළඹ 15 131, 159, 157, 167 වත්ත — පවුල් 450
- කොල්ලුපිටිය, කොළඹ 03 — පවුල් 58
- අලහකෝන් වත්ත, කොළඹ 10 — පවුල් 114
- අභයසිංහාරාමය, කොළඹ 10 — පවුල් 60
- මරදාන පාර, කොළඹ 10 — පවුල් 30
- ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 — පවුල් 8
- නාවල පාර, කොළඹ 05 — පවුල් 59
- වෝඩ් පෙදෙස, කොළඹ 08 — පවුල් 62
- ජෝශප් පටුමග, කොළඹ 05 — පවුල් 26
- B.M. කොළඹගේ මාවත කොළඹ 05 — පවුල් 111
- බේකරි පාර, කොළඹ 12 — පවුල් 66
- ඩෑම් පාර, කොළඹ 12 — පවුල් 17
- ඩෑම් පාර, කොළඹ 12 — පවුල් 05
- ඩෑම් පාර, කොළඹ 12 — පවුල් 108
- ඩෑම් පාර, කොළඹ 12 — පවුල් 108
- සිරිල් පෙරේරා මාවත කොළඹ 13 — පවුල් 148
- ලොක් ගේට්, කොළඹ 13 — පවුල් 244
- තාර වත්ත, කොළඹ 07 — පවුල් 147
- රාවත්ත, ටොරිටන් වත්ත, කො 07 — පවුල් 262
- 184, 189, 255 වත්ත, කොළඹ 07 — පවුල් 138
- ස්ටේඩියම් ගම, සිරිමාවෝ බණ්ඩාරනායක වත්ත — පවුල් 469
- ඇපල් වත්ත (කෙත්තාරාම ක්‍රීඩාංග-) පවුල් 1048
- 95 කදිරාන වත්ත, කොළඹ 15 — පවුල් 400
- කාලිපුල්ලේ මාවත, (දෙමටගොඩ) — පවුල් 335
- සමගි වත්ත (ඇල්විටිගල), කොළඹ 05 පවුල් 77
- බදුවත්ත, කොළඹ 07 — පවුල් 160
- 140 වත්ත, පූර්වාරාම, කොළඹ 06 — පවුල් 108
- 140 වත්ත, ජනපදය, කොළඹ 06 — පවුල් 108
- මයුර පෙදෙස, කොළඹ 6 — පවුල් 120
- 133 ෆර්ගියුෂන් පාර, කොළඹ 15 — පවුල් 20
- කුපස් කන්ද (ධර්මපාල මාවත) 03 — පවුල් 15
- 51/1 වත්ත, නිදහස් මාවත, කොළඹ 07 පවුල් 12
- 52 වත්ත, ටවර් හෝල්, කොළඹ 10 — පවුල් 52
- 48 වත්ත, ජෝශප් මාවත, (මිලාගිරිය) — පවුල් 15
- 312 වත්ත (සිරිල් පෙරේරා මාවත) කොළඹ 11 — පවුල් 38
- 600 වත්ත (බේස්ලයින් පාර) කො 09 — පවුල් 15
- 53 වත්ත (ශ්‍රී ප්‍රියදර්ශන මාවත) කොළඹ 10 — පවුල් 38
- 264 වත්ත, යුනියන් පෙදෙස, කොළඹ 02 — පවුල් 34
- 48 වත්ත, 1 ක්, කොළඹ 04 — පවුල් 09
- 380 වත්ත, සරණ පාර, කොළඹ 04 — පවුල් 08
- 62 වත්ත, පංචිකාවත්ත පාර, කො 10 — පවුල් 11
- 61 වත්ත, බේරේ පාර, කො 02 — පවුල් 16
- 51 වත්ත, බේරේ පාර, කො 02 — පවුල් 10

2011 වසර තුළදී කැඩෙන්නට නියමිත ප්‍රදේශයන් ලෙස හඳුනා ගන්නා ලදී.

නිවසක් කුලී පදනමට ලබා ගැනීම සඳහා එක් නිවැසියකු වෙනුවෙන් මසකට රු. 12,000.00 බැගින් වසරකට රු. 144.000.00 ක මුදලක් ලබා දේ. එම යෝජනාවට අකමැත්ත පලකරන අයට පොදු පහසුකම් යටතේ තොටලඟ තිබෙන ලැලි නිවාසවල පදිංචි වීමේ හැකියාව ඇත.

අලුත් නිවාස ලබාදීමේ දී බැංකු පදනම මත ණය ආධාර ලබාදෙන අතර එම ණය ගෙවීමට අපහසු නිවැසියන්ගෙන් එම නිවාස ආපසු ලබාගැනේ.

නගර සභාවට අයත් වතුවල පදිංචි අය සඳහා ඔප්පු ලබාදීම සිදුකරනු නොලැබේ.

**ගරු බර්නාඩ් රෙහාට් පියතුමා**

### කොළඹ අගරදගුරු පදවිය තුළ ඇති වතු ආශ්‍රිතව සිදුකළ වැඩසටහන හා සොයා ගැනීම්, බැහැදැකීම්

**හොරණ නිව් චැට්ල් වත්ත නිවාස 12 ක් හා කොබෙයිවත්ත වතුකරයේ නිවාස 11 බැහැදැකීම් සිදුකරන ලදි.**

මෙහි නිවාස හා එහි පදිංචිකරුවන්ව හමු වී පැවැත්වූ සාකච්චා මගින් පහත සඳහන් කරුනු අනාවරණය කරන ගන්නා ලදී.

- ළමුන්ට අධ්‍යාපනය සඳහා ඇති ගැටළු
- රැකියාවේ අවිනිශ්චිත බව
- අඩු පහසුකම් වලින් යුතු නිවාස
- ආර්ථික ගැටළු
- අඩු අධ්‍යාපන තත්ත්වය
- අඩු වයස් විවහ

**නිදහස් වෙළඳ කලාපය ආශ්‍රිතව සිදුකළ වැඩසටහන හා සොයා ගැනීම්**

ගරු ප්‍රසාද් පියතුමා, ගරු තන්ගම් පැවිදි සොහොයුරිය හා වෙළඳ කලාප සේවක සේවිකාවන් මුණ ගැසී අනාවරණය කර ගත් කරුණු

- අධ්‍යාත්මික ජීවිතයට ඇති නැඹුරුව අඩු වීම
- අයථා සම්බන්ධතා වලට යොමු වීම
- නිදහස අවම වීම
- අඩු පහසුකම් යටතේ ජීවත් වීම
- ගබ්සාව
- උපදේශනයේ අවශ්‍යතාව
- ජංගම දුරකතන අධික ලෙස භාවිත කිරීම
- අසභ්‍ය දර්ශන රැගත් වීඩියෝ පට, චිත්‍රපට නැරඹීමට යොමු වීම

දැල්වෙන පහන්

## ගී හඬ නගමින් - කිතුගොස පුදමින් සමිඳුගෙ මැඳුරට වැඩිය

# ගරු බෙන්සිරි පෙරේරා පියතුමා

**තව වසර තුනකින් සමිඳුන් රකිනා කිතුදම් මිදි උයනේ බැටළු එඬේරික පූජක දිවියේ 50 වැනි සැමරුම ලබන තුරා පෙරුම් පුරා බලා සිටින ගරු බෙන්සිරි පෙරේරා පියතුමන් අද රාගම තේවත්ත ලංකා අප ස්වාමිදූ මරි මව් පූජනීය භූමියේ තුරුලතාවන්ගෙන් පිරි නිසල ශාන්ත පරිසරයේ පිහිටි 'පිය සෙවන' විශ්‍රාමික පූජක නිවහනේ දෙවිඳු පසස ගී දැහැනට බැතියෙන් සමවැදී සිටින්නේය.**

අගරදගුරු වසමේ හිටපු ජනවන්දනා උපාධ්‍ය හා භාග්‍යවත් ජුසේ වාස් දේව ධර්ම නිකේතනයේ හිටපු අදියුරු ගරු සිසිල් ජෝයි පියතුමා බෙන්සිරි පියා ගැන ලිව් පෙර වදනකින් මෙම ලිපියට ආරම්භයක් දීම යුක්ති යුක්ත යැයි සිතමි.

මෑතක සිට අපි ගීතිකාවක සහ කිතුනු ගීයක වෙනස පැහැදිලි ලෙස හුවා දක්වමු. දේව වන්දනා පිළිවෙත්වලදී ගායනා කළ යුත්තේ 'ගිතිකා' මිස 'කිතුනු ගී' නොවේ. මේවා අතර වෙනස සියුම් යැයි සිතුවද ඇත්තෙන්ම පැහැදිලි වෙනස්කම් ඉදිරිපත් කළ හැකිය. ගීතිකාවක් හැකි උපරිමයෙන් ශුද්ධ බයිබලීය හෝ ශුද්ධ සම්ප්‍රදාය මත හෝ ධර්මෝපදේශයක් බව මුලින්ම සිහිතබා ගත යුතුය. කිසියම් බයිබලීය වදනක් ගෙන ඒ පිළිබඳ පුද්ගලික සිතුවිල්ලක් නිර්මාණය කිරීමට වඩා වැදගත් වන්නේ ශුද්ධ බයිබලීය වදන හැකි උපරිමයෙන් ගීතමය ස්වභාවයෙන් සැකසීමය.


කිතු වසින් 1942 මැයි මස 21 වන දින බුදු හිමි පහසින් පූජනීයත්වයට පත් කැළණි පුරයේ පිලපිටිය ග්‍රාමයේ ජේ. ඒ. බෙනඩික් පෙරේරා සහ එම්. ඒ. ක්ලැරින්ඩා සෙනෙවිරත්න දම්පතින්ට දාව වැඩිමහල් දරුවා ලෙස උපත ලද ගරු බෙන්සිරි පියතුමාට බාල සහෝදරයන් දෙදෙනෙකු සහ බාල සහෝදරියන් දෙදෙනෙක් විය. සිය මෑණියන් දක්ෂ ඕගන් වාදන ශිල්පිනියක් නිසා කුඩා කලම එතුමාගේ සිතගත සංගීතය කරා නැඹුරු වූ බව එතුමා සඳහන් කරන්නේය. එසේම, කලාතුරකින් කෙනෙකුට උරුම වන ගැඹුරු ලාලිත්‍ය කටහඬක් එතුමාට දෙවිඳුන් තිළිණ කර දී ඇත්තේය.

එතුමා වත්තල සා. අන්තෝනි විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා එවකට කැළණිය මීසම් සේවකව සිටි ගරු වින්සන් ඩෙප් පියතුමාගේ මඟපෙන්වීම යටතේ පූජකවරය පතා කොළඹ සා. ඇලෝසියස් දෙව්සත් හලට 1957 දී ඇතුළු විය. ඉන්පසු මහනුවර අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුළු වී දෙව්දහම ගැන ඉහලම දැනුම ලබා 1966 දෙසැම්බර් මස 21 වන දින කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී කොළඹ හිටපු අගරදගුරු පරලෝ සැපත් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් අතින් පුදැදුරු වරම් ලැබීය.

1967 එතුමාගේ කුළුදුල් පූජක පත්වීම හෙළ කිතු සසුනේ බල කොටුව වූ 'පුංචි වතිකානය' ලෙස විරුදාවලි ලත් පමුණුගම කිතුනු පුරයෙන් ආරම්භ විය. එවකට පමුණුගම මීසම සේවකව සිටි එඩිතර පූජක යෝධයෙක්වූ ගරු සොලමන් ප්‍රනාන්දු පියතුමා එතුමා ආදරයෙන් පිළිගෙන කැපුන්ගොඩ හා දුන්ගල්පිටිය දෙව්මැඳුරු වල දේව සේවාව භාර කළේය. ශ්‍රාවකයන්ගේ පාද සේදූ කිතු සමිඳුන්ගේ දයා ප්‍රේමය සියළු සිය දූතික කාර්ය භාරය හැම විටම ඉටු කළේය. සොලමන් ප්‍රනාන්දු ගරු පියතුමා තමාට පියකු මෙන් ගුරු හරුකම් දුන් හැටිත්, තම පියාගේ අභාවය නිසා තම මෑණියන්ට කුඩා සහෝදරියන් දෙදෙනා රැකබලා ගැනීමට අසීරු බව දැනගත් සොලමන් පියතුමා සිය නැගෙනියන් දෙදෙනාව පමුණුගම ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ ප්‍රධාන මව් තුමිය වු ක්ලැරිස් මව් තුමියට භාරදී එතුමාගේ පුද්ගලික වියදමින් ඔවුන් රැක බලාගෙන අධ්‍යාපනය ලබා දීමට පියකුමෙන් මැදහත් වී ඉටුකළ මානව දයාවේ මෙහෙය තම දිවියේ කිසිදාක අමතක නොවන සටහනක් බව එතුමා කඳුළු පිරි දෙනෙතින් සිහිපත් කළේය.

එතුමා සමග අම්පිටිය දෙව්සත්හලේ එකට දේව ධර්මය හැදෑරූ පූජක සොහොයුරන් තිදෙනෙක්ම අද රදගුරු තුමන්ලා වීමද එතුමා නිහතමානිව ආඩම්බරයෙන් සිහිපත් කරයි. කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු අතිඋතුම් මේරියස් පීරිස් හිමි, මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමි හා මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමි ඒ තිදෙනාය. ඊට අමතරව එතුමාගේ සමකාලීන පූජක තුමන්ලා ලෙස ගරු බැසිල් නික්ලස් ජෝශප් ඇන්ටනි, බොනිපස් මැන්දිස්, ජෝන් හෙට්ටිආරච්චි සහ ගාල්ල පදවියේ ඇලෝසියස් පෙරේරා යන පූජක තුමන්ලා ද ගෞරවයෙන් සිහිපත් කළේය.

එතුමා සමග එදා එම සංගීත කණ්ඩායමේ සිටි සොහොයුරන් දහදෙනා වූයේ, ගරු කැමිලස් මැන්දිස්, වියානි ප්‍රනාන්දු, ඩඩ්ලි ප්‍රනාන්දු, ඩෙසිඩේරියස් ප්‍රනාන්දු, මේරියස් පීරිස්, එන්. ලෝරන්ස් ඩැනියල් (නි.ම.නි) ලෝරන්ස් ජයතිලක (නි.ම.නි)



පීටර් ස්ටැනිස් ලාවුස් (නි.ම.නි) ප්‍රැන්සිස් මාදිවල සොයුරන් එතුමා ආදරයෙන් සිහිපත් කළේය.

සහයක පූජක තුමකු ලෙස පමුණුගම මීසමෙන් ඇරඹි එතුමාගේ දේව සේවය 1963 දී මොරටුව සහයක ලෙසද 1970 දී මීගමුව මහවීදිය සහයක ලෙසද, ඉන්පසු ප්‍රථම වරට 1971 දී කටාන - කඳවල මීසම් සේවක ලෙසද 1972 දී කිඹුලාපිටිය මීසම් සේවක ලෙසද 1975 දී බෝලවලාන කුරණ මීසම් සේවක ලෙසද අනතුරුව වසර 2 ක කාලයක් රෝමයේ උර්බානු සරසවියේ ශුද්ධ වූ බයිබලය පිළිබඳ විශේෂ උපාධිය සඳහා හිටපු අගරදගරු අතිඋතුම් නික්ලස් මාකස් හිමිපාණන් විසින් අවස්ථාව ලබා දීම එතුමා අද ගෞරවයෙන් සිහිපත් කරයි. පසුකාලීනව එතුමා ජෝශප් වාස් දේවධර්ම නිකේතනයේ වසර 10 ක් ශුද්ධවූ බයිබලය පිළිබඳ දේශකයකු ලෙස කටයුතු කළේය. රෝමයේ සිට පැමිණි එතුමාව තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ පාලක පියතුමා ලෙස පත්කරන ලදී. 1987 දී කඳාන මීසම් සේවක ලෙසද, 1992 දී යළි එතුමා පළමු පූජක සේවය ආරම්භ කළ පමුණුගම මීසම සේවක ලෙස පත්වී පමුණුගම ඇලෙන්ළුගොඩ, සා. සෙබස්තියන් දෙව් මැඳුර ගොඩනැගීමේ පුරෝගාමියා ලෙස කටයුතු කළේය.

එතුමා සහයක පියතුමකු ලෙස පමුණුගම මීසමේ සේවය කළ යුගයේ (1967-1968) පමුණුගම ශ්‍රීලේ මංගල්ල්‍යයේ 100වැනි සමරුව සඳහා මීසම පාලක සොලමන් පියතුමා සමග සුවිශේෂී දහම් සේවා කාර්ය භාරයක් කළේය. එතුමාගේ විශේෂ ශ්‍රීලේ සමරු ගීතය වූ "ජේසුනි, ඔබට නමෝ - ඔබෙ පිය දෙවිතුමට නමෝ" යන සිත්බැඳ ගන්නා ආකර්ශනීය ගීත නිර්මාණය අද සමස්ත කිතුනු ජනතාවම බැතියෙන් ගයනු ඇසෙන්නේය.

1992 දී තුඩැල්ල මීසම භාරව පැමිණි එතුමා 2002 වසරේ වත්තල මාබෝල මීසම සේවක ලෙස පත්විය. එහිදී එතුමා පූජකවරයේ 40 වැනි සේවා සමරුව මාබෝල කිතුනු ජනතාව සමග සැමරීය. එතුමා ලක් කිතු සසුනට 1965 දී පූජා කරන ලද ගී නිර්මාණ පොත හා මෑතක දී නිකුත් කරන ලද සංයුක්ත තැටි දෙව් වදන් සරල බසින් ගයමින් මිනිස් සන්තානය නව දහම් ගායන සමාධියකට යොමු කළේය.

ලක් කිතු සසුනේ දෙවිඳු පැසසුම නව මඟකට යොමුකළ බෙන්සිරි පියාගේ දෙවිඳු පසස ගී ගැන එවකට ජාතික දෙව්සත්හලේ ශුද්ධ ලියවිල්ල පිළිබඳ කතික ඇදුරු ආචාර්ය ජෝකිම් පිල්ලේ පියතුමා ප්‍රකාශ කරන්නේ මෙසේය, "අප හමුවේ ඇති පසස ගී අපූරු යැදුම් සමූහයකි. ඉපැරනි ඉමිහිරි අමරණීය පැසසුම් ගී හා තු ති ගී රැසකි. දෙවිඳුන්ගේ විශේෂ ප්‍රේමයට ලක්වුන උන්වහන්සේගේ දයාව අත්දුටු ජනතාවගේ හදවත් තුළින් වැහුන යැදුම් වලියකි."

දෙවිඳු පසස ගී සංයුක්ත තැටිය ගැන බෙන්සිරි පියා ප්‍රකාශ කරන්නේ මෙසේය. 1965 වසරේ ප්‍රබන්ධ කරන ලද මෙම ගී එකතුව ශු. බයිබලයේ ගීතාවලියෙන් ගත් ගීත 25 කි. ගරු පියතුමන් බොහෝ දෙනෙකුගේ ඉල්ලීම මත එම ගීතවලින් 16 ක් තෝරා ගෙන සංයුක්ත තැටියකට සකස් කළෙමු. 40 වසරකට පෙර (1965) අම්පිටිය ජාතික දෙව්සත්හලේදී මෙම ප්‍රයත්නයට මා උනන්දු වූයේ 2 වැනි වතිකාන කතිකාවෙන් පසු දේශීය ගීත කරණයට යොමු වන්නට සාන්ත සභාවෙන් ලැබුණ පෙලඹීම හා දිරිගැන්වීම නිසාය.

ග්‍රෙගෝරියානු (ලතින්) සංගීතයේ ආභාෂයත් සංගීතවේදී ඩබ්ලිව්. ඩී. මකුලොලුව ශූරීන්ගේ 'හෙල ගී මග' යන දේශීය ස්වර රටා අධ්‍යයනය කිරීමත් තුළින් දෙවිඳු පසස ගී තනු ජනතාවට පහසුවෙන් ලෙහෙසියෙන් ගයන්නට ඉදිරිපත් කළෙමි. ග්‍රෙගෝරියානු ලතින් සංගීතය රාගධාරී සංගීතයටත් හෙළ ස්වර රටාවටත් සමීප බැඳීමක් සහ හැඟීමක් ඇති බව මගේ අදහසයි. ඉන්පසු උන්වහන්සේ 'සෙනෙහසේ ගීතය' හා 'සමිඳු මුවින් ගී' නමැති ගී පොත්වල අඩංගු ගීතද පසුගියදා සංයුක්ත තැටියකට ඇතුලත් කර දේව ජනතාවට පූජා කළේය. මෙම ගීත ගායනය සඳහා උන්වහන්සේ ඇතුළුව ලංකාවේ ගීත ගායනයේ දක්ෂ ගරු පියවරු, ගරු පැවිදි සහෝදරියන්, උන්වහන්සේ දේව සේවය කළ මීසම් වලින් තෝරා ගත් දක්ෂ ගායක ගායිකාවන් හා ජාතික තලයේ දක්ෂ ගායක ගායිකාවන්ද තෝරා ගැනීම විශේෂයකි.

උන්වහන්සේගේ ගීත අතර කිතුනු ජනතාව අතර සදානොමියෙන ගීත රාශියක් ඇත්තේය. මිනිස් සන්තානය දෙවිඳුන්ට ලංකරන එම ගීත සර්වකාලීනවේ. එම ගීත අතරින් 'යහ මඟ යන දැහැමි දනා' - 'සමිඳුනි ඔබෙ නම ඔබ මැව් ලොව තුළ' - 'මා රැකවරණය සමිඳාණන්මය' - 'ජීවන දායක පූපයමේ, ජේසුගෙ සිරිසිරුරම එයවේ' - 'සමිඳුන් වෙත මගෙ හද යන්නේ' - 'ගී හඬ නගමින් තුති ගොස පුදමින්' - 'දෙවිඳු වඳින දැහැමිදනට' - 'ලොව අසරණ සත හට සරණය වන අපහට' -'අප ගත සිත සමිඳුට කැප කරමු' - 'සමිඳුට ජයවේ සමිඳුට තුතිවේ' - 'සමිඳුනි ඔබෙ පෙම් කරුණාපා', 'දෙවිඳුන්ගේ සුර රජිඳුන්ගේ කරුණාව සැමකල් පැවැතේ' 'අපමණ සෙත මට සැලසූ සමිඳුට', 'කරුණාබර අප පිය සමිඳේ' - මාගේ පියාණෙනී ඔබ අති බලගතුය' - 'මා ඔබගෙ සමිඳාණන්, මා සුවපත් කළ මැනේ' - 'කිතු හඬ පතුරමු' - 'මම වෙමි යහපත් එඬේරාණෝ' - 'ඔබගෙ හදවතින් රුධිරය ජලයද' - 'ජේසුනී ඔබට නමෝ' ආදි ජනහද ජයගත් කිතුනු ගී අතර අතිවිශිෂ්ට ගනයේ ලා සැලකෙන්නේය.

උන්වහන්සේගේ සමිඳු මුවින් ගී පොතට සටහනක් ලියන උන්වහන්සේ සමග පූජකවරය ලැබූ සමකාලීනයකු වන මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමි මෙසේ ලියන්නේය. 'ජනතා හදවතට සමීප ගීතිකා නිබන්ධනය කිරීමේ ප්‍රයත්නය ගරු බෙන්සිරි පියතුමා පලමුවෙන්ම දියත් කළේ 1966 වසරේය. එනම් දෙවන වතිකාන මන්ත්‍රන සභාව තුළින් බිහිවූ සභා නවෝදයක් සමගය. එතුමා 'දෙවිඳු පසස ගී' නම්වූ ගීත පොත නිර්මාණය කළේ අරුත්බර සිංහල ගීතිකා අත්‍යවශ්‍යව තිබුණ යුගයකය.

එතුමාගේ 'මා රැකවරණය සමිඳාණන්මය' යන ගීතයට පරලෝ සැපත් හලාවත රදගුරු අතිඋතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් ඉතාමත් ප්‍රිය කළ බව පවසන, ගරු බෙන්සිරි පියතුමා එය ගෞරවයෙන් සිහිපත් කෙළ්ය. බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය මෙහෙයවූ 2012 ජාතික සාහිත්‍ය දින සම්මාන උලෙළේදී කිතුනු ගීත සාහිත්‍යයට කරන ලද අමරණීය සේවාව වෙනුවෙන් ගරු බෙන්සිරි පෙරේරා පියතුමා ජාතික සම්මානයෙන් පිදුම් ලැබීය.

තේවත්ත පිය සෙවනේ සිට තවමත් කිතුනු ගීත නිර්මාණ අත්හදා බලමින් සිටින එතුමා දේව ජනතාව දෙවිඳුන් හමුවේ ගීතයෙන් තුති පැසසුම් වන්දනාවෙන් සමීප කරවීමට උපන් තවත් ක්‍රිස්තු වරයෙක් බඳුය. ප්‍රදීපයේ කලක සිට දෙව් දහම ගැන ලිපි ලියූ දක්ෂ ලේඛකයකු ද වන එතුමාට තව කලක් නිදුක් නිරෝගීව සමිඳුන් රකිනා බැටළු එඬේරකු වන්නට දෙව් ආසිරි ප්‍රදීප කතු තුමන් ඇතුළු සමස්ත ලේඛක පරපුරේ ඒකායන ප්‍රාර්ථනය වන්නේය.

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# සමිඳු තුරුළට ගිය ගරු තිමති කොළමුන්නේ පැ.තු.නි පියතුමා

**අධ්‍යාපන සේවයේ දැවැන්තයකු, දක්ෂ ලේඛකයකු, ඉතිහාසඥයකු, බාලදක්ෂ ආචාර්ය වරයකු මෙන්ම මග්ගොන ආරම්භ වූ ස්වදේශීය ප්‍රන්සිස්කන් සා. විසෙන්ති ද පාවුලා නිකායයේ (GBV) අවසාන ශ්‍රේෂ්ඨාධිපති ලෙස සේවය කළ, මෙම නිකාය රෝමයේ ප්‍රැන්සිස්කන් පැවදි තුන්වන නිකාය (TOR) හා ඒකාබද්ධ වීමේ ලා මූලිකව කටයතු කළ ගරු තිමති කොලමුන්නේ පැ.තු.නි පියතුමා අවුරුදූ 91 ක් ආයු වළඳා 2013 ඔක්තෝබර් 21 වන දින ස්වර්ගස්ථ වූ අතර ඔක්තෝබර් 23 වන දින මග්ගොන ප්‍රන්සිස්කාන ආරාමයේ සුසාන භූමියේ දී භූමදාන කරන ලදී.**

බටගම මීසමේ, කොලමුන්නේ ගල්ගානගේ විලියම් පීටර් තැලිස් සහ ඇනී තැලිස් නමැති යුවලට දාව ගරු තිමති කොලමුන්නේ පියතුමා වර්ෂ 1923 ජනවාරි මස 06 වන දින උපත ලැබීය. මුල් අධ්‍යාපන කටයුතු එම මීසම තුළ නිමවා 1936 නොවැම්බර් 17 වන දින මග්ගොන සා විසෙන්ති ද පාවුලා ප්‍රැන්සිස්කන් නිකායයේ පුහුණු ආයතනයට ඇතුලු විය. එහි 1941 මාර්තු 25 වන දින නවතාපස ජීවිතයට ඇතුළු වී 1942 මාර්තු 25 වන දින ප්‍රථම වේදභාර ගිවිස ප්‍රැන්සිස්කන් නිකායට ඇතුළු විය.

වර්ෂ 1946 දී බෝලවලාන ගුරු අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යාපනය අවසන් කර වෙන්නප්පුව පිරිමි පාසලේ උපගුරු ලෙස අද්‍යාපන සේවය ආරම්භ කර 1947 දී හලාවත පිරිමි පාසලට මාරුවක් ලබා 1948 මාර්තු 31 වන දින සදාකාල පැවිදි පොරොන්දු ගිවිසන ලදී.

පසුව කටුවාපිටිය පිරිමි පාසලෙදි (1949) හේවාදිවෙල රෝමානු කතෝලික පාසලේද (1955) මග්ගොන චරිත ශෝධනාගාර පාසලේ ද (1957) දූව පිරිමි පාසලේ ද (1958) සේවය කරන අතර තුර කැළණියේ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ලැබීය. වර්ෂ 1964 දී වෙන්නප්පුව ජෝශප් වාස් විදුහල් සේවයට බැඳුන අතර 1969



දී බෝලවත්ත මහ විද්‍යාලයේ ප්‍රථම විදුහල්පති ලෙස පත්ව පුරා වසර 7 ක් සේවය කළේය.

අප නිකායයේ අනුශාසක ධූරයට 1972 දී පත්වූ මෙතුමා එහි විවිධ තනතුරු ඉසිලීය. වර්ෂ 1975 දී මැනිලා විශ්ව විද්‍යාලයත් සමාජ සේවා පිළිබඳ ඩිප්ලොමාවක් ලබා නැවතත් බෝලවත්ත මහවිද්‍යාලයට පැමිණුන අතර 1977 දී කටුනේරිය මහ විද්‍යාලයේ විදුහල්ති ලෙස සේවය කර 1981 දී ගුරු සේවයෙන් විශ්‍රාම ලැබීය. වර්ෂ 1982 නොවැම්බර් 12 ව දින සා. විසෙන්තිද පාවුලා තුමාගේ ප්‍රන්සිස්කන් නිකාය (FBV) රෝමයේ ප්‍රන්සිස්කන් පැවිදි තුන්වන නිකාය (TOR) හා ඒකාබද්ධ වීමත් සමග එතෙක් සහෝදර තුමන්ලාට පමණක් සීමා වූ සේවාව පූජක සේවාව දක්වා පුළුල් විය.

ගුරු සේවයෙන් විශ්‍රාම ගිය ද තම හැකියා දක්ෂතා තුළ ඉමහත් සේවයක් ඉටුකළහ. ලේඛකයකු හා ඉතිහාසඥයකු ලෙස පොත් කීපයක් පළ කළ අතර සිරිලක් කිතු සසුන I, II යාගික මහෝත්තමයාණෝ ඉන් කීපයකි. ප්‍රැන්සිස්කන් නිකායයේ විවිධ තනතුරු දැරූ මෙතුමා අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුළුව දේවධර්මය හදාරා 1989 පෙබරවාරි 25 වන දින පූජකවරය ලැබීය. පසුව ටික කලක් දුම්මලදෙනිය මීසමේ මීසම් සේවක පියතුමා ලෙස ද කටයුතු කළහ. හංවැල්ල නිරිපොල ළමා ග්‍රාමයේ ආත්මික අධ්‍යක්ෂ ලෙස කලක් සේවය කළ මෙතුමා කොළඹ කොච්චිකඩේ සා. අන්තෝනි ජාතික සිද්ධස්ථානයේ ද සේවය කළේය. මාරවිල හා පැ.තු.නි පූර්ව දෙව්සත්හල් වල උසස් පෙළ හදාරන සිසුනට ක්‍රිස්තියානි ධර්මය ඉගැන්වූ අතර විශේෂ කොට හලාවත පදවියේ විවිධ ආයතන හා සංවිධාන තුළ කැපවීමෙන් කටයුතු කළේය.

මෙතුමා සැඳෑ සමය සමිඳුන් සමග ගත කරමින් විවේකි සුවයෙන් ජීවත් වී ප්‍රැන්සිස්කන් වරයකු ලෙස තම ජිවිතය අවසන් කළේය. සදාකාල රාජ්‍යයේ භෝජන සංග්‍රහය තුළ සමිඳුන් වතට වත දැකීමේ භාග්‍යය එතුමාට අත්වේවායි පතමු යදිමු.

**ගරු ජෙරොම් ප්‍රනාන්දු පැ.තු.නි**

ශුද්ධ ආත්මයන්... 5 පිටුවෙන්

ධනවත් පවුලකින් පැමිණි ශු. මලකියස් මුනිතුමා දුප්පතුන්ගේ මළ මිනි භූමදානය කිරීමට ආශාවක් දැක්වීය. මෙම ක්‍රියාව පහත් ක්‍රියාවක් ලෙස ඒ සමාජයේ සැලකුවත් දෙවියන් වහන්සේ උදෙසා කරන ධර්ම ක්‍රියාවක් වශයෙන් ඔහු සැලකීය. තවද ඔහුගේ සොහොයුරියද එම ක්‍රියාව තදින්ම හෙළා දැක්කාය. කලක් ඇවෑමෙන් පසු තම සොහොයුරිය මරණාසන්නව සිටි විට ශු. මලකියස් මුනිතුමාගේ අවවාද අනුශාසනා නිසා ඇගේ සිත හැරිණි. ඇගේ මරණයෙන් සතියකට පසු ශු. මලකියස් මුනිතුමා ඈ සිහිනෙන් දිටීය. ඒ ඉතා දුබලව වැහැරී ගිය ස්වභාවකිනි. ඈ වෙනුවෙන් උන්වහන්සේ දිව්‍ය පූජා සිදු කළේය. දින කීපයකට පසු නැවත තම සොහොයුරිය උන්වහන්සේට පෙනුනි. මෙවර ඈ අළු පැහැති වස්ත්‍රයකින් සැරසී දේවස්ථානයට ඇතුළුවීමට නොහැකිව සිටියා ය.

ශු. මලකියස් මුනිතුමා ඈ වෙනුවෙන් තවත් දිව්‍ය පූජාවන් සිදු කළේය. තෙවන වරටත් ඈ නැවතත් පෙනුනේ සුදු වස්ත්‍රයකින් සැරසී දේවස්ථානය තුළය. නමුත් අල්තාරය සමීපයට ඒමට බැරිය. උන්වහන්සේ තව තවත් දිව්‍ය පූජා ඔප්පු කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඈ පිරිවරාගෙන සිටි පිරිස සමඟ ලස්සන ගීතිකා ගයමින් ස්වර්ගය දෙසට යනු උන්වහන්සේට පෙනුණි. ශුද්ධවූ බර්නබස් තුමා කියන ප්‍රකාර නම් මේ සිද්ධියෙන් ශුද්ධිකාගිනිස්ථාන ආත්මයන්ට දිව්‍ය පූජාව කෙතරම් සහනයක් දැයි පෙන්වා දෙයි. එබැවින් ඉහත සිද්ධීන්වලින් ශුද්ධ ආත්මයෝ දෙවියන් වහන්සේට ඉතා ප්‍රසන්න වන්නේ අපේ පින් කුසල් බලයෙන් ඉක්මනින් ස්වර්ගීය දැකීමෙනි. මේ ආත්මයන්ට සහනය ගෙන දීම අපේ යුතුකමයි. මෙලෝ ජීවිතයේදී ඔවුන් අපට ආදරය කළා සේම හෝ අකටයුතුකම් කළත් අප හා සම්බන්ධව සිටි බැවින් ශුද්ධිකාගිනිස්ථානයේ දී සියලු දුර්වලකම් මැකීගොස් ශුද්ධ ආත්මයක් වශයෙන් ස්වර්ගය වෙතට යෑමෙන් එම ආත්මයන් අප වෙත සැළකිලිමත් වෙනවා පමණක් නොව අපගේ උවමනාවන් ද ඉෂ්ඨ කර දෙනු ඇත.

මරණය අප කාටත් පොදු දෙයකි. දැහැමිව ජීවත්වන අය මරණයට කොයි මොහොතේ දීත් සූදානම් ය. මරණයට භය එසේ ජීවත් නොවන අයයි. කෙසේ වෙතත් අප කරන කියන සෑම දෙයකටම මරණ මොහොතේ දී අපට වගකීමට සිදුවේ. ඒ අවස්ථාවේදී අපේම හෘද සාක්ෂිය අපට කතා කරන්නට පටන් ගනී. අප මැරුණ ද යම් යහපත් දෙයක් මෙලොවෙහි ඉතිරි කළහොත් එය නොමැරී පවතිනු ඇත.

"ස්වාමිනී නිත්‍ය සැතපීම ඔබගේ යහපත් ආත්මයන්ට දුන මැනව. නිත්‍යලෝකය ඔවුන් පිට බැබලුව මැනව.

# දිවයිනටම සාම විනිසුරු පදවි ලබයි



දංකොටුව ගෝනවිල මීසමේ මැදිකැලේ ජේසු බිළිඳුන්ගේ දෙව්මැඳුරේ දහම් උපදේශිකාවක ලෙස වසර 13 ක් පුරා සේවයේ නියැලෙන දීප්ති හෙලන් බස්නායක මහත්මිය පසුගියදා මුළු දිවයිනටම බලපාන පරිදි සාම විනිසුරු පදවිය ලැබුවාය.

ඇයට එම ගෞරව පදවිය ලැබී ඇත්තේ වසර 16 ක් පුරා රූපලාවන්‍ය ශිල්පිනියක වශයෙන් කටයුතු කරමින් රූපලාවන්‍ය විශාරද, දිරිය කාන්තා, දිරිය ප්‍රසාදිනි යන සම්මාන හිමිකර ගැනීම වෙනුවෙනි. ශ්‍රී ලංකා ගෘහනියන්ගේ සංගමයේ දංකොටුව ශාඛාවේ ලේකම් වශයෙන් කාන්තාවන් වෙනුවෙන් මහගු සේවයක් ඉටු කරන දීප්ති මහත්මිය දුම්මලකොටුව දෙව්මැඳුරේ සෙඩෙක් කාන්තා හවුලේද සාමාජිකාවක් වෙයි.

**(ඩබ්ලිව්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු)**

# මංගල සීනු හැඬවේ



බණ්ඩිරිප්පුව ශු. ජපමාල දේවමාතා සිද්ධස්ථානයේ ගායනා කණ්ඩායමේ ඕගන් වාදනය කරන සුරංග එදිරිසිංහ තරුණ මහතා පසුගියදා යුග දිවියට පිවිසිණි.

ඔහුගේ අතගත්තේ දුම්මලකොටුව මීසමේ නදීෂා අප්පුහාමි මෙනෙවියයි. සුරංග දෙව්මැඳුරේ මීසම් සභාවේ ලේකම් වන අතර දහම් ගුරුවරයකු ලෙස සේවයේ යෙදේ. සුරංග හා නදීෂාට ප්‍රදීප සු'පැතුම්. **(කුමර)**

# ජාතික කතෝලික ලේඛක හවුලේ නව නියමුවෝ

පසුගියදා පැවති ජාතික කතෝලික ලේඛක හවුලේ මහ සභා රැස්වීමේදී තේරී පත්වූ නව නිලධාරි මඬුල්ල මෙසේය.

සභාපති - ලෙනාඩ් කුරේ, උප සභාපතිවරු - ලෙනාඩ් හපුආරච්චි, මංගල ජයවර්ධන, ලේකම් - ජයසිරි ප්‍රනාන්දු, සමලේකම්වරු - ජයන්ත පලිහවඩන, හිල්ඩා බාලසූරිය, භාණ්ඩාගාරික - මැක්ෂිමස් රෝයි පෙරේරා, උප භාණ්ඩාගාරික - ආර්. ජෝශප් ප්‍රිය, ප්‍රධාන සංවිධායක - ඇන්තනි හෙට්ටිආරච්චි, උප සංවිධායක - සී. ආර්. ඩික්සන් ඇන්ටනි, ප්‍රචාරක නිලධාරි - පැට්රික් මාකස්, ගිනුම් පරික්ෂක - බී. කේ. ටී. රෙජිනෝල්ඩ් යන මහත්ම මහත්මීහුය.

රදගුරු පදවි නියෝජිතවරු - කොළඹ - රන්ජන් පල්ලෙවෙල, මහනුවර - ජූඩ් ජේ. ප්‍රනාන්දු, රත්නපුරය - තියබෝල්ඩ් සමරතුංග, ගාල්ල - මංගල ජයවර්ධන, කුරුණෑගල බී. කේ. ටී. රෙජිනෝල්ඩ්, අනුරාධපුරය - මැටිල්ඩා අදිකාරම්, හලාවත - හිල්ඩා බාලසූරිය වේ.

පර්ෂද නිලධාරි මණ්ඩලයක් ද පත් කර ගැනිණි.

**(සී. ආර්. ඩික්සන් ඇන්ටනි)**

# කුරුණෑගල පදවි තරුණ රැළිය "සත් පහන" ශාලාවේදී

කුරුණෑගල පදවි එඬේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද, පදවි තරුණ කටයුතු උපාධ්‍ය පියතුමාගේ මූලිකත්වයෙන් හා පදවි තරුණ සංගමයේ මෙහෙයවීමෙන් නොවැ. 09 දින කුලියාපිටිය "සත් පහන" ශාලාවේදී උදේ 9.00 සිට ප.ව. 1.00 දක්වා පදවි රැළිය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. **(වර්නන් ග්‍රේෂන් කොක්)**

# බොරැල්ල ඇලෝසියානු සිංහල සාහිත්‍ය සංගමයට වසර හැටපහයි



බොරැල්ල සා. ඇලෝසියස් දෙව්සත්හලේ 65 වන සිංහල සාහිත්‍ය දිනය පසුගියදා අති උත්කර්ෂවත්ව පැවැත්විණි.

1948 දී ගරු නිකලස් ජෝශප් පියතුමන් හා සෙවරිනස් පියතුමන් විසින් ආරම්භ කළ ඇලෝසියානු සිංහල සාහිත්‍ය සංගමයේ 65 වන ජන්ම දිනය සඳහා ප්‍රධාන තේමාව වූයේ "මියුරු සංගීතයේ සප්ත ස්වරයෙන් පසසමු දෙව් ගුණ මහිමේ" යන්නයි. මෙහි මුලසුන ආචාර්ය පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේව ශූරින් හෙබවූ අතර දෙව්සත්හලේ අදියුරු පියතුමාගේ මඟ පෙන්වීමෙන් හා සිංහල සාහිත්‍ය සංගමයේ අනුශාසක පියතුමාගේ මෙහෙයවීමෙන් සියලු කටයුතු සාර්ථකව සිදුවුණි. **(දිනිත් මධුසංක - සභාපති, සිංහල සාහිත්‍ය සංගමය)**

# පැවිදි දිවියේ රජත සැමරුම



ශ්‍රී ලංකා ජපමාල තාපසික නිකායික ගරු මේරි හෙලේනා පැවිදි සොයුරිය, තම පැවිදි දිවියේ වසර 25 ක් සපිරීම පසුගියදා සිදුකෙරිණි.

කැලණිය, පැලියගොඩ සා. මරියා මීසමෙන් වසර 1985 දී රාගම, තේවත්ත ජපමාල කන්‍යාරාමයට ඇතුළු වූ එතුමිය 1988 ඔක්තෝබර් 07 දින පැවිදි දිවියේ ප්‍රථම වේද භාර ගිවිස වසර ගණනාවක් තේවත්ත සහ තලවිල කන්‍යාරාමයන්හි ධ්‍යානපර තාපසිකාවක් ලෙස සේවය පුද දුන්නාය. දැනට ශ්‍රී ලංකා ජපමාල තාපසික නිකායේ කොළඹ ප්‍රාන්තය භාර ශ්‍රේෂ්ඨ සොහොයුරිය ලෙස වගකීම දරමින් මීගමුව කොච්චිකඩේ ජපමාල ආරාමයේ සේවයේ නියුතු ගරු හෙලේනා සොයුරියට හෘදයාංගම සුබාසිංසන පතමු. **(මොනිකා ප්‍රනාන්දුපුල්ලේ සහ ජෙසිකා මෙලනි ඇන්තනි)**

# පූර්ණෝදය පුණ්‍යායතනයට වසර 25 ක් සපිරේ



නොබෝදා පැවති ජා-ඇල පූර්ණෝදය පුණ්‍ය ආයතනයේ රිදී ජුබිලි උත්සවයට සහභාගි වූ කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙත එම ආයතනයේ නිර්මාතෘ මාටින් කොස්තා මහතා විසින් සමරු කලාපය පිළිගන්වන ලදි. එම අවස්ථාව සේයාරුවෙන් දැක්වේ. **(එස්. ජේ. කුරේරා)**

# බෝපිටිය ලොයොලාහි දෙවන පියවරට මුල්ගල තබයි



**බෝපිටිය, ලොයොලා ශාඛා පාසල් නව ගොඩනැගිල්ල සඳහා මුල් ගල තැබීම පසුගිය දා සුවහසක් දරු දැරියන්ගේ යාච්ඤා මධ්‍යයෙහි සිදුවිය.**

ප්‍රැන්සිස්කාන නිකායේ ප්‍රාදේශියාධිපති අතිගරු මාක් ප්‍රනාන්දු පියතුමන්ගේ හා විදුහල්පති ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමන්ගේ දැතින් ප්‍රථම මුල් ගල තැබීම ප්‍රදීප කැමරා කාචයේ සටහන් වූ අයුරු. **(ආශා චාමරී රොවෙල්)**

# නොමිලේ ජනමාධ්‍ය වැඩමුළුව සඳහා අයැදුම්පත් කැඳවේ

150 වන සංවත්සරය සමරන ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ හා මරදාන සමාජීය හා සාමයික කේන්ද්‍රයේ සම අනුග්‍රහයෙන් මීඩියා රයිට්ස් සෙන්ටර්, ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය සමිතිය හා කතෝලික මාධ්‍ය ජාලයේ සහයෝගයෙන් පවත්වනු ලබන ජනමාධ්‍ය වැඩමුළුව සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ. මාධ්‍ය හැදෑරීමටත් මාධ්‍ය ආයතනවලට සම්බන්ධව වැඩ කිරීමටත් ආශාවක් හා උනන්දුවක් ඇති උසස් පෙළ හැදෑරූ තරුණ තරුණියන් / දහම් ගුරුවර ගුරුවරියන්/ පාසල් ගුරුවර ගුරුවරියන් / ළමා සමාජ සජීවකයින් හා තරුණ සමිති සාමාජිකයින් හට මේ සඳහා අයැදුම්පත් එවිය හැක. වැඩමුළුවෙන් මූලික දැනුම ලබා දීමට නියමිත අතර වැඩමුළුව අවසානයේ දී සහතික පත්‍රයක්ද ප්‍රදානය කෙරේ


**පුවත්පත් කලාව හා මුද්‍රිත මාධ්‍යය / ගුවන්විදුලි මාධ්‍ය භාවිතය හා නිවේදන කලාව / රූපවාහිනී මාධ්‍ය භාවිතය සහ ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය කලාව/ අන්තර්ජාල මාධ්‍ය භාවිතය හා පුවත් වෙබ් සංස්කරණය / නාට්‍ය හා රංග කලාව / සිනමා මාධ්‍ය හා කෙටි චිත්‍රපටකරණය**

ඔබේ නම / ලිපිනය/ මීසම/ දිසාව/ දුරකථන අංකය/ විද්‍යුත් ලිපිනය/ වයස / අධ්‍යාපන සුදුසුකම් සඳහන් කර වැඩි විස්තර සඳහා ලිපිනය ලියූ මුද්දර කවරයක් සමග නොවැම්බර් 30 වැනි දිනට පෙර පහත ලිපිනයට ඔබේ අයැදුම්පත යොමු කරන්න.

වැඩමුළුව පැවැත්වීම:-
සමාජීය හා සාමයික කේන්ද්‍රයේදී සිදුවේ..

**වැඩමුළු සම්බන්ධීකාරක,**
**ප්‍රකාශන හා පුහුණු අංශය**
**සමාජීය හා සාමයික කේන්ද්‍රය**
**නො. 281, ඩීන්ස් පාර, කොළඹ 10**
**විමසීම්: සනත් ප්‍රනාන්දු 0774 102933**

# මරිය හමුදා තරුවක් මිලින වේ



**දෙහියාගාත මීසමේ දෙටු පිරිමි ප්‍රසීඩියමේ නව සභාපති වරයා වශයෙන් සේවය කළ කුවින්ටින් ප්‍රනාන්දු මහතා දෙව් මව් තුරුලේ සැතපුණේය.**

ශ්‍රී ලංකා මරිය හමුදා සෙනාටස් සභාවේ සභාපති හා මරිය හමුදා නිලතල දරමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රිස්තු සංචාර කරමින් මරිය හමුදා දියුණුවට නොයෙක් පියවර ගත් සහෝදරයෙකි. දෙහියාගාත මීසමේ සේවා රැසක් කළ කුවින්ටින් ප්‍රනාන්දු සහෘදයාණන්ගේ අවසන් කටයුතු දෙහියාගාත කුඩා මඩු දෙව්මැඳුරේ දී සිදුවිය. **(සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**